
# මෙන්න ඒ මනුෂ්‍යයා

## මේ ඔබේ වාරයයි..

විශේෂ
පාස්කු
ප්‍රකාශනය

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මෙහෙවරකි

වර්ෂ 2023 ක් වූ අප්‍රේල් මස 07 වෙනි සිකුරාදා





# එතෙර කරමින් එතෙර වෙමු.

**අති උතුම් හැරල්ඩ් ඇන්තනී පෙරේරා**
**රදගුරු හිමිපාණෝ**
සභාපති, ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය.
කුරුණෑගල රදගුරු හිමිපාණෝ.

ක්‍රිස්තු භක්තිකයාගේ ප්‍රධානතම මෙන්ම කිතුණු ජන වන්දනාවේ උසස්ම මංගල්‍ය පාස්කු මංගල්‍යයයි. එයට හේතුව වී ඇත්තේ ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය, ශ්‍රී මරණය සහ මරණය පරාජය කර උත්ථානය මඟින් පාපයේ ඇලී ගැලී සිටි මනුෂ්‍ය සංහතිය ඒ තත්ත්වයෙන් එතෙර කිරීමයි. ක්‍රිස්තුස් වහන්සේ මරණය පරාජය කර උත්ථාන නොවූ සේක් නම්, අපට සභාවක් නොමැති වන අතර, උන්වහන්සේ ගැන ප්‍රකාශ කරන්නට අවස්ථාවක් නොලැබෙනු ඇත. උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන්නටත් උන්වහන්සේ ඉගැන්වූ ප්‍රේමයේ දහම පතල කරන්නටත් අපට අවස්ථාවක් නොලැබෙනු ඇත. එම නිසා අපගේ විශ්වාසයේ පදනම කිතු සමිඳාණන්ගේ විජයග්‍රාහී උත්ථානයයි. ඒ පිළිබඳව ශුද්ධ වූ පාවුලු තුමා මෙසේ පවසයි. "ක්‍රිස්තුස් වහන්සේ උත්ථාන කරනු නොලැබූ සේක් නම් අපගේ දේශනා කිරීම නිරර්ථකය. ඔබගේ ඇදහීමත් නිරර්ථකය." **(1 කොරෙන්ති 15:14)**

ස්වර්ගීය බලවතාණන් සමඟ එකට එකතු වී ආරම්භයේ පටන් දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට දැක්වූ අපරිමිත කරුණාව සහ සානුකම්පිත ප්‍රේමය පිළිබඳව ගුණ සිහිපත් කරමු.

ක්‍රිස්තුස් වහන්සේගේ තේජෝමාන උත්ථානයෙන් ඔදවැදි ගැලවීමේ ඉතිහාසයට යලි පණ පොවමින්, පාස්කු මංගල්‍ය සමයට අපි පියවර තබන්නෙමු. උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේ තුළ අපට පරිපූර්ණ ජීවිතයක් උදාවන්නා සේම ජරාපත් වී ඇති මෙම ලෝක සත්වයා ද නවතාවයකට පත්වන්නේය. එසේ නම්, අප උත්ථානයේ අත්දැකීම තුළ නැවුම් ආකල්ප, යහපත් සිතුවිලි පෙරදැරි කොට ගෙන අලුතින් දේශයකට පියමන් කළ යුතුව ඇත.

"නොබා සිටිනට ඇත්තේ කොතනද
දැනුම නිවහල් වුනේ කොතනද
අපම නිපැයුව භේදයෙන් රට
කැබලි වී යන්නේ කොතැනද
අන්න ඒ රන් නිදහසේ දිව්‍යමය දේශය කරා
මාගේ දේශය අවදි කළ මැන පියාණනි"

වත්මන් අප දේශය වේලා ගත් මරණයේ අඳුර බිඳ හැර, ජීවනයට එතෙර කර වීමේ පිරිසිදු පාරිශුද්ධ මිනිසුන් අපට අවශ්‍යමය. දේශපාලන බල තණ්හාව, ආර්ථික ආගාධය, සත්‍ය වසන් කිරීම යන ප්‍රශ්නාර්ථ හමුවේ පොදු ජන ජීවිත අඩ පණ වී ඇත. මනස්ථාපනයේ අවශ්‍යතාවය අප මුළු දේශයටම පසක් කරමින්, සැබෑ ජීවිත වෙනසකට ඇරයුමක් ඇත. මිනිස් දුබලකම් , අසීමිත ආශාවන්, තණ්හාව එක් ස්ථානයක ඇද බැඳ තබමින් , මනස්ථාපීය පාස්කු මංගල්‍යයක් උදා කර ගනිමු. අප සැම කෙනෙක්ම නව ජීවිතයක්, නව සිතුම් පැතුම් නව විශ්වාසයේ අත්දැකීමක් ඇති කර ගැනීමේ අවශ්‍යතාවයක් ඇත.

ජාතීන් ලෙස බෙදී වෙන් වී සිටීමට සලස් වන සියල්ලෙන් අප සියලු දෙනා එතෙර විය යුතුය. උතුරේ සිට දකුණ දක්වා, ජීවත් වන සියල්ලන් හදවතේ වෙනසක් ඇති කර ගැනීමට අවශ්‍යය මොහොතක වර්තමානයේ අපි සැරිසරන්නෙමු. වත්මන් අප දේශයේ තත්වය තුළ මිනිසුන් හුදෙකලා වී ඇත. ඇතමෙක් විශාල අරගලයක යෙදෙන අතර, ඒ අරගලය ජීවත්වීමේ අරගලය බව අපට වැටහී ඇත. පරිභෝජන වාදයට සහ ආත්මාර්ථකාමීත්වයට යොමු වී, ඒ තුළින් තමන් ගැන පමණක් සීතා කටයුතු කරන්නට කාලය, ශ්‍රමය මිඩන්ගු කර ඇත. අප ගත කළ චතාරික සමය තුල, අපගේ බෞතීස්ම කැඳවීම යලි යලිත් සිහිපත් කරන්නට හැකියාව තිබුණි. එනම් එඬෙරක කාර්යය, පූජක කාර්යය හා දිවැසිවර කාර්යය සඳහා අප කෙතරම් දුරට විශ්වාසවන්ත වී ඇද්ද මෙනෙහි කරන්නට කාලය උදා වී ඇත. අප එම වගකීම් අද වැනි සමාජයක ක්‍රියාවට නංවන්නේ නම් අප ස්වාමීන් වහන්සේ බලාපොරොත්තු වන උන්වහන්සේගේ ධර්මයේ සාක්ෂිකාරයෙක් වන්නට අපට හැකියාව ලැබේ.

තවද වර්ෂ 2019 පසු උදා වූ සෑම පාස්කු ඉරු දිනක්ම අපට සිහි ගන්නවන්නේ පාස්කු ඉරු දින සිදු වූ ම්ලේච්ඡ ප්‍රහාරයයි. තවමත් ඒ වෙනුවෙන් යුක්තිය සාධාරණත්වය ඒ වින්දිතයන්ට ඉටු වී නොමැති බව නැවත නැවත පැවසිය යුතුය. ශ්‍රී ලාංකේය කතෝලික සභාව ඒ ගැන තවමත් අවදියෙන් කටයුතු කරන අතර අපි ස්වාමීන් වහන්සේගේ සාක්ෂිකරුවෝ වෙන්නේ නම් ඉදිරියටත් විශ්වාසයෙන් ශක්තිමත්ව, යුක්තිය සහ සාධාරණත්වය ඒ අයට ලබාදීම සඳහා එක්ව කටයුතු කළ යුතුව ඇත. එවිට අප සැබවින්ම බෞතීස්ම වගකීම් ඉටු කරන, ක්‍රිස්තුස් වහන්සේගෙ "ම උත්ථානයේ සාක්ෂිකරුවන් වන්නට හැකියාව ලැබේ. උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේගේ අශිර්වාදය ඔබ සමඟ නිරන්තරයෙන් පවතීවා ! ඔබ සැමට පාස්කු මංගල්‍යයක් වේවා.



**අති උතුම් මැක්ස්වෙල් සිල්වා**
**සහයක රදගුරු හිමිපාණෝ**
සභාපති, ජාතික කතෝලික සන්නිවේදන කොමිසම.

පාස්කුව යනු කිතුණුවාගේ විශාලතම මංගල්‍යයි. ඊට හේතුව ක්‍රිස්තුස්වහන්සේගේ උත්ථානයයි. උන්වහනසේගේ උත්ථානය සිදු නොවුනි නම්. කිතුණු විශ්වාසයක් හෝ කිතුණු සභාවක් හෝ නැත.

චාතාරික කාලය අපට දී තිබෙන්නේ දින 40ක් පුරා මේ උතුම් මංගල්‍යයට සූදානම් වීමටයි. මේ කාලය තුළ ක්‍රිස්තුස්වහන්සේගේ දුක් විදීම, මරණය සහ උත්ථානය අපි මෙනෙහි කරමු. ඒ සඳහා සභාව අනුමත කළ ආගමික ව්‍යායාමයන් තිබේ. දිව්‍ය පූජාව, පාද නමස්කාරය, මර්දන ක්‍රියා, දුගිනට දන් දීම සහ එක්වරු ශීලය තුලින් අප ජීවිත මර්දනය කර ගනිමින් ක්‍රිස්තුස්වහන්සේගේ සහ සම්බන්ධවීම මේ ව්‍යායාම්වල බලාපොරොත්තුවයි. අද අප රට පසුවන පසුබිම තුළ කෑම වේලක් නැති, ඉඳුම් හිටුම් නැති බොහෝ දෙනෙක් සිටිනවා. ධනවතා උත්සාහ දරන්නේ කොමිස් ගැහිල්ල තුලින් හෝ උපරිමය රැස් කර ගැනීමටයි. ඒ නිසා දුගීන්ගේ ප්‍රතිශතය උපරිමය වී තිබේ. මෙවැනි අයට අත හිත දෙමින් ඔවුන්ගේ කුසගිනි නිවාලීමට චතාරිකය ඔබ සැමදෙනාටම ආරාධනා කරයි.

මම කුස ගින්නේ සිටියෙමි. ඔබ මට කන්න දුන්නාහුය. මම පිපාසිතව සිටියෙමි. ඔබ මට බොන්න දුන්නාහුය. මම සිරගතව සිටියෙමි. ඔබ මා බලන්න පැමිණියාහුයැයි ස්වාමීන්වහන්සේ පවසන්නේ එවැනි ජනතාවටයි.

**ජේසු පිහිටයි.**



**සූජිතාර් සිවනායගම් දේව ගැතිතුමා**
මහලේකම්
ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය

හිතවත් මිත්‍රවරුනි,

චතාරිකය යනු අපට ලැබෙන කරුණාවේ සමයකි. මෙම කාලවලදී මිනිසුන් තම ජීවිතය කෙලින්ම දෙවියන් වහන්සේ වෙතට යොමු කර, ස්වයං පරීක්ෂණයකට යටත් කොට, දෙවියන්ගේ කැමැත්තට අනුව ජීවිතය හැඩගස්වා ගත හැක්කේ කෙසේද යන්න මෙනෙහි කිරීමට අවකාශයක් ඇති කර දේ.

යෙසායා 58:10 මෙසේ පවසයි;

"සාගිනි ඇත්තාට අනුකම්පා කර අසරණයන් තෘප්තියට පමුණුවන්නාහු නම්, නුඹේ අඳුර එලිය වන්නේය. ඝන අන්ධකාරය මධ්‍යහ්නය මෙන් එළිය වන්නේය." දෙවියන් වහන්සේට අවශ්‍ය පරිදි අපගේ ජිවිත සංවිධානය කිරීම මෙහි අත්‍යවශ්‍ය පුහුණුව යෙසායා අවධාරණය කරයි. එය අඳුරු තත්ත්වයෙන් ආලෝකයට පැමිණීමේ පුහුණුව වේ.

අපව හා අපගේ ජීවිත අඳුරේ යටත් කොට තබා ඇති ගුණාංග මොනවාද කියා අප ප්‍රශ්න කලොත්, අපට ලැබිය හැකි නිශ්චිත ප්‍රතිචාරය වන්නේ ආත්මාර්ථකාමී බවයි. එබැවින් මෙම අඳුරු යටත් විජිත තත්ත්වයෙන්, ආලෝකයේ නිදහසට ඒමට යෙසායා පවසන තුන් ආකාරයක පුහුණුවක් නිමා කිරීමට අපට ඇරයුමක් ලැබේ. එය;

1. ආත්මාර්ථකමින් පරාර්ථකාමී වීමේ පුහුණුව
   (a shift from Self-canted to Beneficent or / a shift from Selfishness to unselfishness)
2. පෞද්ගලිකත්වයෙන් බාහිරව සමාජය දැකීමේ පුහුණුව
   (A shift from individuality to community)
3. කථා කිරීමෙන් සවන්දීමේ පුහුණුව
   (A shift from Talking to Listening)

වත්මන් ලාංකේය සමාජ, ආර්ථික, ආගමික, දේශපාලන පසුබිම අපගේ කැමැත්තෙන් හෝ අකමැත්තෙන් අප ගැන පමණක් සිතීමට තුඩු දී ඇත. තමන් ගැන පමණක් සිතීමට එදා පරීක්ෂකයා ජේසුස් වහන්සේව යොමු කල විට ජේසුස් අන් අයගේ යහපත හා සමාජය සහ මිනිසුන්ගේ දුකට සවන් දී, තමන්ගේ ජීවිතය පුද කළ බව සිහි කිරීම මෙම චතාරිකයේ උච්චතම අවස්ථාව වේ.

මිත්‍රවරුනි, චතාරිකය අපව පාලනය කරන සමයක් නොව, ඒ වෙනුවට පීඩිතයන් සිහි කරන කාලයයි. චතාරිකය උපවාස කිරීමේ කාලයක් නොව, ඒ වෙනුවට කුසගින්නෙන් පසුවන අය පෝෂණය කිරීමේ කාලයයි. චතාරිකය යනු මිනිසුන්ගෙන් ඈත් වී හුදෙකලා වීමේ කාලයක් නොව, ඒ වෙනුවට සංහිඳියාවක් ඇතිකර ගැනීමේ කාලයයි.



**ක්‍රිස්තුස් වහන්සේගේ පෙන්වා දුන් විමුක්තිදායක ප්‍රේමය තුළ ජීවත්වන්නට අදිටන් කර ගනිමු.**

## රනිල් වික්‍රමසිංහ - ජනාධිපති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

සමාජ සාධාරණය, මනුෂ්‍යත්වය, ප්‍රේමය වෙනුවෙන් තම ජීවිතය කැප කළ ක්‍රිස්තුස් වහන්සේ මරණයට පත් කරනු ලැබුවද, මරණය පරාජය කරමින්, උත්ථානය වෙමින් ලොවට ගෙන ආ විමුක්තිදායක පණිවුඩය නැවත සිහිපත් කරන පාස්කුව ලොව පුරා කිතුණු ජනතාව මහත් බැතියෙන් සමරති. පුරා දින 40 ක් ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ දුක්විඳීම පසුතැවිලි වන සිතකින්, යාච්ඤාවෙන්, ආගමික වත් පිලිවෙත් මගින් හා පුණ්‍ය ක්‍රියා තුලින් සමරන කිතුණු ජනතාව මහ සිකුරාදා දින උන්වහන්සේ කුරුසියේ ඇණ ගසා මරණයට පත් කිරීමට ද, පාස්කු ඉරු දින මරණය පරාජය කොට මරණින් උත්ථානය වීම ද ස්මරණය කරමි. දුගීන්ට, රෝගීන්ට, පවුකාරයන්ට, අසරණවූවන්ට, නොදරුවන්ට, මේ සැමට එක සේ ප්‍රේම කලා වූ ක්‍රිස්තුන් වහන්සේ සමස්ථ ජීවිතයෙන්ම පෙන්නුම් කළේ මානව ප්‍රේමය, සමානාත්මතාවය, සංහිඳියාව තරම් උත්තරීතර අන් යමක් මෙලොවට පැවතිය නොහැකි බවය.

ජාති, ආගම්, කුල, පක්ෂ, පංති ලෙසින් බෙදී ඇන කොටා ගැනීම වෙනුවට ක්‍රිස්තුස් වහන්සේ පෙන්වා දුන් විමුක්තිදායක ප්‍රේමය තළ ජීවත්වන්නට අදිටන් කර ගනිමු. සහෝදර කිතුණු ජනතාවට අර්ථපූර්ණ පාස්කු මංගල්‍යයක් වේවායි හෘදයාංගම සුභාශිංසන පිරිනමමි.



**ක්‍රිස්තුස් වහන්සේගේ දයා කාරුණික ප්‍රේමයෙන් හා සමාව දීමේ ගුණයෙන් පාස්කුව සරසමු.**

## දිනේෂ් ගුණවර්ධන - අග්‍රාමාත්‍ය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

කුරුසිය මත ජීවිතය පූජාකළ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය, මරණය හා උත්ථානය සිහිපත් කරන පාස්කු මංගල්‍යය ශ්‍රී ලාංකික හා ලෝකවාසී කිතුනු ජනතාව බැතියෙන් සිහිපත් කරන අද දින අසංවේදී සන්නිවේදන හා වත්මන් සංකීර්ණ සමාජ අනවබෝධය හමුවේ සිඳී බිඳීයන මානව සබඳතා හා සමාජ ධර්මතා යළිදු නිවැරදි මගට ප්‍රවිෂ්ඨ කිරීමේ ප්‍රයත්නය උදෙසා කතිකාවතක් බවට පත්කර ගනිමු.

මානව වර්ගයා පාපයෙන් ගලවා ගැනීමට, සමාජ සාධාරණය, දයාව, ප්‍රේමය, මනුෂ්‍යත්වය වෙනුවෙන් තම ජීවිතයම කැපකළ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කෲර මරණයකට පත් කළද, මරණය ජයගෙන උත්ථාන වෙමින් විමුක්තියේ නව මග පෙන්වා දුන් බව ක්‍රිස්තු භක්තික විශ්වාසයයි.

වත්මන් අර්බුදකාරී තත්ත්වයන් තුළ මානව ගුණාංග නොනැසී පවත්වා ගැනීමටත්, නිවැරදි තීන්දු තීරණ ගැනීමටත් ඇවැසි මානසිකත්වය අප තුළ ජනිත කර ගැනීම සඳහා මෙවන් සියලු ආගමික ඉගැන්වීම් අපට පිටිවහලක් වෙයි.

කුරුසියේ එල්ලී සිටියදී පවා වදකයන්ට සමාව දී දයාව හා ප්‍රේමය පතුරුවා ලූ ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයෙන් අපගේ හදවත් නවමු පරිවර්තනයකට ගෙනයමින් දයා කාරුණික ප්‍රේමයෙන් හා සමාව දීමේ ගුණයෙන් මෙවර පාස්කුව සරසා ගනිමු.



**"පාස්කු මංගල්‍ය නම් අසමසම ප්‍රේමයක සටහනකි"**

## විදුර වික්‍රමනායක - අමාත්‍ය

බුද්ධසාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

ක්‍රිස්තුස් වන්සේ මනුෂ්‍ය වර්ගයා වෙත විමුක්තියේ මාවත පෙන්වා දීමට ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කළ ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම ශාස්තෘවරයෙකි. දුකෙන් ඉපිද, දුක් අත්විඳින මිනිසා පාපයෙන් ගලවා ගැනීම උදෙසා ජේසුස් වහන්සේ විසින් සිදු කළ අසමසම ජීවිත පරිත්‍යාගය පාස්කුව තුළ සදාකල් ජීවමාන වේ. අතිමහත් බැතියෙන් පාස්කුව සමරණු ලබන ලෝ වැසි කිතුණු ජනතාව වෙතින් පැවසෙනුයේ, මනුෂ්‍යත්වය අතික්‍රමණය කර පාපයේ ආධිපත්‍යය පරාජය කොට මනුසත පිය දෙවිඳුන් සමඟ නැවත දේව දරුකමේ උරුමයට කැඳවා ගැනීමයි.

සමස්ත මනුෂ්‍ය සංහතිය වෙනුවෙන් තම ජීවිතය පූජා කිරීමෙන් මුළුමනින් මනුෂ්‍ය වර්ගයාටම පහදා දුන් තවත් ප්‍රබල සත්‍යයක් වන්නේ යමකු විනාශ කළ හැකි වුවද පරාජය කළ නොහැකි බවත් දිව්‍යමය ප්‍රේමය අපරාජිත බවත්, අසමසම බවත්ය.

එකිනෙකා කෙරෙහි ඇති ගෞරවය සහ විශ්වාසය තහවුරු කර ගනිමින්ද අන්‍යයන් වෙනුවෙන් කරන්නා වූ අත්මාර්ථයෙන් තොර කැපකිරීම් කිරීමට අදිටන් කර ගනිමින්ද ක්‍රිස්තුස් වහන්සේ දුන් ජීවිතාදර්ශය අනුව යමින් සාමය, ප්‍රේමය, සංහිඳියාව තුළ මනුෂ්‍යත්වයෙන් පිරිපුන් සමාජයක් ගොඩනැගීම අප සැමගේ වගකීම බව මේ පාස්කු සමය තුළ විශේෂයෙන් සිහිපත් කරමින් ලක් වැසි කිතුණු ජනතාවට සුභ පාස්කු මංගල්‍යයක් ඉත සිතින් පතමු.



## සෝමරත්න විදානපතිරණ

ලේකම්
බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

ලොව පුරා පැතිර සිටින කිතුණු ජනතාව අති උත්කර්ෂවත් ලෙස සමරනු ලබන උතුම්ම මංගලෝත්සවය ලෙස පාස්කු මංගල්‍යය හැඳින්විය හැක.

කිතුණු විශ්වාසයට අනුව මිනිස් කයක් ගෙන මෙලොවට වැඩි දෙවි සමිදාණන් සමස්ථ මිනිස් පරපුර පාපයේ හස්තයෙන් , ආධිපත්‍යයෙන් මුදවා ගැනිමට තම ජීවිතයෙන් මිලයක් ගෙවා, නැති වූ දෙවිපිය සබැඳියාව නැවත පිහිටු වීම පාස්කුවයි. මහ සිකුරාදා දින ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කුරුස ගසක එල්ලා මරණ ලද මුත් එම මරණය පරාජය කොට දින තුනකින් නැවත නැගිටීම මුළු මහත් මිනිස් සමාජයට විමුක්තිය ගෙන ආ බව කිතු බැතිය දැඩිව විශ්වාස කරයි.

එම විශ්වාසය ගෞරවයෙන් යුක්තව සිහිපත් කරමින් සමස්ථ කිතුණු ජනතාවට එම අසාහය විමුක්තිය අත්විඳින්නට අවශ්‍ය දේව ආශිර්වාදය මුලු සිතින් ප්‍රාර්ථනා කරන අතර ඔබ සැමට සුභ පාස්කු මංගල්‍යයක් වේවා!



## එම්. චතුරි පින්තු

අධ්‍යක්ෂ
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

අළු බදාදා දිනයෙන් ඇරඹෙන කිතු සමිඳුන්ගේ දුක්ප්‍රාප්තිය සිහි කෙරෙන චතාරික සමය ලෝක වාසී කිතුණු ජනතාව කිතු තුමන්ගේ ජීවිත දර්ශනය හා ඒකාබද්ධ කෙරෙන වරප්‍රසාද ජනක කාලයයි. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තම ප්‍රසිද්ධ ජීවිතය ඇරඹීමට පෙර දින සතලිහක කාලයක් මුළුල්ලේ පාළුකරයේ අත්දැකීම තුල දෙවියන් වහන්සේ හා ඒකාත්මික වෙමින් සිය එඬේරික කාර්යය සඳහා සූදානම් වූවාක් මෙන් කිතුණු ජනතාව ද මෙම වරප්‍රසාදජනක කාලය තුල තම ආත්මීක හා ශාරීරික පුනඃක්‍රියා සිදු කරමින් ක්‍රිස්තුස් වහන්සේ ගේ ජීවිතාදර්ශය සිය ජීවිත තුලට කාවද්දා ගනිමින් ඔවුන්ගේ ජීවිත වඩ වඩාත් යහපත් ව ගත කිරීමට සූදානම් වෙති.

ආර්ථික හා සමාජීය වශයෙන් ඉතා දුෂ්කර වූ කාලපරිච්ඡේදයක් ගත කරනු ලබන අවස්ථාවක සමාජය තුල අසරණභාවයට පත් ව සිටින අපේ ම සොයුරු සොයුරියන් හට සමිඳුන් පැවසූ වදන් අනුව යමින් දකුණත කරන දේ වමත නොදකින අයුරින් භෞතිකව හා සමාජීය වශයෙන් සරණක් වන්නට මේ වරප්‍රසාදජනක කාලය කිතුණුවන් හට ආරාධනා කරයි. අනුන්ගේ පව් උදෙසා තම ජීවිතය පූජා කළ කිතු සමිඳුන් අනුව යන කිතුණුවන් ලෙස තමන්ගේ සුබසෙත, තමන්ගේ ලාභය, තමන්ගේ වාසිය ගැනම නොසිතා අන් අයගේ සුබසෙත, ලාභය, වාසිය වෙනුවෙන් කැපවන්නට වැයවන්නට මේ චතාරික සමය තුල අදිටන් කර ගනිමු.

ඔබ සැමට සුභ පාස්කු මංගල්‍යයක් වේවා!



**ගරු. ජූඩ් ක්‍රිශාන්ත ප්‍රනාන්දු පියතුමා**
ජාතික කතෝලික ජනසන්නිවේදන අධ්‍යක්ෂ

පාස්කුව යනු එතරවීමයි. ඊශ්‍රායෙල් ජනතාව අවුරුදු 400ක් ඊජිප්තුවේ වහල් භාවය තුළ ජීවත් වුනා. ඉන් අනතුරුව මෝසෙස් තුමන්ගේ මැදිහත්වීමෙන් ඔවුන් ඊජිප්තුවේ වහල් භාවයෙන් මිදී පොරොන්දු දේශය වෙත පා නැගුවේ නිදහස් ජනතාවක් ලෙස ජීවත් වීමටයි. වහල් භාවයේ සිට පොරොන්දු දේශය වෙත යන ගමනේ වහල් භාවයේ සිට නිවහල් භාවය වෙත පාතැබූ කඩඉම වූයේ ඊශ්‍රායෙල් ජනතාව රතු මුහුදෙන් එතෙර වීමයි. ඊශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශයට පැමිණීමෙන් පසුව දෙවියන් වහන්සේගේ නියමයෙන් මේ එතරවීම හෙවත් වහල් භාවයෙන් නිදහස් වීම පාස්කු මංගල්‍යය ලෙස සෑම වසරකම සමරන්නට වුනා. මේ පාස්කු මංගල්‍යය ජුදා ජාතිකයකු ලෙස ක්‍රිස්තුස් වහන්සේද සමරණු ලැබුවා. ක්‍රිස්තුන් වහන්සේ මිය යන්නට එක් දිනකට පෙර අන්තිම රාත්‍රී භෝජනයේදී උන්වහන්සේ මෙම පාස්කු මංගල්‍යයට නව අරුතක් දෙමින් අපි අපගේ පාපයේ වහල් භාවයෙන් දේව දරුකම නමැති නිවහල් භාවයට පැමිනිය යුතු බව පෙන්වා දුන්නා. එය අපගේ අධ්‍යාත්මික පාස්කුව බව උන්වහන්සේ අපට මතක්කර දුන්නා. අද අපි සමරන පාස්කුව මෙයයි.

ඊශ්‍රායෙල් ජනතාව ඊජිප්තුවේ වහල් භාවයෙන් මිදී පොරොන්දු දේශය වෙත ආ ගමනේදී මෝසස් තුමන් විසින් අවුරුදු 40 ක් තිස්සේ ඔවුන්ව පාලුකරය ඔස්සේ දීර්ඝ කාලයක් ගෙන එනු ලැබුවා. නමුත් භූගෝලීය වශයෙන් බලන කල එය කෙටි දුරක් වුවත් විශාල වටයක් යමින් එම දුර අනවශ්‍ය ආකාරයේ දීර්ඝ කරගත් බවක් අපට පෙනෙන්නට තිබෙනවා. එසේම එම දුර වුවත් අවුරුද්දකින් පමණ ගමන්කළ යුතුව තිබුණු නමුත් ඒ සඳහා මෝසස් තුමන් ඔවුන්ව පාලුකරයේ අවුරුදු 40 ක් ඒ වෙනුවෙන් මිඩංගු කළ බවත් පෙනෙන්නට තිබෙනවා. එය අප හැමගේම වික්ෂිප්තයට කරුණක් වනවා නොඅනුමානයි. ඇයි එසේනම් එය එසේ සිදුවුනේ? එයට ප්‍රායෝගික හේතුවක් තිබෙනවා. අවුරුදු 400ක් ඊජිතුවේ වහල් භාවයේ සිටි ජනතාවව අවුරුද්දක් වැනි කෙටි කාලයකින් නිදහස් දේශයකට ගෙන ඒමට හැකායාව තිබෙනවා. නමුත් අවුරුදු 400ක් වහලුන් ලෙස දිවි ගෙවූ ජනතාවක් එක අවුරුද්දකින් නිදහස් මානසිකත්වයක් කරා ගෙන එක කළ නොහැකි දෙයකි. නිදහසේ සිතන්නට, තීරණ ගන්නට, ක්‍රියා කරන්නට, නිදහසේ ජීවත් වන්නට ඔවුන් පුරුදු වී නැහැ. ඒ සඳහා දිගු කාලයක් ඔවුන්ව පුරුදු පුහුනු කළ යුතුව තිබෙනවා. මේ පන්නරය දෙන්නට තමයි මෝසස් තුමන් අවුරුදු 40 ක් වැනි දීර්ඝ කාලයක් කාන්තාරයේ ඔවුන්ව මිඩංගු කළේ. අවුරුදු 40ක් යනු එක් පරම්පරාවක් පහව ගොස් තවත් පරම්පරාවක් බිහිවන කාල පරිච්ඡේදයයි.

ඒ නිසාම අවුරුදු 40ක් කාන්තාරයේ නොයෙක් අත්දැකීම්වලට හසුවී සැබෑ පරිවර්තනයක් සිදුවූ ඊශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශයට එන විට සැබෑම නිදහස් ජනතාවක් බවට පත්වී තිබුනා. එනම් භෞතිකව පමණක් නොව චින්තනයෙන්ද කිසිවෙකුට ගැති නොවූ නිවහල් ජනතාවක් බවට පත්ව තිබුණා.

ශ්‍රී ලාංකික ජනතාවක් ලෙස අපද අද එතෙර වෙමින් සිටින ජාතියකි. අපද අවුරුදු 400ක් වහල් භාවයේ සිටි ජාතියකි. ක්‍රි.ව.1505 පෘතුග්‍රීසීන්ගේ යටත් වැසියන් ලෙස අවුරුදු 400කට වැඩි කාලයක් ජීවත් වී ඇත. 1948 දී අප නිදහස අත්කර ගත්තේය. 1948 සිට නිදහස් ජාතියක් ලෙස අප අවුරුදු 75ක් ගෙවා හමාරයි. නමුත් මා දකින යතාර්ථය නම් අප භෞතික නිදහස ලැබූවත් ඊශ්‍රායෙල් ජනතාව අවුරුදු 40 ක් ගෙව්වා සේ අපද තවමත් මානසිකව වහල්භාවය තුළ දිවි ගෙවන ජනතාවකි. ඒ නිසයි අපට තවමත් එතෙර වන්නට නොහැකි වුනේ ශ්‍රී ලාංකික ජනතාවක් ලෙස කුමක්ද අපේ වහල් භාවයන්?

1. අපි තවමත් පක්ෂ දේශපාලනයේ වහලුන්
2. අපි විදේශ රටවල්වල ණය මත යැපෙන වහලුන්.
3. රැකියාවලට සහ අනෙකුත් වරප්‍රසාද සඳහා දේශපාලනඥයින්ට කඩේ යන වහලුන්.
4. පිටරටවල රැකියා කරන බොහෝ අය ගෞරවාන්විත රැකියා නොකරන නිසා අපි පිටරැටියන්ගේ වහල් සේවයේ යෙදෙන අයවලුන්.
5. රටේ නීතිය රැකවරණය, සාධාරනත්වය හැම කෙනෙකුටම එක හා සමානව නොමැති හෙයින් අප රටේ බොහෝ අය නිදහස භුක්ති නොවිඳින වහලුන්.

කාන්තාරයේ අත්දැකීම තුළ නිදහස් චින්තනයක් උරුමකරගත් නිසාත් ඒ කාන්තාරයේ දිවි ගෙවීම තුළ එක්සත් ජාතියක් බවට පත්වූ නිසයි. ඔවුන්ගේ සැබෑ එතෙර වීම එයයි.

එසේ නම් අපේ සැබෑ නිදහස වන්නේ 1948 බ්‍රිතාන්‍යයින් අපට දුන් නිදහස නොව චින්තනය තුළින් සහ එක්සත් කම තුළින් අප උරුමකර ගන්නාවූ නිදහසයි. තවමත් අප එය අත් පත් කරගෙන නොමැති බව මේ විග්‍රහ කිරීම තුළින් ඔබට වැටහෙනවා ඇත. එසේනම් සැබෑ එතෙර වීමක් තුළින් නියම පාස්කුවක් වෙත අප රටක් ලෙස පා නැගිය යුතුව ඇත. එසේනම් ඒ ජයග්‍රාහී පාස්කුව අත්විඳින්නට දැඩි උත්සහයකින් හා කැපවීමකින් කටයුතු කරන්නට අපි වෙර දරමු.

# මෝසෙස්ගේ ජය ගීතය

**නික්මයාම 15:1-18 (ශු. බයිබලය)**

1 “සමිඳුන් හට මම ගී ගයමි,
එතුමානෝ තෙද මහිමයෙන් ජයගෙන
අසුන් හා අසරුවන්, මුද මැද හෙලූ සේක.
2 සමිඳාණෝ, මා සවිය හා ගීතය වෙති;
එතුමාණෝ
මා විමුක්තිය වෙති;
මාගේ දෙවිඳාණෝය.
මා දෙවි තුමන්, මම පසසමි.
මා පියාගේ දෙවිඳුන් මම වනමි.
3 සමිඳාණෝ, රණශූරය,
එතුමන්ගේ නම හිමි සඳ වේ.
4 එතුමාණෝ, පාරාවෝගේ රිය සෙන් හා බළ ඇණි
මුද මැද හෙලූ සේක.
උසස්ම සෙන්පතිහු ද, රතු මුදට බිලි වූ හ.
5 ගැඹුරු සමුදුර ඔවුන් වසා ගති;
ගලක් විලස මුදු පත්ලට, ඔවුහු කිඳා ගියහ.
6 සමිඳුනි,
ඔබ දකුණත බල මහිමයෙන් උදාර ය.
සමිඳුනි,
ඔබ දකුණත හතුරන් කැබලි කරලී ය.
7 ඔබේ තේජෝ මහිමය ඉමහත්ය.
ඔබ ඔබේ සතුරන්, සුණු විසුණු කරන සේක.
ඔබේ උදහස විගසින් දැල් වී
ඉපනැලි මෙන් ඔවුන් දවාලයි.
8 ඔබේ නැහැයේ හුස්මෙන්
ජලය ගොඩ ගැසෙයි.
දිය දහර වේල්ලක් මෙන් කෙලින් සිටියි.
මුහුදු ගැඹේ ජල කඳ මිදිණි.
9 සතුරා මෙසේ උදන් අනයි:
“මම ලුහු බැඳ යන්නෙමි,
ඔවුන් අල්ලා ගන්නෙමි,
කොල්ලය බෙදන්නෙමි,
මා මන දොළ සපුරා ගන්නෙමි,
මම කඩුව අදින්නෙමි,
මා අතින් ඔවුන් වනසන්නෙමි.”
10 ඔබ හුස්ම පිඹලූ සේක,
මුහුද ඔවුන් වසා ගති.
ඔවුහු රුදුරු ජල කඳ තුළ
ඊයම් මෙන් කිඳා ගියහ.
11 සමිඳුනි, දෙවියන් අතර
ඔබ හා සම අන් කවුරුන් ද?
ශුද්ධ කමින් ප්‍රතාපවත්,
බල විකුමෙන් භයංකර,
අරුම පුදුම දේ කරවන
ඔබ වැනි අය අන් කවුරුන් ද?
12 ඔබ දකුණත දිගු කළ සේක,
මිහිතලය ඔවුන් ගිලගතී.
13 ඔබ මිදූ ජනතාව, කුළුණු බරින් ගෙන ගිය සේක;
බලය පාමින් ඔබ නිවසට ඔවුන්ට මඟ පෙන් වූ සේක.
14 මේ ඇසූ ජනතාවෝ වෙවුලති;
පිලිස්ති වැසියෝ විලි රුදාවෙන් මෙන් පෙළෙති;
15 ඒ දොම්හි අධිපතීහු විස්මපත් වෙති;
මෝවබ් බලවත්හු වෙවුලති;
සියලු කානානීය වැසියෝ
දිරිය නැති කර ගනිති.
16 භීතිය හා ත්‍රාසෙය ඔවුන් පිට ය;
ඔබේ සෙනඟ එතර වන තෙක්,
සමිඳුනි, ඔබ මිල දී ගත් සෙනඟ
එතෙර වන තෙක්,
ඔබ තෙද බල විකුම් පෑ සේක.
ඔවුහු ගස් ගල් මෙන් නිසලව සිටිය හ.
17 සමිඳුනි, ඔබට උරුම වන කඳු මුදුනට,
සමිඳුනි, ඔබේ වාස බවනය වන තැනට,
ඔබ අතින් ඉදි කළ ශුද්ධ වූ ස්ථානයට
ඔබ ඔවුන් ගෙන ගොස්
පිහිට වූ සේක.
18 සමිඳාණෝ,
සදහටම රජකම් කරන සේක.

# පාස්කුවහි අරුත



**මහාචාර්යජී.පී.වී. සෝමරත්න**
BA, MA (Missiology), MA (Theology), PgDip (Demography), PhD

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ හිටපු පර්යේෂණ අංශභාර, විපුල ඵලැති ගවේෂකයෙකු හා අධ්‍යාපනික පොත් සහ ලිපිවල කර්තෘවරයෙකි. මෙතුමා කොළඹ විශ්වවිද්‍යාලයේ නූතන ඉතිහාසය පිළිබඳ මහාචාර්ය ධූරය හෙබවූ අතර යෙරුසලමේ හෙබ්‍රෙව් විශ්වවිද්‍යාලයේ ටෲමන් ආයතනයේ ද, ලී විශ්වවිද්‍යාලයේ සහ ෆුලර් දේවර්ධම ශාස්ත්‍රාලයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද සේවය කර ඇත. කාණ්ඩ හතකින් සමන්විත ශුද්ධ බයිබලයේ විශ්වකෝෂයේ කර්තෘ.

සිංහලෙන් පාස්කු යන්න පාස්කුව (Páscoa) යන පෘතුග්‍රීසි වචනයෙන් සැදී ඇත. පාස්කුව යනු ක්‍රිස්තියානි සාසනයේ ප්‍රධාන උත්සවයකි. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කුරුසියේ ඇණ ගැසීමෙන් පසු තුන්වන දින නැවත නැඟිටීම එයින් සමරයි. පාස්කු උත්සවයක් පිළිබඳ වාර්තාගත මුල්ම සැමරීම පැමිණෙන්නේ ක්‍රි.ව. දෙවන සියවසේ සිටය. එහෙත් ජේසුස් වහන්සේගේ නැවත නැඟිටීම අනුස්මරණය බොහෝ විට මීට පෙර සිදු කර ඇත. ස්වභාවිකව හෝ ආධ්‍යාත්මිකව ගත් කල පාස්කු උත්සවය යනු මරණයට එරෙහිව නව ජීවිතයක ජයග්‍රහණය සැමරීමකි. වසන්ත සමයේ නව ජීවනයක් සිහි කිරීමේ බොහෝ ක්‍රිස්තියානි නොවන චාරිත්‍ර පවතින නමුත් පාස්කු උත්සවය ක්‍රිස්තියානි දින දර්ශනයේ කේන්ද්‍රස්ථානය වන්නේ එයින් මනුෂ්‍යයාගේ ආධ්‍යාත්මික ගැළවීමට අදාළ ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැගිට වදාළ දිනය සිහිපත් කෙරෙන නිසා ය.

## දිනය

ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැඟිටීම ශුභාරංචි හතරේම කථාන්තරය අවසන් කරන්නේ එය මිදීමේ කේන්ද්‍රය සිද්ධිය වන බැවිනි. එය නොමැතිව, කෙනෙකුට ජේසුස් වහන්සේට ගරු කළ හැක්කේ, උසස් පරමාදර්ශයන් ඇති කණගාටුදායක ලෙස මියගිය ප්‍රාණ පරිත්‍යාගියෙකු ලෙස පමණි. ක්‍රිස්තියානි විශ්වාසය වන්නේ බොහෝ දෙනෙකුගේ මිදීමේ මිලයක් ලෙස තම ජීවිතය පූජාවක් කළ බවය. දැනට දෙවියන් වහන්සේගේ දකුණු පැත්තේ තේජශ්‍රීයෙන් වැඩ වසන උන් වහන්සේ මුල් පාපය නිසා දෙවියන් වහන්සේගෙන් දුරස් වූ මානව සම්බන්ධතාවය නිවැරදි කිරීමට කුරුසි පත් වු සේක. අනාගතයේ යම් දිනක තේජසින් නැවත වැඩම කරන්නාවු ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයා වන උතුම් ගැළවුම්කරුවාණන් බව මෙයින් සිහිපත් කෙරෙන්නේය.

කාලානුරූපව සලකා බලන කල ප්‍රධාන ක්‍රිස්තියානි උත්සව හයෙන් තෙවැන්න වුවද, පාස්කු උත්සවය ඒ සියල්ලේ ඔටුන්නය. එය ක්‍රිස්තියානින්ගේ දෙවියන් වහන්සේගේ ස්වභාවය සහ එහි සම්පූර්ණ ඇදහිල්ල නිර්වචනය වන ගැළවීමේ සහ නව ජීවයේ මුදුන් ප්‍රකාශනයයි. මෙම උත්සවයේ මූලික අරමුණ වන්නේ දෙවියන් වහන්සේ ජේසුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන කළ බව සැමරීමය. එය දෙවියන් වහන්සේගේ ක්‍රියාවක් වන අතර ඒ තුළින් සැබෑ ජීවනය ගලා යයි. මෙම උත්සවය අද්විතීය වන අතර අනෙකුත් සියලුම උත්සව පුනර්කථනය කරයි. පාස්කු මංගල්‍යය මුලදී කිතුනු අභිරහස සමස්ත වශයෙන් පෙන්වන මංගල්‍යය විය; මාංශවත් වීම, දුක්ප්‍රාප්තිය, නැවත නැඟිටීම, ස්වර්ගාරෝහණය, සහ ශුද්ධාත්මයාණන්ගේ පැමිණීම සිහිපත් කරයි.

ක්‍රිස්තුස් වහන්සේගේ නැවත නැඟිටීමේ මංගල්‍යය ලෙස, පාස්කුව මුල සිට ශාසනය පුරා සමරනු ලැබූ අතර, ඉරිදා දිව්‍ය සත්ප්‍රසාදයට පෙර සතිපතා ශුද්ධ ලියවිලි කියවීම සහ ගීතාවලිය ගායනයේ සේවාවක් දක්වා වර්ධනය විය. පාස්කු යනු “චංචල මංගල්‍යයකි”. එනම් චන්ද්‍ර දින දර්ශනයට අනුව දිනය සකස් වන මංගල්‍ය දිනයකි. (සූර්ය වර්ෂයක පෘථිවිය සූර්යයා වටා පරිභ්‍රමණය වීමට ගතවන කාලය දින 365 ක් පමණ පවතින අතර චන්ද්‍ර වර්ෂයක් හෝ චන්ද්‍රයාගේ සම්පූර්ණ චක්‍ර 12 ක් දළ වශයෙන් දින 354 කි. මෙම විෂමතාවය නිසා, සම්පූර්ණයෙන්ම චන්ද්‍ර දින දර්ශනය සෘතු සමග නොගැළපේ. පාස්කු දිනය තීරණය කිරීම බොහෝ විට ගැටලුකාරී විය. එය වසන්ත විෂුවයට පසු පළමු පුර පසළොස්වක පොහොයෙන් පසු පළමු ඉරිදා සමරනු ලැබේ. බටහිර හා නැගෙනහිර ක්‍රිස්තියානි සභා වෙනස් දින දර්ශන දෙකකට අනුව දිනය ගණනය කරයි. බටහිර ක්‍රිස්තියානි සභාවේ පාස්කු උත්සවය ග්‍රෙගෝරියානු දින දර්ශනය මත පදනම් වන අතර සම්‍යග්දෘෂ්ටික සභාවල එය ජූලියන් දින දර්ශනයට අනුව නිරූපණය කෙරේ. මුලදී, වසන්තයේ විවිධ දිනයන් භාවිත කරන ලද බැවින් එය ප්‍රාදේශීය සභා අතර දරුණු ආරවුල් ඇති විය.

325 දී නයිසියා නුවර පැවති සාසනයේ ප්‍රථම විශ්වීය සම්මේලනයේ දී මෙම ගැටලු විධිමත් ලෙස විසඳා ගැනීමෙන් පසුව පවා, සමහර ස්ථානවල තවත් සියවස් පහක් පමණ අර්බුදය පැවතුණි. ග්‍රෙගෝරියානු ලිත අනුව කටයුතු කළ නයිසියා සම්මේලනය සාමාන්‍යයෙන් මාර්තු 20 ලෙස සලකනු ලබන වසන්ත විෂුවයෙන් පසුව එන පුර පසළොස්වක දිනට පසුව ඇති පළමු ඉරිදා පාස්කුව ලෙස අනුමත කළේය. පාස්කු දිනය සම්බන්ධයෙන් තවමත් ජූලියන් දින දර්ශනය භාවිත කරන සම්‍යග්දෘෂ්ටික සභාතුළ මෙම පිළිවෙත අනුමත නොවීය. ජූලියන් දින දර්ශනය ග්‍රෙගෝරියානු දින දර්ශනයට වඩා දින 13ක් පිටුපසින් ඇත. එහිදී, පාස්කුව සාමාන්‍යයෙන් බටහිරට වඩා සති 1 සිට 5 දක්වා පසුව දිනයකට වැටේ. එයට අනුව මාර්තු 22 සහ අප්‍රේල් 25 අතර දිනයක පැවැත්වේ.

## පාස්කුවේ අගය

**පළමුව**, මෙම සිද්ධිය ඉතිහාසයේ එක් උච්චතම සහ නිශ්චිත මොහොතක, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ගැළවීමේ පරිවෘත්තිය සාරාංශ කර අවසන් කරයි. මෙහි දී ඉතාමත් වැදගත් තැනක් උන් වහන්සේගේ ශ්‍රී දේහය තැන්පත් කර තිබුණ සොහොන ගන්නේය. ලොව මැවීමේ සිද්ධියේදීම මේ ගැන ශුද්ධ ලියවිල්ලේ සඳහන් කරන්නේය. කුරුසියේ ඇණ ගැසීම සහ නැවත නැඟිටීම මගින් මනුෂ්‍යයාගේ මුල් පාපය සහ මරණය පරාජය කිරීමට තම පුත්‍රයා එවන බවට දෙවියන් වහන්සේ පොරොන්දු වූ සේක. වසර දහස් ගණනක් තිස්සේ දෙවියන් වහන්සේ තම පොරොන්දුව අමතක කළේවත්, එය අත්හැරියේවත් නැත. මනුෂ්‍යයාගේ පාපකාරී බව නිසා උන් වහන්සේ වෙහෙසට පත් වූයේ නැත. උන් වහන්සේ අවධානය වෙනතකට යොමු කළේ නැත. පොරොන්දුවක් දුන් උන් වහන්සේ ඉතිහාසයේ සිදුවීම් පාලනය කළ සේක. එවිට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ නියම මොහොතේ පැමිණ පොරොන්දු වූ දේ ඉටු කරනු ඇත.

**දෙවනුව,** හිස් සොහොන දෙවියන් වහන්සේ බලවත් බව හෙළි කරයි. ජේසුස් වහන්සේ නිශ්චිත මොහොතේ පැමිණ උන් වහන්සේට කිරීමට පත් කර ඇති දේ කරන බවට සහතික වීම සඳහා සියලු තත්වයන්, ස්ථාන සහ සබඳතා පාලනය කිරීමට ඇති අධිකාරිය පෙන්වයි. එසේම, මරණය කෙරෙහි බලය තිබීමට වඩා දේව බලයේ ප්‍රදර්ශනයක් සහ උන් වහන්සේගේ පුදුම බලයෙන් ජේසුස් වහන්සේ සොහොන් වස්ත්‍ර ගලවා එම සොහොන් ගෙයින් පිටතට ගිය සේක.

**තුන්වනුව,** දෙවියන් වහන්සේ ප්‍රේමණීය බව හිස් සොහොන හෙළි කරයි. දෙවියන් වහන්සේ අපට උපකාර කිරීමට මෙතරම් දුරක් යන්නේ යයි එයින් පෙන්නුම් කළ සේක. දෙවියන් වහන්සේ එසේ කළේ උන් වහන්සේ ප්‍රේම කරනවා පමණක් නොව, ප්‍රේමයේ නිර්වචනය උන් වහන්සේම බව පෙන්වූ බැවින්ය. උන් වහන්සේගේ ආදරයට පෙළඹුණේ උන් වහන්සේ අප තුළ දුටු දෙයින් නොව උන් වහන්සේ තුළ නෛසර්ගිකව ඇති ප්‍රේමණීය ගුණාංගය නිසා බව හඳුනා ගත යුතුය. අප ප්‍රේම නොකරන සහ කැරලිකාර, අපෙන් පිරී සිටින සහ අපගේම මාර්ගයක් අවශ්‍ය වුවද, දෙවියන් වහන්සේ තවමත් ප්‍රේමණීයයි. උන්වහන්සේගේ කරුණාවෙන් අප පරිවර්තනය කිරීමටත්, උන් වහන්සේගේ ප්‍රේමයෙන් අප ගලවා ගැනීමටත් සතුටු වන බව පැහැදිලි කර දෙන සේක.

**හතරවනුව,** හිස් සොහොන සදාකාලිකත්වය සහතික කරයි. ඔබේ කතාව කෙතරම් ලෞකික, සාමාන්‍ය සහ සෙමින් ඉදිරියට යන බවක් පෙනුනද, එය උත්කර්ෂවත් අවසානයක් කරා ගමන් කරයි. දෙවියන් වහන්සේ මෙම බිඳුණු ලෝකයෙන් පාපය සහ දුක් වේදනා නැති පාරාදීසයකට ඔබ ඔසවා තබන මොහොතක් ඇත.

6 පිටුවට >>>

## පාස්කුවෙහි අරුත ...

5 පිටුවෙන් >>>

**පස්වෙනුව**, හිස් සොහොන ආධ්‍යාත්මික ආරක්ෂාව සහතික කරයි. ඔබේ ජීවිතය කෙතරම් අනපේක්ෂිත සහ පාලනයෙන් තොර බවක් දැනුණත්, ජේසුස් වහන්සේ රජ කරමින් සිටින අතර, අවසාන සතුරා උන් වහන්ස්ගේ පාද යට සිටින තුරු උන්වහන්සේ දිගටම අප සමඟ සිටිනු ඇත. එයින් අදහස් වන්නේ ඔබ මෙලොවදී වේදනාවක් හා රිදවීමක් අත්විඳින්නේ නැති බව නොව ජේසුස් වහන්සේ නොදන්නා, මැදිහත් වීමට හෝ සම්පූර්ණයෙන්ම වෙනස් කළ නොහැකි කිසිවක් නොමැති බවය.

**හය වෙනුව**, හිස් සොහොන මිදීම සහතික කරයි. ඔබ කෙතරම් බලාපොරොත්තු රහිත සහ දුර්වල යැයි ඔබ සිතුවද, එය අවසානය දක්වා ගෙන යාමට ඔබට අවශ්‍ය සියලු කරුණාව ඔබට සපයා ඇත. අනාගත කරුණාව සැමවිටම වර්තමාන කරුණාවේ පොරොන්දුව රැගෙන යයි. ඔබ මුහුණට මුහුණ දකින තුරු දෙවියන් වහන්සේ ඔබට අවශ්‍ය සියල්ල සපයනු ඇත.

පාස්කු සිද්ධියෙන් තොරව, ක්‍රිස්තු ශාසනය සඳහා පදනමක් නොමැත. ජේසුස් වහන්සේගේ නැවත නැඟිටීම නිසා උන් වහන්සේ මියගියේ යයි සිතා විසිර ගිය අය විශ්වාසවන්ත අනුගාමිකයන් බවට පත් කළේය. හිස් සොහොන් ගැබ මුලින්ම සොයාගත් ස්ත්‍රීන් දෙදෙනා සහ පසුව උත්ථාන වූ ජේසුස් වහන්සේ විසින්ම ඔවුන් වෙත ගෙන ආ විස්මය දනවන සත්‍ය ප්‍රවෘත්තිය විසිරී සිටි ශ්‍රාවකයන් නැවත ගොඩට ගෙන සාක්ෂි සඳහා ඔවුන් ධෛර්යවත් කළේය. එම නැවත නැඟිටීමේ පණිවිඩය අදටත් සැක කරන්නන් ශ්‍රාවකයන් බවට පත් කිරීමට පවා බලවත් ය.

පාස්කු සිද්ධියෙන් තොරව, පරිත්‍යාගශීලී ජීවන රටාවක් නොමැත. ජේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගසන ලද ජීවිතයේ පරස්පර විරෝධී මූර්තිමත් කර පෙන්වූයේ, ආත්මාර්ථකාමී ජීවිතයක් දුක්ඛිත බවත්, අව්‍යාජ බහුල ජීවිතයක් ඇති වන්නේ යමෙකු ආත්මාර්ථකාමී ලෙස මිය ගිය විට පමණක් බවය. පාවුල් තුමා මෙය තවදුරටත් වර්ධනය කරමින්, ජේසුස් වහන්සේගේ අනුගාමිකයන් උන් වහන්සේ  සමඟ පැරණි ජීවිතයට මිය ගිය බවත්, උන් වහන්සේ  සමඟ නැවත ජීවනයට නැඟුණු බවත් අපට උගන්වන බව ය. ජේසුස් වහන්සේගේ දුක් වේදනා උන් වහන්සේගේ නැවත නැඟිටීමට සහ ස්වර්ගීය පාලනයට හේතු නොවන්නේ නම්, දෙවියන් වහන්සේ වෙත ගෙන යන කුරුසියේ මෙම පරිවර්තනීය ආකෘතිය විහිළුවකි. පාවුල්තුමා පිලිප්පිවරුන්ට නිහතමානීව හා එකමුතුකමින් ජීවත් වීමට ඉගැන්වීමේ පදනම වන්නේ, ජේසුස් වහන්සේගේ අතීත නිහතමානිකම ය. උන් වහන්සේගේ අනාගත උත්කර්ෂයට තුඩු දුන් ආකාරය කේන්ද්‍ර කරගනිමින් ජේසුස් වහන්සේගේ කථාව පාවුලු තුමා පැවසීය.

පාස්කු සිද්ධියෙන් තොරව, සියලු භූමික වැරදි නිවැරදි කිරීමට සහ ලෝකය අලුත් කිරීමට යුගාන්තීය ශාන්තියක් නොමැත. යුක්තිය පතා පොළවෙන් කෑගසන ප්‍රාණ පරිත්‍යාගිකයින් කිසිවිටෙක නිදොස් කරනු නොලැබේ. ඉතිහාසය පුරා මනුෂ්‍යයන් විසින් සිදු කරන ලද මිලියන ගණනක අසාධාරණකම් කිසිදා නිවැරදි නොවනු ඇත. පාපය සඳහා අවසාන ගණනය කිරීමක් සිදු නොවනු ඇති අතර සාතන් විශ්වීය සටන ජය ගනු ඇත. නමුත් ශ්‍රාවකයන්ගේ ආදර්ශ යාච්ඤාවට පිළිතුරු ලැබෙන බව නැවත නැඟිටීම සහතික කරයි - දෙවියන් වහන්සේගේ කැමැත්ත ස්වර්ගයේ මෙන් පොළොවෙහි සිදුවනු ඇත. ජේසුස් වහන්සේ උත්ථාන කිරීමෙන්, දෙවියන් වහන්සේ සියලු මිනිසුන්ට පෙන්වා දුන්නේ ඔවුන් කළ දේ සඳහා අවසානයේ උන් වහන්සේට පිළිතුරු දෙන බවයි.

නිසැකවම, ශුභාරංචියේ අපෝස්තලික ප්‍රකාශය කුරුසිය මත කේන්ද්‍රගත විය. නමුත් නැවත නැඟිටීමකින් තොරව කුරුසයේ අර්ථය වඩාත් අපැහැදිලි ය. ජේසුස් වහන්සේගේ ශුභාරංචිය ඉදිරිපත් කිරීම ඔහුගේ මරණය පිළිබඳ අත්‍යාවශ්‍ය පැහැදිලි කිරීම සහ එහි ගැළවීමේ

> “ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැඟිටීම ශුභාරංචි හතරේම කථාන්තරය අවසන් කරන්නේ එය මිදීමේ කේන්ද්‍ර ය සිද්ධිය වන බැවිනි. එය නොමැතිව, කෙනෙකුට ජේසුස් වහන්සේට ගරු කළ හැක්කේ, උසස් පරමාදර්ශයන් ඇති කණගාටුදායක ලෙස මියගිය ප්‍රාණ පරිත්‍යාගියෙකු ලෙස පමණි. ක්‍රිස්තියානි විශ්වාසය වන්නේ බොහෝ දෙනෙකුගේ මිදීමේ මිලයක් ලෙස තම ජීවිතය පූජාවක් කළ බවය. දැනට දෙවියන් වහන්සේගේ දකුණු පැත්තේ තේජශ්‍රීයෙන් වැඩ වසන උන් වහන්සේ මුල් පාපය නිසා දෙවියන් වහන්සේගෙන් දුරස් වූ මානව සම්බන්ධතාවය නිවැරදි කිරීමට කුරුසි පත් වු සේක. අනාගතයේ යම් දිනක තේජසින් නැවත වැඩම කරන්නාවු ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයා වන උතුම් ගැළවුම්කරුවාණන් බව මෙයින් සිහිපත් කෙරෙන්නේය.”

බලය පිළිබඳ සාක්ෂිය ලෙස ඔහුගේ නැවත නැඟිටීම අවධාරණය කළ යුතුය. ජේසුස් වහන්සේගේ මරණය සමඟ ජේසුස් වහන්සේගේ නැවත නැඟිටීම සිදු නොකරන ඕනෑම “ශුභාරංචියක්” ජේසුස් වහන්සේගේ සහ උන් වහන්සේගේ ප්‍රේරිතයන්ගේ සත්‍ය  පණිවිඩය නොවේ.

බියගුල්ලන් මෙන් සතුරන්ට මුහුණ නොදී සැඟවී සිටි ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රාවක පිරිස මරණ තර්ජන මැද්දේ නිර්භීතව ක්‍රිස්තු උත්ථානය ගැන සාක්ෂි දැරීමම සිද්ධියේ සත්‍යතාවයට සාක්ෂියකි. උන් වහන්සේගේ ප්‍රධාන ශ්‍රාවකයන් දොළොස් දෙනාගෙන් ජොහාන් හැර අන් සියල්ල මේ සිද්ධිය ප්‍රකාශ කිරීම නිසා ම මරණයට පත්වූහ.

### වාර්තා

ශුභාරංචි කිසිවක් නැවත නැඟිටීම ගැන විස්තර නොකරයි, නමුත් නැවත නැඟිටීම මානව ඉතිහාසයේ යම් නිශ්චිත කාලයක සහ විශේෂිත ස්ථානයක සිදු වූ සැබෑ, ඓතිහාසික සිදුවීමක් බවට විවාදයක් නැත. ක්‍රිස්තියානීන් දැනටමත් දැන සිටි දේ පාවුල් සාරාංශ කරයි: “මක්නිසාද මට ලැබුණු දේ පළමු වැදගත්කම ලෙස මම ඔබට භාර දුන්නෙමි, ක්‍රිස්තුස්වහන්සේ ශුද්ධ ලියවිල්ලට අනුව අපගේ පාප උදෙසා මිය ගිය බවත්, උන් වහන්සේ තැන්පත් කරන ලද බවත්, ඔහු තුන්වන දින උත්ථාන වූ බවත්ය. ශුද්ධ ලියවිල්ලට අනුකූලව” ජේසුස් වහන්සේ කේපස්ට (පේතෘස්) සහ අනෙකුත් ශ්‍රාවකයන්ට, අදහාගත් අය පන්සියයකට, ජාකොබ්ට සහ අවසානයේ තමාට ද පෙනී සිටි බව පාවුලු තුමා ප්‍රකාශ කරයි.

නව ගිවිසුම පුරාම, ලේඛකයෝ මළවුන්ගෙන් නැඟිටීමේ සිද්ධිය වෙත නැවත නැවත පැමිණෙති. මෙම සාක්ෂිය එහි ඓතිහාසික වටිනාකම සඳහා අධ්‍යයනය කළ හැකිය.

අතීතයේ දී, සමහර ඉතිහාසඥයන් විවිධ න්‍යායයන් (වංචා, දැක්ම, සංකේතවාදය සහ පෙනෙන මරණය) හරහා නැවත නැඟිටීමේ ඓතිහාසිකත්වය පැහැදිලි කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට උත්සාහ කර ඇත. වගකිවයුතු විද්වතුන් සහ ඉතිහාසඥයන් එවැනි විකල්ප පැහැදිලි කිරීම් පිළිගත නොහැකි ලෙස අතහැර දමා පාස්කු ඉරිදා සහ ඉන් පසුව ඇති වූ කරුණු බුද්ධිමය වශයෙන් තෘප්තිමත් ආකාරයකින් පැහැදිලි කිරීමට අපොහොසත් වී ඇත. ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය සොහොන් ගෙයෙන් නොපැමිණීම වෙනත් ක්‍රම මගින් පැහැදිලි කළ හැකි බැවින් හිස් සොහොන නැවත නැඟිටීම පිළිබඳ සෘජු සාක්ෂියක් නොවන බවද දක්වා ඇත.

කෙසේ වෙතත්, හිස් සොහොන් ගෙය ඔවුන්ගේ ස්වාමින් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූ බව ශ්‍රාවකයන් විසින් සොයා ගැනීම සහ පිළිගැනීමේ ප්‍රධාන සාධකයක් විය. හිස් සොහොන් ගෙය සොයා ගත්තේ අනුගාමික කාන්තාවන් දෙදෙනෙකු විසින් ය. ඉන් පසු උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේ මරියා මග්දලේනා, ජාකොබ්ගේ මව වූ මරියා, සලෝමි, පේතෘස් සහ ප්‍රේරිතයන්, ක්ලියෝපාස් සහ එම්මාවුස්හි තවත් කෙනෙකු, පාවුල් සහ පන්සියයකට අධික ශ්‍රාවකයන් ඇතුළු බොහෝ සාක්ෂිකරුවන්ට හමු විය. මෙම හමුවීම් හුදෙක් දර්ශන නොවේ: මෙම සාක්ෂිකරුවෝ ක්‍රිස්තුස් වහන්සේ සමඟ කතා කළහ, උන් වහන්සේ සමඟ ආහාර ගත්හ, සහ උන් වහන්සේ ස්පර්ශ කළහ.

එම සිය ගණනක් වූ සාක්ෂි කරුවන්ගෙන් බොහෝ දෙනෙක් තවමත් ජීවතුන් අතර සිටි අතර පාවුලු තුමා පැවසූ දේ සත්‍යේක්ෂණ කිරීමට සමත් වූහ. ක්‍රිස්තුස් වහන්සේගේ නැවත නැඟිටීම මිථ්‍යාවක් හෝ මායාවක් නොවේ: එය සත්‍ය සිදුවීමක්, සාක්ෂි දැරූ අය ඇසුරින් ලේඛනගත විය. ජොහන් සහ ලූක් ජෙරුසලමේ දී දැක ගැනීම විස්තර කරයි; මතෙව් සහ මාක් ගලීලයේ සිදුවීම් දක්වති.

ප්‍රේරිතයන් උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේ මුලින්ම හඳුනා ගත්තේ නැත. සිදු වූ දෙය ඔවුන් සම්පූර්ණයෙන්ම තේරුම් ගත්තේ පෙන්තකොස්ත දිනයෙන් පසුවය. ජේසුස් වහන්සේගේ මරණය සමහර ශ්‍රාවකයන් කම්පාවට පත් කළ අතර, ජේසුස් වහන්සේ නැවත පැමිණි බවට වූ සත්‍ය ය මුලින් විශ්වාස කිරීමට ඔවුන්ට නොහැකි විය. සමිඳාණන් වහන්සේ තමන් දුටු අයගේ වචන විශ්වාස කිරීම ප්‍රතික්ෂේප කරමින් ඔවුන්ගේ හදවතේ දැඩිකම ගැන මෘදු ලෙස ජේසුස් වහන්සේ ඔවුන්ට දොස් පැවරූ සේක.

### දේවධර්මීය වැදගත්කම

ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානය ත්‍රිත්වයේ ආශ්චර්යවත් ක්‍රියාවකි, එහි “දිව්‍ය පුද්ගල ත්‍රිත්වය එකට ක්‍රියා කරන බව පෙන්වයි. මේ අනුව, එක් අතකින්, නව ගිවිසුමේ ප්‍රකාශයන් අපට හමුවන්නේ පියා වන දෙවියන් වහන්සේ විසින් ජේසුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන කරනු ලද බවය. අනෙක් අතට, ජේසුස් වහන්සේ ඉල්ලා සිටියේය. තම ජීවිතය යටත් කර නැවත ලබා ගැනීමට තමාට අද්විතීය බලයක් ඇති බවය. පාස්කු උදෑසන ආශ්චර්යය උන් වහන්සේගේ මෙසියානු ප්‍රකාශයන් තහවුරු කරයි. දෙවියන් වහන්සේ උන් වහන්සේ “ස්වාමීන් සහ ක්‍රිස්තුස්” බවට පත් කළ බව. ඇදහිලිවන්තයන් සම්බන්ධයෙන්, මිය යන අය සහ ජේසුස් වහන්සේගේ උත්ථානය අපගේ මිදීමේ මාධ්‍යය වන අතර, වරදට සමාව දීම ද ඇතුළත් ය.

ඇදහිලි වන්තයාගේ නැවත නැඟිටීම සංකේත කරන බව්තිස්මය ඇත්ත වශයෙන්ම සුවිශේෂ ක්‍රියාවලියකි. ශාසනයේ පළමු සක්‍රමේන්තු වේ; බව්තීස්මයේදී අපි ජේසුස් වහන්සේගේ උත්ථාන වූ ජීවිතය ලබා ගනිමු. ආත්මය කරුණාවේ සහ ලෝකෝත්තර ජීවිතයකට යථා තත්ත්වයට පත් කරයි. දෙවැන්න යුගාන්තීයය; නැවත නැඟිටීමේදී ජේසුස් වහන්සේගේ උත්ථාන වූ ජීවිතය අපගේ ශරීර තේජසකට ඔසවා තබයි. අමරණීයත්වය. මරණයෙන් ජීවිතයට පැහැදිලිවම පාවුල් විසින් ප්‍රකාශ කරන ලද, නැවත නැඟිටීමේ මූලධර්මය ජොහන්ගේ ලේඛනවල දක්වා ඇත. ■

## මළවුන්ගෙන් උත්ථානය පිළිබඳ

# පාවුලු චින්තාව

**ගරු රවින් කල්දේරා පියතුමා**
කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ශාස්ත්‍ර පීඨාධිපති

ලෙන්ත කාලය මහ සිකුරාදා හා පාස්කු ඉරු දිනින් අවසන් වෙයි. පළමු පාස්කු දිනය පිළිබඳ අපට අදහස් දෙකක් සැලකිල්ලට ගත හැකි බව එන්. ටී. රයිට් අගරදගුරුවයා දක්වයි. පළමුවෙන් ම, ජේසුස් වහන්සේගේ සොහොන් ගෙය සැබවින් හිස්ව් තිබිණි; දෙවනුව, ශ්‍රාවකයන් ජේසුස් වහන්සේ සැබෑ ලෙසින් මුණ ගැසිණි. මෙයට හේතු ලෙස ඔහු මතු කරන්නේ නූතයේ මෙන් ම, පුරාතනයේ දී මළවුන් සම්බන්ධයෙන් අත්භූත අත්දැකීම් හා සිදුවීම් පිළිබඳ සඳහන් වෙයි. ඒවා සිහින, දර්ශන, භූතයෙකුගේ දර්ශනය වීමක් හෝ එවන් ආකාර අමුතු අත්දැකීමක් සේ සැලකෙන නිසාවෙන් ය. එහෙත් එවන් සිදුවීම් හෝ අත්දැකීම් කිසිදු විටක "මළවුන්ගෙන් උත්ථාන වීමක්" ලෙස ගිනිය නොහේ.

විශේෂයෙන් ම, ස්වකීය ලබ්දි නායකයාගේ ඇවෑමෙන් ඉච්ඡාභංගත්වයට හා වියවුලට පත් වූවන්ට එවැන් උත්තරීතර දාර්ශනික විග්‍රහයකට යෙදීමට පමණ අවස්ථාවක් නොමැත. අනෙක් අතට මෙවැනි විකාර ආකාරයේ ප්‍රකාශයන් හා සාක්ෂි දැරීම් මගින් ඇසුරුකරන්නන් උන්මත්තකයන් සේ සැලකීමට හේතු වෙයි. ගෙතූ ප්‍රබන්දයක් නම් ජුදෙව් ප්‍රතිවාදීන් හට ක්‍රිස්තු ශරීරය හෝ අස්ථි හෝ පෙන්වා ශ්‍රාවකයන්ගේ ප්‍රකාශනය සැනකින් නිශේදනය කරන්නට හැකියාව තිබිණි. කෙසේ වෙතත්, ජේසුස් වහන්සේ වැනි ශ්‍රේෂ්ට නායකයකුගේ ධාතු (අස්ථි) කොටස් අතිශයින් ම පූජනීය ය. ජේසුස් වහන්සේගේ ශරීරය පවා ශ්‍රාවකයන්ට ඉතාමත් ලෙන්ගතු අසහාය වස්තුවකි. එසේ තමුන් විසින් අග්‍රගණ්‍ය හා සෙනෙහසින් සලකන ස්වාමින් වහන්සේගේ මෘත ශරීරය අතුරුදහන් කිරීම පමණ කෲර ද්‍රෝහිකමක් තවත් නැත්තේ ය.

ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථානය පිළිබඳ වාර්ථාවන් අමුතු හා අත්භූතතාවයේ හිණිපෙත්තට ම ගෙන යයි. ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය කුරුස ගසේ දී ලත් කැළැල් ලකුණු සමඟ තැන තැන යා හැකි හා වැසූ දොරවල් හා බිත්ති හරහා (සර්වවාසී ස්වභාවයෙන්) ගමන් කිරීමේ අපූර්ව හැකියාවන් සහිත ශරීරයකි. ජුදෙව්වන් අතර දෙවියන් වහන්සේගේ අවකාශය හා ස්වභාවය පිළිබඳ පැහැදිලි අදහසක් විය; එය ස්වර්ගීක තලයේ ලා සැලකිණි. එහෙත් දෙවියන් වහන්සේගේ අවකාශය හා ස්වභාවය මිනිසාගේ අවකාශය හා ස්භාවයෙන් වෙනස් අනන්‍ය වූවකි. උක්ත දැක්වූ අපූර්ව ශරීරය බයිබලයේ සඳහන් වන, පළමු සියවසේ මැදපෙරදිග දර්ශනයට හා ජුදෙව් සංකල්පනාවෙන් පරිභාහිර වූ අදහස්

> "අනෙක් අතට ක්‍රිස්තුන් වහන්සේ ගැන පවසන පාවුලු තුමා අවසාන ආදම් "ජීවනදායක ආත්මයක්" (පෙනුමා ශෝපොයියොන්) ලෙසින් විග්‍රහ කරයි. එනයින් පාවුලු තුමා විසින් කිසිඳු විටක ජේසුස් වහන්සේගේ ශරීරය පාරභෞතික යමකින් හෙවත් ආත්මික සංරචකයකින් නිර්මාණය වී ඇති බව "නියුමටිකොන් සොමා" හෝ "පෙනුමා ශෝපොයියොන්" යන යෙදුම්වලින් අදහස් නොකෙරේ."

නිරූපනය කරන්නේ ය. ඒ හෙයින් එකී නිරූපනයන් ජුදෙව් හෝ ග්‍රීක-රෝමයකුට වුව ද අස්වාභාවික හිතලුවකි.

ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථානය පිළිබඳ දේවධර්මික හා දර්ශන විද්‍යාත්මක ලෙසින් පරිකල්පන කළ අයෙකි, පාවුලු නම් ශ්‍රාවකයා. ඔහුගේ ලියවිලිවලින් මතුවන ධාර්මික සංකල්පනාවන් ප්‍රධාන වශයෙන් තෙවැදෑරුම් ය. පළමුවෙන් ම, ඔහුගේ අභිලාශය වන්නේ ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථානය පිළිබඳ ජුදෙව්වාදී ගවේශනයක යෙදී එය බව්තීස්ම ලත් කිතුනු දිවිපෙවෙතට අදාළ වන්නේ කෙසේදැයි කල්පනා කිරීමට ය. දෙවනුව, ක්‍රිස්තු උත්ථානය මගින් කිතුනුවන්ට අනාගත මළවුන්ගේ උත්ථානයක් පිළිබඳ බලාපොරොත්තුවක් මෙන් ම, ක්‍රිස්තුස් මළවුන්ගෙන් උත්ථානය පරමාදර්ශයක් ලෙස දේවධර්මික වශයෙන් පාවුලු තුමා ඉදිරිපත් කරයි. අවසාන වශයෙන් පාවුලු තුමා ශරීරයෙන් වියුක්ත වී ස්වර්ගයේ සැරිසැරීම පිළිබඳ ශාක්‍යතාවය ගැන අදහස් දැක්වීමක් කරන්නේ ය.

පාවුලු තුමා හට දමස්කසයේ කිතුනුවන් අතරේ මෙන් ම, ජෙරුසලම් සභාවේහිද නායකයන් අතරෙහි සුවිශේෂිය පිළිගැනීමක් නොවී ය. එයට හේතු වන්නට ඇත්තේ මුල් කිතුනු සභාව හා එහි සභිකයන් ජුදෙව් නායකයකු ලෙස මුලිනුපුටා දැමීම සඳහා ඔහුගේ උත්සහයත් **(ක්‍රියා 8:3; 24:17; 26:10-11; 28:19; ගලාති 1:13)**, ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථානයේ සිට ස්වාර්ගාරෝහනය දක්වා දින හතළිහක කාලය තුළ පාවුලු විසින් උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ නොදුටු නිසාවෙන් ය. මළවුන්ගෙන් උත්ථානයත් ස්වාර්ගාරෝහනයත් අතර කාලපරිච්ඡේදය තුළ ජේසු ශ්‍රාවකයන් මෙන් ම, වෙනත් පුද්ගලයන් පන්සියකට පමණ ක්‍රිස්තුන් වහන්සේ ප්‍රකාශ වූ සේක. **(ක්‍රියා 1:14).**

පාවුලු තුමා විසින් දමස්කස් නගරයට යන අතරතුර ජේසුස් වහන්සේ මුණ ගැසීම සිදුවන්නේ, ස්වර්ගාරෝහනයෙන් පසුව නිසා එක්තරා අතකට එය "දර්ශනයක් හා සමාන" වූවකි. එහෙත් දර්ශනයක් දැකීමේ ප්‍රකාශයකින් පමණක් ම, එය තනිපුද්ගල සාක්ෂියක් නිසාවෙන් එහි ස්වාධීන ලෙස සත්‍යක්ෂනයක් කළ නොහේ. කෙසේ වෙතත්, පාවුලු තුමා සැබෑ ලෙසින් ම ක්‍රිස්තුන් වහන්සේ දැක, උන් වහන්සේගේ අනුගාමිකයකු වූ බව ප්‍රකට කරන්නේ ඔහුගේ චරිතයෙන් හා කල ක්‍රියාවෙහි ඇති වූ පරිවර්තනය හේතුවෙන් ය.

පාවුලු තුමා විසින් මළවුන්ගෙන් උත්ථානය පිළිබඳ දැක්වූ අදහස් කවරේ ද කියා නිශ්චය කර ගැනීමේ අපහසුතාවයක් වෙයි. 1 කොරන්ති 15 පාවුලු තුමා විසින් සියලු ම අදහන්නන්ගේ මළවුන්ගෙන් උත්ථානය පිළිබඳ සාකච්ඡා කරන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ

8 පිටුවට >>>



## පාවුලු චින්තාව

7 පිටුවෙන් >>>

මළවුන්ගෙන් උත්ථානය ආදර්ශය කොට ගෙන ය. කොරින්තිවරුන්ට යැවූ සංදේශයන් නව ගිවිසුමේ පළමු සාහිත්‍යයන් සේ විශාරදයන් සලකන හෙයින් පාවුලු තුමාගේ විග්‍රහ තුළ මුල් සභාවේ මළවුන්ගෙන් උත්ථානය පිළිබඳ තිබූ පොදු ජුදෙව්-කිතුනු විශ්වාසයේ ප්‍රති-මූර්තියක් සේ සැලකිය හැකි ය.

පාවුලු තුමා ස්වඇදහිල්ලෙන් පරිසිවරයෙක් නිසාවෙන් **(ක්‍රියා 26:5; පිලි 3:5)** පරිසිවර විශ්වාසයන් ආකාරයෙන් මළවුන්ගෙන් උත්ථානය ශාරීරික වශයෙන් සිදුවන බව ඇදහුවේ ය. පරිසිවරුන් විසින් මළවුන්ගෙන් උත්ථාන වීම වනාහි බයිබලීය වශයෙන් පාදක කර ගත්තේ දානියෙල් 12:1-3 දක්වා කියවීම ය. දානියෙල් විසින් මතු කරන මළවුන්ගෙන් උත්ථානය පසුකාලීන ශතවර්ෂ ගණනාවක් තුළ "ධර්මිෂ්ඨයන් ගේ වික්‍රමාන්විත ලෙසින් සාමූහික වශයෙන් ලැබෙන මළවුන්ගෙන් උත්ථානය" දැක්වෙයි. මළවුන්ගේ උත්ථානය ගැන කල්පනා කිරීමේ දී පාවුලු තුමා 1 කොරින්ති 15 පරිච්ඡේදයේ මූලික තර්කය ලෙස ගෙනෙන්නේ "ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන නොවූයේ නම් අපගේ ඇදහිල්ල නිෂ්ඵල" බව ය **(15:17).** පළමු සියවසේහි විසූ කිතුනුවන් සැලකුවේ මරණය නැමති නින්දෙන් අප පිබිදී ක්‍රිස්තුස් වහන්සේ මෙන් මළවුන්ගෙන් උත්ථාන වන බවකි. ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථානය, නව මැවිල්ලක පිළිවෙලක් ආරම්භයක් ලකුණු කළ සේක. එනයින්, ස්වර්ගයේ මෙන් භූමියේ ද දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු වීම ආරම්භ විය. මෙලෙසින් දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ අභිනවය හා උන් වහන්සේගේ නව යුගයේ උදාව වර්තමාන කාලය මතට කඩා වැටේ.

අනෙක් අතට, ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය පිළිබඳ පළමු සාක්ෂි කරුවන් වූයේ කාන්තාවන් ය. පුරාතන ලෝකයේ ස්ත්‍රී සාක්ෂිය හෝ ස්ත්‍රීන්ගේ ප්‍රකාශ හෝ පිළිගැනීමට ලක් කළ නොහැකි සේ ම, ඔව්හු ස්වාධීනතාවයක් ලත් පුද්ගලයෝ නොවෙති. සමාජයේ පිළිගත හැකි සාක්ෂි කරුවන් දැක් විය යුතු මොහොතක් වුව ද, කාන්තාවෝ මුල් ම සාක්ෂිකරුවන් වූහ. ශුභාරංචි ප්‍රකාශයේ දැක්වෙන උත්ථානය පොදු විශ්වාසයන්ට පරස්පර විරෝධී වන්නේ ය. එසේ වුව ද, සත්‍ය වසන් කිරීමට ශුභාරංචි කතුවරුන් උත්සහ දරන්නේ නැත. ශුභාරංචි ග්‍රන්ථයන්හි මළවුන්ගෙන් උත්ථානය සම්බන්ධ පුවත විවිධ වෙනස් ආකාරයේ පරස්පරතාවයන් සමඟ සටහන් කොට ඇත. යම් කතුවරයෙක්ට හෝ සංස්කාරකවරයකුට, විශ්වාසනීයත්වය හා ශ්‍රද්ධාව වැඩි වර්ධනය කිරීම පිණිස ශුභාරංචි සටහන් සියල්ල පිළිවෙලකට හා සංගත ලෙස සැකසීමේ හැකියාවක් තිබූ නමුත් එසේ නොකළේය. එහෙත් එසේ නොකර, පරස්පරතාවයන් සමඟත්, කාන්තාවන් මූලික සාක්ෂිකරුවන් කිරීම මගින් සැඟවූ අභිමථාර්ථයක් ශුභාරංචි රචකයන් නොමැති බැව් පෙනේ.

එතැන් සිට පාවුලු තුමාගේ අවධානය යොමු වන්නේ කවරාකාර ශරීරයක් මළවුන්ගෙන් උත්ථාන වුවන් හට ඇත්තේ ද යන පැනයට ය. මෙහිලා පාවුලු තුමා විශේෂිත ග්‍රීක් යෙදුමක් භාවිත කරන්නේ ය. එය "නියුමටිකොන් සොමා" (ආත්මික ශරීරය) යන යෙදුමෙන් නිර්වචනය කරන්නේ පුද්ගලයකුගේ " සොමා සයිකිකොන් " (භෞතික ශරීරයට) හාත්පසින් ම වෙනස් අදහසක් මතු කරමින් ය **(1 කොර 15:44).**

> “ පාවුලු තුමා තව දුරටත් ඔහුගේ තර්කය ශක්තිමත් කරන්නේ "ලෙයට හා මාංශයට" දෙවියන් වහන්සේගේ රාජ්‍යයට උරුමකම් කීමේ විභවයක් නොමැති බව පාවුලු තුමා දක්වයි (1 කොර 15:50). දිරාපත් වීමට, ක්ෂය වීමට හා දූෂිත බවට දේව රාජ්‍යයට අගන්තුක හෙයින් ය. ඒ හෙයින් දේව රාජ්‍යයට ඇතුල්වන්නන් නිසර්ගයෙන් "ශරීර පරිවර්තනයට" ඇතුල් විය යුතු ම ය. ”

මුලින් පරිසිවරයකු වූ පාවුලු තුමා හට මෙකී ව්‍යවහාරය එක්තරා ආකාරයට අපභ්‍රංසයක් සේ හැඳෙන්නට ඉඩ තිබුනේ මුල් ශතවර්ෂයේ ජුදෙව් පරිසිවරුන් "ශාරීරික වශයෙන් මළවුන්ගේ උත්ථානය" පිළිබඳ දැඩි ස්වරයක් ගත් හෙයින් ය. සමහර පරිසිවරුන්ගේ තර්ක-විතර්කවලදී මළ පුද්ගලයාගේ ඇති ශාරීරික ආබාධ, දුබලතාවන් හා අනතුරුවලින් වූ කැළැල් හෝ අංගඡේදනයන් ඒ ආකාරයෙන් ම "උත්ථාන වූ ශරීරයේ දක්නට ඇති බව" විශ්වාස කෙරේ. නිදර්ශනයක් ලෙස ජේසුස් වහන්සේ සමඟ ඇති වූ වාග් ප්‍රහාරයේ දී ජේසුස් වහන්සේ පැහැදිලි ලෙස මළවුන්ගෙන් උත්ථාන වූවන් ස්වර්ගීය දේව දූතයන් හා සමාන වන බව පැවසූ සේක **(මතෙව් 22:29-31).** තල්මුද් ග්‍රන්තයේ මෙන් ම, මකබී පොත්වල ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ් යන කුළදෙටු පියවරුන් දෙවියන් වහන්සේ සමඟ ජීවත් වෙමින් සිටින බැව් විශ්වාස කොට ඇතැයි මතුවෙයි **(4 මකබී 7:19; 16:25).** සකල ජාතීන් ආබ්‍රහම් වෙත පැමිණෙන දැක්මක් යුගාන්තයේ අදහස් දැක්වීමේ දී ජේසුස් වහන්සේ වදාළ සේක **(මතෙව් 18:11).**

පාවුලු තුමා විසින් කරන්නා වූ ශරීර ස්වභාවයේ පරස්පර විභේදනයට හේතු වන්නේ ග්‍රීක බසේහි වූ ව්‍යවහාරාත්මක ලක්ෂණයන් ය. මෙහිදී පාවුලු තුමාගේ විග්‍රහයට පාදක වන්නේ ආදම්ගේ ස්වභාවය (පළමු ආදම්) හා ක්‍රිස්තුස් වහන්සේගේ ස්වභාවය (අවසාන ආදම්) අතර ඇත්තා වූ වෙනස් කම ය. ක්‍රිස්තුන් වහන්සේ පාවුලු තුමා දක්වන්නේ "මැරුණු අයවළුන්ගෙන් පිටතට උත්ථාන කරනු ලැබූවකු" සේ මිසක, "මරණයෙන් උත්ථාන" වූවෙකු ලෙස නොවේ. ග්‍රීක් බසේහි චමත්කාර ජනක ලෙස ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානය සිතුවම කර ඇත්තේ ඉතිහාසය පුරා භෞතික ලෙස "මළ ජනතාවක්" ඇසුරින් මරණයෙන් උත්ථාන කරනු ලැබූ අවසාන ආදම් ලෙසින් ය. අනෙක් අතට මෙකී යෙදුම්වලින් මතු වන්නේ උත්පත්ති පොතෙහි දැක්වෙන මැටියෙන් අඹනු ලැබූ ආදම් ජීවන-හුස්ම (සුකේශො'ස්, "ජීවන-ප්‍රාණයෙකු") මගින් සජීවීකරණයට පත් වීම මෙහිදී අදහස් කරන බැව් පෙනේ **(උත් 2:7; 1 කොර 15:45).**

අනෙක් අතට ක්‍රිස්තුන් වහන්සේ ගැන පවසන පාවුලු තුමා අවසාන ආදම් "ජීවනදායක ආත්මයක්" (පෙනුමා ශෝපොයියොන්) ලෙසින් විග්‍රහ කරයි.

එනයින් පාවුලු තුමා විසින් කිසිදුවිටක ජේසුස් වහන්සේගේ ශරීරය පාරභෞතික යමකින් හෙවත් ආත්මික සංරචකයකින් නිර්මාණය වී ඇති බව "නියුමටිකොන් සොමා" හෝ "පෙනුමා ශෝපොයියොන්" යන යෙදුම්වලින් අදහස් නොකෙරේ. පාවුලු තුමා පවසන්නට උත්සහ කරන්නේ පූර්ණ වශයෙන් "ශරීරය" ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් බලගැන් වූ ප්‍රාණවත් කරන ලද්දක් බව ය. පාවුලු තුමා ස්වකීය තර්කය තවදුරටත් ශක්තිමත් කරමින් මරණීය ශරීරය සදාතනයට පවතින ශරීරයකින් විස්ථාපනය කළ යුතු බව දක්වන්නේ මේ නිසා ය. ඒ හෙයින් ශරීරය නිරතුරුව ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ බල ගන්වා පරිවර්තනයට බඳුන් වී ඇති හෙයින් තවදුරටත් රෝගයක් වත්, දිරායෑමක් වත්, මරණයට වත් බඳුන් නොවේ. මෙසේ මරණය පරාජය කොට පරිවර්ථිය ශරීරය අමරණීය බවට පත් වන්නේ ය **(1 කොර 15:46-49).**


පාවුලු තුමා තව දුරටත් ඔහුගේ තර්කය ශක්තිමත් කරන්නේ "ලෙයට හා මාංශයට" දෙවියන් වහන්සේගේ රාජ්‍යයට උරුමකම් කීමේ විභවයක් නොමැති බවයි. **(1 කොර 15:50).** දිරාපත් වීමට, ක්ෂය වීමට හා දූෂිත බවට දේව රාජ්‍යයට අගන්තුක හෙයින් ය. ඒ හෙයින් දේව රාජ්‍යයට ඇතුල්වන්නන් නිසර්ගයෙන් "ශරීර පරිවර්තනයට" ඇතුල් විය යුතු ම ය.

පාවුලු තුමා විසින් 2 කොරින්ති 5:1-10 දක්වා කොටස තුළින් ශරීරයෙන් තොර ව ස්වර්ගයේ ගත කිරීමක් පිළිබඳ අනාවරණයක් කරයි. එහිදී ශරීරයෙන් තොර ව ස්වාමින් වහන්සේ ඉදිරියෙහි පැවත්මක් පිළිබඳ සඳහන් කරන්නේ ය **(2 කොර 5:8).** ඒ හෙයින්, යුගාන්තයේදී ශරීරික උත්ථානය පිළිබඳ අදහසක් ප්‍රකට වන අතර, නව මැවිල්ලෙහි දී විනාශ වන සියල්ල විනාශ නොවන සියල්ලට අවශෝෂණය වනු ඇත. පාවුලු තුමා දක්වන නව ජෙරුසලමෙහි පැමිණීම සමඟ ඇතිවන දෙවන ආගමනය ස්වර්ගය හා පොළොව ඒකාබද්ධ කරනු ලබන්නේ ය (ගලාති 4:26). වත්මන් ගලා යන කාලය අකාලිකය මගින් සංකෝචනය කොට සදාතනය ආරම්භ වීමෙන් යුගාන්තය ඇත්වන්නේ ය. ඒ හෙයින් පරණ ගිවිසුම් ව්‍යවස්ථාව මගින් ස්ථාපනය වූ "පාස්කුව" එක් වරක් වූ සිදුවීමක් නොව, පාවුලු තුමා දක්වන්නේ "ජේසුස් වහන්සේගේ ඉතිහාසය" හෙවත් කිතුනුවන්ගේ අවසාන ඉරණමයි.

පාවුලු තුමා දක්වන්නේ ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථානයේ නාඹුල් අස්වැන්න යි. දෙවන දේවමාළිගා සමය හෙවත් ක්‍රිස්තෝපත්තියෙන් ශතවර්ෂ හතරකට පමණ පූර්වයෙන් මළවුන්ගෙන් උත්ථානය පිළිබඳ සංකල්පනාවන් අභයේ පාවන සංකල්පනාවන් පමණක් විය. ඒ අදහස් එතරම් බැරෑරුම් වශයෙන් සිතා බලන්නට තරම්වත් කාලය වෙන් කර හෝ ආවර්ජනයක් කර හෝ නැත්තේ ය. එවන් පසුබිමක ශ්‍රාවකයන් විසින් ජුදෙව් චින්තාවට ආගන්තුක සංකල්පනාවක් කරපින්නාගෙන යෑමෙන් ඇති වාසිය කිම? අනෙක් අතට, මළවුන්ගෙන් උත්ථානය මුල් ශ්‍රාවකයන්ගේ මෙන් ම, පාවුලු තුමාගේ කතිකාවේ දී "නව ආගමික අත්දැකීමක්" ගෙනෙන රූපයක් සේ සැලකිණි. ඒ හෙයින් මෙදා පාස්කුව තුළ අපට මතු කරන අභියෝගය ක්‍රිස්තුන් වහන්සේගේ මළවුන්ගෙන් උත්ථානය සභාවක් ලෙස කෙසේ අවබෝධ කර ගන්නේ ද? එයින් ඇති කරන නව යථාර්ථය පෞද්ගලික ලෙස බව්තීස්ම සංඝයක් ලෙස අදාළ කර ගන්නේ කෙසේ ද යන්න යි. ■

# මර්සිලීනු ජයකොඩි පිය ගී පෙළහරෙහි එන ළසෝ ගී

රූපස් ෆැන්සිස්
කුඩාපයාගල



ලෝක පූජිත අතිගරු මර්සලීනු ජයකොඩි නි.ම.නි. පියතුමා සිංහල ගීතිකා උත්පාදනයෙහි ලා අද්විතීය නමක් හිමිකර ගත් පියතුමායි. ඒ සම්බන්ධව කතෝලික සාන්ත සභාවෙහි ඉතිහාසගත නොමැකෙන නාමය ද උන්වහන්සේමයි. පාරිශුද්ධ දේවමාතාවන් හට ප්‍රමුඛත්වය ලබාදෙමින් ඇරඹූ කිතුණු ගේය පද රචනය, ලත් දේවාශිර්වාදය තුළින්ම කඩඉම් සීමා අභිබවායමින් නිර්මාණයට යොමුවීම වාසනා මහිමයයි.

අපේ අනන්‍යතාවය මත පිහිටා උන්වහන්සේ සාන්තුවරුන්ට, දෙව්මැදුරුවල වාර්ෂික මංගල්‍යයන් සඳහා මෙන්ම, පාස්කුව හා නත්තල් අරභයා ගීතිකා සමූහයක් ලියා, තනුවද සපයමින් සමාජ ගත කිරීම, ලද තලෙන්තුවල ප්‍රතිඵලයයි. ඉතාමත් ගෞරවාන්විත, භක්තිය දනවන සරල බසින් ජනිත කළ, පහසුවෙන් මතකයෙහි පවතින මෙම නිර්මාණ ජනතාවට බෙහෙවින් ම සමීපයි.

දේශීය ගීතිකාවෙහි උන්නතියට ශක්තිය සැපයූ ගරු ජයකොඩි පියතුමා, බොදුනුවගේ කුස ජාතකය ගායනයෙන්ද, පියාගේ වෙදකම්වලට භාවිත කළ පොත පතෙහි කවිවලින්ද ශ්‍රවණය වූ තාල, හදවතෙහි පැළපදියම් කරගත්හ. ඒ අනුව අර්ථයෙන් පොහොසත්, බසින් අග තැන්පත්, අලංකාරයෙන් පෝෂණය වූ සුන්දර කාව්‍යමය නිර්මාණ කාලීනව එළිදක්වන ලදි.

ලලිත කලාවට නෑ සම්බන්ධකම් පවතින ස්වභාව සෞන්දර්යය එතුමාගේ ගීතිකාවලද හරය බවට පත්විය. ලංකා මල්පොකුරෙහි සුවඳවත්වන කුමුදිනිය ලෙස දේව අම්මා නම්කොට, අතිශ්‍රේෂ්ඨත්වයෙන් යුතුව එතුමිය පුදන්නට, නමස්කාරයට භාජනය කරන්නට අමතක නොකළේ ය. තම ගීතිකාවලියෙහි ළමා ගී, දේශභිමානී ගී, කැරොල් ගී, නැලවිලි ගී, පාස්කු ගී මෙන්ම පසම් ගායනා ද අඩංගු විය.

කිතු උපත සමරමින් අළුත් වසරකට පිවිසෙන කිතුනු ජනතාව, මුල් කාර්තුවේදී ම කිතු සමිඳුන්ගේ ශුද්ධවූ කුරුසියේ පූජාවීම අනුස්මරණය කරනු ලබන දින හතළිහක (40) පාස්කුව අත්දකිති. ඉතා සංවේදී ක්‍රිස්තු ජීවිතයේ අවසාන කාලයේ කෲරතර සිදුවීම් කොරොස්ම කාලය තුළ භාවනාවට ගැනේ. තම කිට්ටුවන්ත ශ්‍රාවක අතළොස්ස සමග වැළඳූ පාස්කු භෝජනය, ගෙත්සෙමෙනි උයනෙහි ලොවිතුරා දෙවිමහෝත්තමයාණන් වෙත, දුක්මතිකව කළ හුදකලා යැදුම, ජුදාස් නම් තම ගෝලයා ස්වාමියාණන් පාවා දීම, සිරගත කිරීම, ජුදා පූජකයන් හා රෝමානු කතෝලිකයන් ඉදිරිපිට විනිශ්චය, මරණයට තීන්දුව ලැබීම, වදහිංසාවලට පාත්‍ර වීම, බරවූ කුරුසිය උරමතින් දරා කල්වාරි කඳු පියසට ගිය දුෂ්කර ගමන, කුරුසියේ ඇණ ගැසීම, උකුත්වීම සංවේගයෙන් යුතුව ජනතා සිත් සතන්වලට දැනෙන වකවානුව බවට පාස්කුව පත්වනු ඇත. ගීතිකා ශ්‍රවණයෙන්, උච්චාරණයෙන් කිතු සමිඳුන් හට පිදිය යුතු ඉහළම ප්‍රශංසාව ලබාදෙන්නට ජනතාව අතපසු නොකරති. ඒ සඳහා සියල්ල සූදානම් කර දුන් ජයකොඩි පියතුමා පිළිබඳව උන්වහන්සේ ස්වර්ගස්තව වසර විසිපහක් (25) සපිරෙන (1998 ජනවාරි 15 - 2023 ජනවාරි 15) මේ වසරේ අපේ අවධානයට යොමුවීම කෘතගුණ දැක්වීමක් වනු ඇත.

මනුසත දුර්වලය, පාපයට වැටෙන සුළුය. දිවුරා කීවත්, අදිටනෙන් සිටියත්, දැනුවත්ව හෝ නොදැනුවත්ව කොයිමොහොතක හෝ අපට අමතක වී පාපයට ඇද වැටෙනු ඇත. එම නිසා පවුලොව ගැළවුම්කාරයාණන් වන ජේසු වෙතින් සිරසනමා, ආයාචනයෙන්, මනස්ථාපනයෙන් සමාව අයදින්නට උන්වහන්සේ නිර්මාණය කළ ගීතිකාවයි මේ.

සිරස නමා - අයැද කමා
ඔබ නමදිමු ජේසු

දෙව් බව සුසිඟිති පූපෙක සඟවා
ඔබ වෙතැ අපසැම කැඳ වූ
ඒදෙව් කුලයට ගැති අප නඟවා
ඔබෙ හද තුළ අප රැඳ වූ

ගෙන මනු බව කුස තුළ මරි මවගේ
ඇගෙ එකමනු දෙව් දරු වූ
දින දින රසගැන්වෙන අප දිවගේ
පව්ලොවැ ගැලවුම් කරු වූ

ඇස රස පරදන මෙම මහ රහ සේ
අඟපසඟින් පිරි පුන් වූ
ඔබ සිටිතියි අදහමු ඉර හඳ සේ
දෙලොවට දෙව් රපිඳුන් වූ

පාස්කු සමයෙහි පාදනමස්කාරය ක්‍රිස්තු දුක් දොම්නසය දනවන ස්ථාන දහ හතරකින් සමන්විත පා ගමනකි. පිලාත්ගේ නඩු ශාලාවේ සිට කල්වාරි මස්තකය දක්වා දිග හැරෙන සන්ධිස්ථාන අතරතුර ගායනයට නිමැවූ ගීතිකා සියල්ල මනුෂ්‍ය චිත්ත අභ්‍යන්තරය සනිටුහන් කිරීමකි.

යහනක විලසේ - සැතැපී සැපසේ
අප ගලවනසේ - සිරි කුරුසේ
පණ පුදලමිනේ - අපසැම පෙමිනේ
පණ ගන්වමිනේ - රැකලනසේ

යනවද ජේසු - යනවද ජේසු - යනවද ජේසු - කුරුසියටා

දෙනුවන ඇරිලා - කඳුලින් පිරිලා
සියොලඟ ඉරිලා - දුක්බරවී
සිරි පා නඟලා - දුරහෙළ බලලා
කුරුසිය කරැලා - මුවපරවී

යනවද ජේසු - යනවද ජේසු - යනවද ජේසු - කුරුසියටා

අත්විහිදාලා - හදට බදාලා
සැවොම මුදාලා - දෙව් දරු සේ
මොක්සැප දීලා - සැමරස ලීලා
අපවෙත පාලා - ගෙන කුරු සේ

යනවද ජේසු - යනවද ජේසු - යනවද ජේසු - කුරුසියටා

භක්ති අභ්‍යාසයන්හි යෙදෙමින් ශුද්ධ වූ කුරුසිය ත්‍යාජවීම සමරන්නට, සැදැහැවත් ජනතාව තුළ ඇතිකරවන සංවේදීකම මෙම ගීතිකා වල අරුතින් මනාව ගම්‍ය වනු ඇත.

වාදනවේ දුර වද බෙර රැව්දේ - නාද ඇසේ රැව් පිලිනැගෙනා
පාදනගා කල්වාරිය නගිනා - දෝත වඩා කුරුසිය රැගෙනා

ජේසු අනේ ඔබ මේ විඳිනා දුක
සෑම අපේ පවු කරට ගෙනා
බෝ සොවිනා සිහිකර බැතිනා
අපි කඳුළු හෙලා හඬමු //

පා ඔබගේ පෙම්බරිත සොබාවේ - දේව ගුණෙන් හදවත මුසුවූ
සෑම අමාරස පව්බර අපහට - ලෝක උපායට නිති අසුවූ

ජේසු අනේ .....

දෑස වසා හිස ලය මත හිදුවා - දෑත තබා දෙදිගට ඇරලා
පාද නමා මරණය කරැ නංවා - බෝ දුකසේ ඔබෙ පණ පිදුවා

ජේසු අනේ .....

රජ සැප විඳිය හැකිව තිබිය දී ඉතා අඩු වයසින් ලෝකයාගේ පාපී බව තුළ සිදු කෙරුණ ගණනින් සීමා කළ නොහැකිවූ අයහපතින් මුදන පිණිස අප්‍රමාණ වදගාවිනා වලට ලක්ව ජීවිතය පූජා කළ සමිඳානන්ගේ අවසන් හෝරා කිහිපය දෙස සිත්සතන් යොමු කරවන මෙම ගීතිකාව චතාරික සමයෙහි මහත්සේ රැව්පිළි රැව් නැගෙනු ඇත.

කුරුසේ නැග අත් විහිදා - මුළු ලෝ තුරුලට බදලා
සිටිනා දෙව්පුත් රජුනේ - ඔබේ පා සිඹිමින් වදිමු
සිරසේ කිරුළේ මිණිසේ - බැබලේ බිඳුවැල් සිරිලේ
කුරුසේ සිටිනා දෙවිඳේ - ඔබේ පා සිඹිමින් වදිමු

දෙනෙතේ කඳුළුයි ඔබගේ - දෙතොලේ ලේවැල් කැටිවේ
ඇනලා සිරවී තිබෙනා - ඔබේ පා සිඹිමින් වදිමු

පහරින් නිල්වූ සිරුරේ - දහරා ගලමින් දිලිසේ
මෙලෙසේ පණදුන් දෙවිඳේ - ඔබේ පා සිඹිමින් වදිමු

සතුටින් ඔබේ පණ බිලිදී - පණ ගන්වා අප කුරුසේ
නිරයෙන් අප සැම ගැල වූ - ඔබේ පා සිඹිමින් වදිමු

වරමින් ඔබ ඒ කුරුසේ - අප පව් බැම්මෙන් මුදවා
සැමදා රකිනා සමිඳේ - ඔබේ පා සිඹිමින් වදිමු

ඔබ හා කුරුසේ නැගලා - ඔබේ දෑසින් ලොව බලලා
ඔබසේ කරුණා පාලා - කුරුසේ හිඳිනා සමිඳේ

හිඳිනා ලෙසමා කැඳවා - කල්වාරිය මත නංවා
ඔබ හා මා හා සිටිමු - කුරුසේ හිඳිනා සමිඳේ

මෙලෙස දුක්ප්‍රාප්ති ගායනා අභිනවයෙන් තනා දෙමින් අතිගරු මර්සලීනු ජයකොඩි පියතුමා, ගැයීම දෙවරක් යැදීම බව සිහිගන්වමින් කිතුනු ජනතා ගෞරවය කිතු සමිඳුන් වෙත කොරොස්මයේදී පමණක් නොව සාමාන්‍ය සමයේදී පවා පුදකරන්නට යොමු කිරීම දෙවිඳුන් වෙත සමීප කරවීමකි.

පියතුමනී, හමුවේ දිනක ඒ ප්‍රසන්න ලොවෙහි අපි ■

ජේසු පිහිටයි !



# පාස්කුව කියන්නේ මොකක් ද?

ශුද්ධ වූ බයිබලයෙන් ලබා ගත් තොරතුරුවලින් සිංහලයට සකස් කළේ,
**රේණුකා සිරි කුමාර හා සුජිත සිරි කුමාර**

පාස්කු ඉරිදා කියපු ගමන් අපිට මතක් වෙන්නෙ පාස්කු ඉරුදිනක ලංකාවේ ක්‍රිස්තියානි දේවස්ථාන කිහිපයක සිදු වූ බෝම්බ ප්‍රහාරය ගැනයි. පාස්කුව කියන්නේ පාස්කුව නමින් හැඳින්වෙන ක්‍රිස්තියානි ආගමික උත්සවයටයි. පාස්කු උත්සවය හෙවත් පාස්කු දේව මෙහෙය පවත්වන්නේ ඉරිදා දවසක නිසා අපි ඒකට පාස්කු ඉරිදා කියලා කියනවා. පාස්කු ඉරිදාව පවත්වන්නේ අවුරුද්දකට එක් වරක් පමණයි. එවැනි ඉරිදා දවසක ඔබ ක්‍රිස්තියානි දේවස්ථානයකට ගියොත් ඔබට පෙනේවි පාස්කු ඉරිදා දේව මෙහෙයේ කරන ප්‍රධානතම කටයුත්ත මොකක්ද කියලා. ඒක තමයි යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මරණයෙන් නැගිටුණු බව හෙවත් උත්ථානය වූ බව සිහි කරලා සන්තෝෂ වෙමින් දෙවියන් වහන්සේට ඒ ගැන ස්තූති පූජා පවත්වන එක.

මේ උත්සවයට නැතිනම් ඒ දවසට අපි ඉංග්‍රීසියෙන් කියන්නේ Easter Sunday කියලා. මේක ක්‍රිස්තියානි ආගමික උත්සවයක් වුනත් පාස්කුවේ මූලාරම්භය තියෙන්නේ, ඊශ්‍රායලය කියන රටේ ඊශ්‍රායල් ජාතිකයන්ගේ හෙවත් යුදෙව් ජාතිකයන්ගේ යුදෙව් ආගම තුළයි. මේ ජනයාගේ භාෂාව වුනේ හීබෲ හෙවත් හෙබ්‍රෙව් භාෂාවයි. අපි මතක තියා ගන්න ඕන, ක්‍රිස්තියානි භක්තිකයන් අදහන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ හෙවත් සමස්ථ මනුෂ්‍ය වර්ගයාගේ ගැලවුම්කාරයාණන් වන දේව පුත්‍රයාණන් වහන්සේ, මනුෂ්‍යයකු විදියට මේ ලෝකයට ඉපදුණොත්, ඊශ්‍රායල් රටේ යුදෙව් ජාතිකයෙක් විදියට බව.

දැන් ඔය ටික හිතේ තියාගෙන අපි පාස්කුව පටන් ගත් තැනට යමු. මීට අවුරුදු දහස් ගණනකට පෙර සිට, ඊශ්‍රායල් ජාතිකයෝ විශ්වාස කළා ලෝකය මවලා පාලනය කරන, මහා බලසම්පන්න, සියල්ලම දන්නා, සෑම දෙයක්ම කරන්න පුලුවන්, සෑම තැනක ම වැඩ සිටින එක දෙවි කෙනෙකු, මුළු විශ්වයටම ඔබ්බෙන් වැඩසිටින බවත්, මුළු විශ්වයම පාලනය කරන්නේ මෙම දෙවියන් බවත්. ඒ වගේම ඔවුන් විශ්වාස කළා ඊශ්‍රායල් ජාතිකයන් වන තමන්, මේ දෙවියන් වහන්සේ විසින් විශේෂයෙන් තෝරාගත්, එකම ජාතිය බවත්.

අපි මේ කතා කරන මේ කාලය වන විට, මේ යුදෙව් ජාතිකයෝ තමන්ටම කියලා රටක් නැතුව, මිසරය හෙවත් ඊජිප්තුව කියන වෙනත් ජාතියකට අයිති රටක වහලුන් බවට පත්වෙලා, බොහොම කණගාටුදායක දුක්ඛිත තත්ත්වයක තමයි සිටියේ. මේ කාලයේදී දෙවියන් වහන්සේ, මේ යුදෙව් ජනතාවගේ නායකයා විදියට, ඔවුන් අතරෙන් ම මෝසෙස් නම් තැනැත්තා පත් කළා. දෙවියන්වහන්සේ මෝසෙස් තුළින් තම ජනතාවට කතා කළා. "මම ඔබට කිරියෙන් පැණියෙන් ඉතිරෙන අලුත් රටක් දෙනවා. දැන් ඒ රටට යන්න සූදානම් වෙන්න" කියලා.

නමුත් මිසරයේ පාරාවෝ රජ්ජුරුවෝ, මේ වහල් යුදෙව් ජනයාට මිසරයෙන් පිටත් වෙලා නිදහසේ යන්න ඉඩ දෙන්න කැමති වුනේ නෑ. මොකද මේ යුදෙව් වහලුන් ලවා තමයි, මිසරයේ ගොඩනැගිලි ඉදිකිරීම් ඇතුළු සියලුම අමාරු බර වැඩ කර ගත්තේ. ඔවුන්ට, හරියට කන්න බොන්නවත් දුන්නෙ නැතුවයි වැඩ ගත්තේ. ඉතින් මිසර මුලාදෑනීන් යටතේ කසපහර කමින් වහලුන් විදියට තමන් විඳින දුක් තව දුරටත් ඉවසා දරාගන්න බැරි වුනාම, මේ යුදෙව් ජනයා මහත් වේදනාවෙන් ඔවුන්ගේ දෙවියන් වහන්සේට මොර ගැසුවා. එවිට මේ දෙවියන් වහන්සේ මිසරයේ පාරාවෝ රජුගේ හා මිසර ජනයාගේ දරුණු සිත් වෙනස් කරමින්, යුදෙව් වහලුන්ට නිදහස ලබා දෙනු පිණිස මහා වසංගත නමයක් මිසරයට එව්වා. ඒ වසංගත ගැන තමයි පහත සඳහන් වෙන්නේ, ඉතා කෙටියෙන්.

1. මිසරයේ ගංගා, ඇල දොළ, වැව් පොකුණු සියල්ලේ ම ජලය, ලේවලට හැරවීම.
2. එහි ගංගා, ඇල දොළ, පොකුණුවලින් මැඩියෝ මතු වී, ඒ මැඩියෝ රජුගේ මාලිගාවට ද, යහන් ගබඩාවට ද, යහනට ද, නිලධාරීන්ගේ නිවාසවලට ද, සෙනඟ වෙතට ද, ආහාර භාජනවලට ද, සියල්ලන්ගේ ඇඟට ද, පනිමින් මිසර දේශය වසා ගැනීම.
3. මුළු මිසර දේශය පුරා ඇති දූවිල්ල, කිනිතුල්ලන් බවට හැරවීම හා එම කිනිතුල්ලෝ මිනිසුන් හා මෘගයන්ගේ ඇඟේ වසන කිනිතුල්ලන් බවට පත් වීම.
4. මැස්සන් රංචු පිටින්, රජු පිට ද, රජුගේ නිලධාරීන් හා ජනයා පිට ද, ගෙවල්වලටද පැමිණ, මිසර වාසීන්ගේ ගෙවල් ද, ඔවුන් සිටින භූමිය ද, මැසි රංචුවලින් පිරී යාම හා රට ද මැසි රංචු නිසා නාස්ති වීම.
5. මිසරයේ පශු සම්පත් වන, අසුන්ට හා කොටළුවන්ට ද, ඔටුවන්ට හා ගොනුන්ටද, බැටළුවන්ට ද, ඉතා බිහිසුණු වසංගතයකින් පහරදී මිසරයේ ගවසම්පත මුළුමනින් ම වැනසීම.
6. පාරාවෝ රජ බලා සිටිය දී, මෝසෙස් උඳුනින් අළු අහුරක් ගෙන ඒවා අහසට විසි කළ විට, ඒවා මුළු මිසර දේශය පුරා සිහින් ධූලි බවට පත් වී, මුළු මිසර දේශයේ සිටින මිනිසුන් හා සතුන්ගේ ශරීරවල වණ සහිත ගඩු ඇති කිරීම.
7. ඉතා දරුණු ගල් වර්ෂාවක් වැස, මුළු මිසර දේශයෙහි සිටින මිනිසුන් හා සතුන් ද කුඹුරුවල සෑම පැළෑටි ද මත එය වැටෙන්නට සැලැස්වීම. මෙලෙස ඉතා වේගවත් ලෙස ගල් වර්ෂා සමඟ විදුලි කෙටීම් ද ඇතිවූ අතර, ගල්වර්ෂාව, මුළු මිසර දේශය පුරා කුඹුරුවල සිටි සියලු මිනිසුන්ට හා සත්වයන්ට පහර දුන්නා.
8. පෙරදිගින් හැමූ සුළඟකින්, විශාල පළඟැටි රංචුවක් පැමිණ, මුළු මිසර දේශයට වැදී මුළු රට පුරා පැතිර යාම. උන් මුළු පොළෝ තලය ම වසාගත්තා. උන් පොළොවේ තිබූ පැළෑටි සියල්ලත්, ගල් වර්ෂාවෙන් බේරුණු ගස්වල ගෙඩි සියල්ලත් කාදැමුවා. මෙලෙස මිසර දේශය පුරා ගසක අමු කොළයක් වත්, කෙතක පැළෑටියක් වත් ඉතිරි වුනේ නැහැ.
9. මෝසෙස් අහස දෙසට තම අත දිගු කළ විට, තුන් දිනක් පුරා මුළු මිසර දේශයෙහි ඝනාන්ධකාරයක් ඇති වුනා. එවිට තුන් දිනක් පුරා, ඔවුන්ට එකිනෙකා නොපෙනී ගොස්, ඔව්හු සිටි තැන ම නොසෙල්වී සිටින්නට වුනා.

දෙවියන් වහන්සේ එවූ මේ එක් එක් වසංගත නිසා, පාරාවෝ රජු හා ඔහුගේ නිලධාරීන් ද, මිසර සෙනඟ ද කැළඹුණා. භීතියට පත් වුණා. එසේ භය වූ අවස්ථාවලදී යුදෙව් ජනතාවට නිදහස දෙන්න ඕන කියලා පාරාවෝ රජ ස්වල්ප මොහොතකට සිත් වෙනස් කර ගත්තත්, නැවත නැවතත් සිත දැඩි කරගෙන, යුදෙව්වන් නිදහස් වී යන්නට හඳන ගමන වැළැක්වූවා.

මේ විදියට මිසරයේ රජ්ජුරුවන් තමන්ගේ අණට කීකරු වෙන්නේම නැති බව දෙවියන් වහන්සේට පෙනුණාම, දෙවියන් වහන්සේ අවසාන වසංගතය එව්වා. ඒකතමයි දස වන වසංගතය හෙවත් කුලුදුලන් මරා දැමීම.

ඒ වසංගතයට අනුව සිහසුන් අරා සිටින පාරාවෝගේ කුලුඳුල් පුත්‍රයා පටන්, මිසර දේශයේ සිටින සියලු කුලුදුලන් මැරෙන්නට නියම වුණා. සතුන්ගේ කුලුඳුල් සතුන් ද මරණයට නියම වුණා. ඒක වුනේ මෙහෙමයි.

මෝසෙස් ඊශ්‍රායල් ජනතාවගේ ප්‍රජා මූලිකයන් කැඳවා, මෙහෙම උපදෙස් දුන්නා, "ඔබ ගොස් ඔබේ පවුල්වලට ප්‍රමාණ වන බැටළු පැටවෙකු බැගින් තෝරාගෙන, ඒ බැටළුවා මරන්න. ඉන්පසු හිසොප් කිනිත්තක් ගෙන බැටළුවාගේ ලේවල එය ගල්වා, උළුවස්සේ උඩ ලීයේ හා දෙපස කණු දෙකෙහි ඒ ලේ තවරන්න. උදය වන තෙක් ඔබගෙන් කිසිවෙකු තම ගෙයිදොරින් පිටතට නොයා යුතු ය. මන්ද, ඔබේ සමිඳාණන් වහන්සේ මිසරයට පහර දීමට දේශය මැදින් යන සේක. මෙසේ යද්දී උළුවස්සේ උඩලීයේ හා දෙපස කණුවල ලේ උන් වහන්සේ දකින විට, එම දොර පසුකොට ගොස් ඔබ මැරීමට, මාරක දූතයාට ඔබගේ ගෙවලට ඇතුළු වීමට ඉඩ නොදෙන සේක."

ඉන්පසු එදා මධ්‍යම රාත්‍රියේ දී සමිඳාණන් වහන්සේ, සිහසුන් අරා සිටි පාරාවෝ රජුගේ, කුලුදුලා පටන් සිරගෙයි සිටි සිරකරුවාගේ කුලුදුලා දක්වා, මිසර දේශයෙහි වසන කුලුඳුලන් සියල්ලන්ට සහ සත්වයන්ගේ කුලුඳුලන්ට පහර දුන් සේක. පාරාවෝ ද ඔහුගේ නිලධාරීහු ද මිසර වාසී සියල්ලෝ ද රාත්‍රියෙහි අවදි වුනා. මිසරයේ මහා අඳෝනාවක් ඇති වුනා, මළ අයෙකු නැති ගෙයක් තිබුනේ නැහැ.

මේ දස වන වසංගතයෙන් පසු පාරාවෝ රජ එම රාත්‍රියේ දී ම ඉශ්‍රායල් ජනයාට වහා මිසරයෙන් පිට වන ලෙසට බලකොට නියෝග කළා.

මේ වන විට ඊශ්‍රායල් ජනයා මිසර දේශයෙහි පදිංචි ව සිටි මුළු කාලය අවුරුදු හාරසිය තිහක් වී තිබුණා. මෙසේ අවුරුදු හාරසිය තිහක් අවසාන වූ දිනයෙහි ම, සියලු යුදෙව් ජනකාය මිසර දේශයෙන් නික්ම ගියා. දරුවන් හා ස්ත්‍රීන් හැර, පයින් ගිය පුරුෂයෝ ම හය ලක්ෂයක් පමණ සිටියා.

මේ විස්මය ජනක සිදුවීම අපි පාස්කුව වශයෙන් හඳුන්වමු. පාස්කුව යන වචනය හැදුණෙ හෙබ්‍රෙව් භාෂාවේ Pesach කියන වචනය අනුවය. (ඒ වචනයේ තේරුම

14 පිටුවට >>>



# බැටළුපෝතකයාණෝ

ගරු ඩී. ජී. ඩබ්ලිව්. ජයලත් දේවගැතිතුමා

නික්මයාම පොතෙහි 12:1 සිට මුල්ම පාස්කුව පිළිබඳව දැනුවත් කරන අතර දෙවන දිනය මංගල්‍යයක් ලෙස පවත්වන්න ඊශ්‍රායෙල් ජනයාට නියෝග කල සේක. එයට "පසු කර යාමේ මංගල්‍යය" ලෙස ද හදුන්වයි. පසුකර යන්නේ කවුද යන්න අප තේරුම් ගත යුතුයි. ස්වාමින්වහන්සේ මිසරවරුන්ට පහර දෙන පිණිස දේශය මැදින් වඩින අතර උන්වහන්සේ පඩි කඳේ උඩද, උළුවස්සේ කණු දෙකේ ද මරනු ලැබු බැටළුවාගේ ලේ ආලේප කර ඇති නිවස දකින කල එම දොරකඩ පසුකර යනු ඇත. ඊශ්‍රායෙල් ජනයාට පහර දෙන පිණිස විනාශකයාට ඇතුල්වීමට ඉඩ නොදෙන්නේ ද සමිදාණන් වහන්සේමය **(නික්මයාම 9:21-22)**. එම රාත්‍රියද සමිදාණන් වහන්සේ මිසර දේශය මැදින් වඩින සේක. එහි මිසර දේශයේ හි මනුෂ්‍යයන්ද සියළු සිව්පාවුන්ගේ ද, සියළු කුළුදුලන් මරණයට භාර දෙන සේක **(නික්මයාම 12:12)**. තවත් විශේෂ වන්නේ මිසරයේ සියළුම දෙවිවරුන්ට විරුද්ධව විනිශ්වයක් ඉටු කරන සේකැයි සමිදාණන් වහන්සේ පවසා තිබිමය **(නික්මයාම 12:12)**.

**පළමුව** - දේව උදහසින් ඊශ්‍රායෙල් ජනයාට ආරක්ෂාව ඒ බැටළු පැටළුවාගේ ලේ නිසා උදාවෙනු ඇත.

**දෙවනුව** - ඊශ්‍රායෙල් ජනයා දේව මගපෙන්වීම මධ්‍යයේ දේශයෙන් පිටත්ව ඔවුන්ට පවසා ඇති පොරොන්දු වූ දේශය බලා ගමන් කරනවා ඇත.

"එම දවසේ මිසරවරුන්ගේත් සතුන්ගේත් සියළු කුළුදුලන් මිය යනු ඇත. එසේම මිසරයේ අන්‍ය දෙවිවරුන්ට පහර දෙනු ඇතැයි" යනුවෙන් සදහන් වී ඇත. එදිනම ඊශ්‍රායෙල් ජනයා මිසරයේ වහල්භාවයෙන් මිදීම ලබා මිසරයෙන් පිටත් වීම සිදුවිය. නමුත් මින්පසුව එම සිදුවීම ඊශ්‍රායෙල්වරුන් අතර සෑම වසරකම සිහි කිරීමත් සිහිගැන්වීමත් සිදු කළ යුතු යැයි අනිවාර්ය කරනු ලැබ ඇත.

නමුත් නව ගිවිසුමක් පිහිටවා ජේසුස් වහන්සේ විසින් තම ජිවිතය පුද කරමින් සිදුකල මිදීම පරණ ගිවිසුමේ පාස්කුවට හා සමාන සිදුවීමක් යැයි සැලකිල්ලට ගත හැක.

### පළමු පිළිවෙල

1. මෙය දේව අනුග්‍රහය - සිහිකිරීමක් විය. ඒ වාර්තා කර ඇත්තේ නික්මයාම 12:1-13
2. ඒ යලි සිහිකිරීමෙන් දරුවන්ටත් මතු පරම්පරාවටත් දෙවියන් වහන්සේගේ දේව කරුණාව යළි සිහිගැන්වීම කරනු ලබයි.
3. මෙම සිද්ධිය ආරම්භ වූයේ නිවස තුල කල ඇදහිල්ලේ ක්‍රියාවන් රාශියක් මැදි කරගෙනය. නමුත් පසුව ඔවුන් ජාතියක් වශයෙන් ඒකරාශි වී ආගමික උත්සවයක්, සාමුහිකව කරන මංගල්‍යයක් (පාස්කු) ලෙස පැවැත් වූහ **(නික්මයාම 12:21-23)**.

### දෙවැනි පිළිවෙල

මිසරයේ වහල්භාවයෙන් මිදීම ලැබූ ඊශ්‍රායෙල්වරු සැමරූ පාස්කුව පසුකාලීනව ඊශ්‍රායෙල්වරුන් බැබිලෝනි විප්‍රවාසයෙන් පසුවද පැවැත්වූ බවද සඳහන් වේ. එය එසේ සිහි කලත් මිසරයෙන් රැගෙන ඒමට දෙවියන් වහන්සේ දිවැසිවර මෝසෙස් භාවිත කළ අතර බැබිලෝනි විප්‍රවාසයෙන් ඊශ්‍රායෙල් ජනයා මුදවා ගැනීමට තනිවම ක්‍රියා කලේ දෙවි සමිඳාණන් වහන්සේමය. විජාතික පර්සියන් අධිරාජ්‍යයා පොළඹවා ඊශ්‍රායෙල් ජනයා ඊශ්‍රායලයට ගෙන ඒමට කටයුතු සලසවනු ලැබූ දෙවියන් වහන්සේගේ උතුම් අනුග්‍රහය තවත් වරක් ඔවුන්ට දැනෙන්නට සලස්වනු ලැබුවේ මිදීමේ ක්‍රියාව සිදුවන්නේ මිනිසුන්ගේ දැහැමි ක්‍රියා වලින් නොව දෙවියන් වහන්සේගේම දයාව කරුණා අනුග්‍රහය යටතේ වටහා දීමට යැයි විද්‍යමාන වේ. කෙසේ නමුත් එය එස්රාගේ කාලයේ දී **(එස්රා 6:19-22)** එම පාස්කුව සැමරීම මගින් ඔවුන් දෙවියන් වහන්සේගේ මිදීමේ ක්‍රියාවලිය සිහි කල අතර එයට අමතර කාරණාවක් ද හේතු විය. එය දෙවියන් වහන්සේගේ දේව මාළිගාව ගොඩ නැංවීමට ඔවුන්ව දිරිගැන්වීමට සිරියාවේ රජුගේ සිත ඔවුන්ට ප්‍රිය මනාප ලෙස වෙනස් කර දීමෙන් දැක්වූ දේව ප්‍රේමය දැක්විමෙන් දෙවියන් වහන්සේ ඉශ්‍රයෙල්වරුන්ව ප්‍රීතියෙන් පිනවූ සේක **(එස්රා 6:22)**. පාස්කුව සමගින් මුහුන් නොදැමූ රොටි මංගල්‍යය දින හතක් තිස්සේ පැවැතුණ අතර තවද ජාතීන්ගේ අපිරිසිදුකමින් වෙන් වී ඊශ්‍රායෙල්වරුන් සමඟ එකතුවූ සියල්ලන් ද පාස්කුව සැමැරූ අතර පූජකයන්ද ලෙවීවරුන් ද එක්කෙනෙකුවත් නෑර සියලුදෙනාම පිරිසිදුවී සිටීමද වැදගත් ලෙසද, විප්‍රවාසීව ආ අය අතර විශේෂ වූ කාරණාවක් ලෙසින් ද දැකිය හැකිය.

### තුන්වැනි පිළිවෙල

මාර්ක් 15:6 - පාස්කු මංග්‍යයේදී සෙනඟ ඉල්ලා සිටි සිරකරුවෙකු නිදහස් කර දීමට පිලාත්ගේ සිරිත කරගෙන සිට ඇත. **(මතෙව් 28:15/ ලූක් 23:16-17)**

"යේසුස්වහන්සේ මරණීය දණ්ඩනයට සුදුසු කිසිවක් කරනැත" කියා පිලාත් කියු අතර "එබැවින් මම ඔහුට තලා නිදහස් කොට හරිමි යැයි කීය." එසේ කීවේ පාස්කු මංගල්‍යයේ දී "එක මිනිසෙකු නිදහස් කර දීමට ඔහු බැදී සිටි බැවින්" යනුවෙන් සදහන් වේ. ඊශ්‍රායෙල් වරුන්ගේ වහල්භාවයෙන් මිදීමේ ක්‍රියාව සිහිකරන පාස්කුව තවත් ඉදිරියට ගොස් සිරකරුවෙකුට මිදීම ගෙන දෙන සිදුවීමක් දක්වා එය ගෙන එන්නේ රෝමයන් විසින් එකතුකල ක්‍රියාවන් සමඟිනි.

### හතරවැනි පිළිවෙල

තවද ක්‍රිස්තුස් වහන්සේ පාස්කු දින එම සිදුවීම සිහිකර රොටි කඩා ඔබ උදෙසා දෙන මාගේ ශරීරය මා සිහිකරන පිණිස මෙය කරන්නැයි වදාළ සේක **(1 කොරින්ති 1:24)**. එලෙසම රාත්‍රි කෑමෙන් පසු කුසලාන ද රැගෙන මේ කුසලාන මාගේ රුධිරයෙන් පිහිටුවන නව ගිවිසුමය. යම් පමණ දෙනෙක් මා සිහිකරන පිණිස මෙය කරන්නැයි වදාළ සේක **(1 කොරින්ති 11:25-26)**. රොටි අනුභව කිරීමත් කුසලානෙන් පානය කරන්නේ ද එපමණ වර උන්වහන්සේ වඩිනතුරු ඔබ උන්වහන්සේගේ මරණය ප්‍රකාශ කරන්නහුය යැයි පාවුළුතුමා ප්‍රකාශ කර සිටියි.

පාස්කු බැටළුවාගේ පූජාව සිහිකිරීම වාර්ෂික සිද්ධියක් වූවද ක්‍රිස්තුස් වහන්සේගේ මරණය ද උන්වහන්සේගේ ලේ යාගයද දුක්විඳීම ද ක්‍රිස්තුස් වහන්සේ යළි වඩිනතුරු කළ යුතු යැයි ප්‍රකාශ කරන අතර කිතුණුවන්ගේ පාස්කුව වන්නේ උන්වහන්සේගේ නැවත නැගිටීම සිහිකිරීම වූවත් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රීතිය වන්නේ උන්වහන්සේගේ මංගල්‍යය දිනයේදී උන්වහන්සේගේ සන්තක අය (මනාලිය) සමඟ කුසලානය සහභාගී කරවීමත් සංග්‍රහයට සහභාගී වී ප්‍රීතිවීමත්ය. උන්වහ්නසේගේ ගෝලයන්ට මිදි කුසලානය බොන්න දුන්නත් උන්වහන්සේ එම කුසලානයෙන් නොබී සිටියහ. එය බොන දිනය උන්වහන්සේ ප්‍රකාශ කරනු ලැබූ විස්තරය (ලූක් 22:14-18) දක්වා සදහන් වි ඇත.

තමන්වහන්සේ ගෝලයන් සමඟ කුසලානෙන් පානය කරන්න ආසාවෙන් සිටි නමුත් දෙවියන් වහන්සේගේ රාජ්‍යයේදී එය මුදුන් පමුණුවනු තුරු මම එය තවත් නොවළඳමියි කියා සිටි සේක **(ලූක් 22:14-18)**. **(එළිදරව් 3: 20, 19:6-9)** එසේම තමන්ගේ මරණය පාස්කුවේදී එදින "මරනු ලබන" බැටලුවා තමන්වහන්සේම යැයි ප්‍රකාශ කල සේක. ක්‍රිස්තු භක්තිකයන් වන්නේ ක්‍රිස්තුස් වහන්සේ නැමති බැටළු පෝතකයාගේ ලෙයින් පවිත්‍ර වුනු අය ය **(1 ජේදුරු 1:18-19)**. එය පරණ ගිවිසුමේ ගිවිසුමකට කීකරු වීමට එකඟ වූ ජනයා මත ඉසිනු ලැබූ ලෙයට සමාන වූ ලෙය ලෙසින්ද ජේදුරු තුමා ප්‍රකාශ කර ඇත **(1 ජේදුරු 1:2)**.

එස්රාගේ කාලයේදි පැවැත් වූ පාස්කුව ප්‍රීතිමත් සහභාගිකමක් වුනේ විප්‍රවාසී අයට දේව මාළිගාව සෑදීමට උපකාරවීම හා විප්‍රවාසීන්ව යළි දේශයට ගෙන ඒමේ මිදීමේ ක්‍රියාව කල දෙවියන් වහන්සේම නිසා යැයි සෙනග සැලකූ නිසාය. එසේම මෙම මංගල්‍යය ක්‍රිස්තුස් වහන්සේට අනුව මනුෂ්‍ය සංහතියේ මිදීම වන මරණින් මතු ජීවනය ලැබූ අයට දෙවියන්වහන්සේ විසින් පවත්වනු ලැබූ ප්‍රීතියේ මංගල්‍යය භෝජනයක් මත ඇති බවයි. එදාම ක්‍රිස්තුස් වහන්සේ සිදුකල මිදීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වීමේ ප්‍රීතියේ සහභාගිකමක් වේ. එයට සහභාගි වන්න ක්‍රිස්තුස් වහන්සේම බලා සිටින බව පවසා ඇත **(ලූක් 22:15-18)**.

එළිදරව් 19:5-9, එහිදී දෙවියන් වහන්සේට ලොකු කුඩා සියල්ලන් නමස්කාර කරන අතර, සමිඳාණන් වහන්සේ රජකම් කරන සේක. ඒ නිසා අපි අතිශයින් ප්‍රීති වෙමු. උන්වහන්සේට ගෞරවය පිරි නමමු. මන්ද බැටළු පෝතකයානන්ගේ සරණ මංගල්‍යය පැමිණ ඇත. අපගේ රටේ පාස්කු ප්‍රහාරය ලෙස සලකනු ලැබූ මරාගෙන මැරෙන මිනිසුන් කිහිප දෙනෙකු විසින් කරනු ලැබූ මිලේච්ච ක්‍රියාවද ශ්‍රී ලාංකික අපට අමතක කල නොහැකිය.

මෑතකදී එවකට රටේ ජනාධිපතිතුමා ලෙස ක්‍රියාකල රටේ පාලකතුමා සමස්ථ කිතුනු ප්‍රජාවෙන්ද, ජීවිත නැතිවුන පවුල්වලින්ද, තුවාල ලැබූව සැමගෙන්ද ඔහු දන්න ආකාරයට සමාව ඉල්ලා සිටියේය. හිටපු ජනාධිපතිතුමා ද බයිබලය කියවන බව එදින ප්‍රකාශ කළ සිටියේය. මට මතක හැටියට ප්‍රහාරය සිදුවී දින කිහිපයකට පසුව මාධ්‍ය සාකච්ඡාවක් මගින් වරද කල අයට සමාව දී පාස්කුවේ අරුත සිහිකල අතර, එකල අපරට තුල ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය දිගහැරීම

16 පිටුවට >>>



> ඒ ඓතිහාසික නඩු තීන්දුව සාපරාධී බව, අයුතුසහගත බව, එදත් අදත් අපි දනිමු. එහෙත් එයට වගකිවයුත්තන් සොයා දඬුවම් කිරීමට අප අපොහොසත් වී ඇත. එදත් අදත් ඒ දූෂිත අධම පාලකයෝ නිදැල්ලේ හැසිරෙමින් සිටී. ඔවුන්ට නීතිය වග නැත. නීතියේ පාලනය ද ඔවුන්ගේ වාසියට මිස සත්‍ය යුක්තිය සඳහා නොවන බව දන්නෝ දනිති. යුක්තියේ දෙවඟන නිහඬ ය. හොරුන් ඔවුන්ගේ ය, නඩුත් ඔවුන්ගේ ය, බඩුත් ඔවුන්ගේ ය. එදත් අදත් පීඩිතයා එතැනම ය.

# ඔහු නිදොස් කොට නිදහස්

## එය ජනතා සේවය පිණිසමයි...

ලාල් පුෂ්පදේව ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා

"මල් වෙඩි වර්ෂා ජනතා අත්පොළොසන් මැද පූර්ණ රාජ්‍ය අනුග්‍රහය සමග බහුතරයකගේ ජනතා ආශිර්වාදයෙන් බරබ්බාස් නිදොස් කොට නිදහස් ය. එය ජනතා පරමාධිපත්‍යයේ අති දැවැන්ත විජයග්‍රහණයක් බව දෙස් විදෙස් සියලු ම ජනමාධ්‍ය ආයතන පුන පුනා වාර්තා කරයි. එකී දෙස් විදෙස් සියලු වාර්තා බිඳිමින් අති දැවැන්ත ජන වරමින් නිදොස් කොට නිදහස් කිරීම සියලුම මුද්‍රිත මාධ්‍ය, ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයන් මෙන් ම සියලු සමාජ මාධ්‍ය තුල ද එකී ඓතිහාසික තීන්දුව දකිනුයේ වසර ගණනාවකට පසු ජනතාව ලද අති සුවිශාල ජයග්‍රහණයක් ලෙස ය. දෙස් විදෙස් මාධ්‍ය විචාරකයන් මෙන් ම ජාත්‍යන්තර දේශපාලන වියතුන් එකී ඓතිහාසික නිදොස් කොට නිදහස් තීන්දුව දකිනුයේ ලෝක දේශපාලනයේ ප්‍රබල හැරවුම් ලක්ෂයක් ලෙස ය. එයට දිවයිනේ සියලු මාධ්‍ය මෙන් ම සියලුම ජාත්‍යන්තර මාධ්‍ය ආයතන ද දැවැන්ත මාධ්‍ය ආවරණයක් ලබා දී ඇත."

මේ ප්‍රවෘත්තිය ඇසුනු සැනින් මාගේ සිතුවිලි ධාරාව ගලා ගියේ මීට වසර දෙදහසකට ඉහත සිදු වූ ඒ අමානුෂික ඒකපාක්ෂික නඩු තීන්දුවටය. එය සැබැවින්ම අහිංසක, නිර්දෝෂි, අවංක මනුෂ්‍යයෙකුට එරෙහි ව අමු අමුවේ සිදු කරන ලද මහා සාපරාධී, අශෝභන, අධර්මිෂ්ඨ තීරණයකි. එම අසාධාරණ තීන්දුව ආණ්ඩුකාරවරයා දුන්නේ නැත. ඒ සඳහා ඔහුව තල්ලු කලේ ය. හුදෙක් තම තමන්ගේ සුඛවිහරණයටත්, සමාජ දේශපාලන සහ ආගමික ව්‍යුහයන් තුල දූෂිත ක්‍රම යාන්ත්‍රණය දෙදරා යෑම වැළැක්වීම සඳහාත් එහි දූෂිත පාලකයන්ගේ පැවැත්ම පුපුරා යෑම වැළැක්වීම සඳහාත් එකී නිර්දෝෂී මිනිසාගේ ඝාතනය සාධාරණීකරණය කිරීමට තරම් ඔවුන්ගේ සිත් කෘෘර අධම වන්නට විය.

එදත්, අදත්,හෙටත් අපි ඇසූ ප්‍රශ්නය වනුයේ "දුෂ්ඨ ජුදයන් විසින් ජේසුස් වහන්සේව ඝාතනය කරන ලද්දේ මන්ද?" කියා ය.

එදත්, අදත්, හෙටත් ලෝක ඉතිහාසය පුරාමත් මිනිසා සිදු කර ඇත්තේ සුපුරුදු බෝලය පාස් කිරීම පමණ ය.

ඒ ඓතිහාසික නඩු තීන්දුව සාපරාධී බව, අයුතුසහගත බව, එදත් අදත් අපි දනිමු. එහෙත් එයට වගකිවයුත්තන් සොයා දඬුවම් කිරීමට අප අපොහොසත් වී ඇත. එදත් අදත් ඒ දූෂිත අධම පාලකයෝ නිදැල්ලේ හැසිරෙමින් සිටී. ඔවුන්ට නීතිය වග නැත. නීතියේ පාලනය ද ඔවුන්ගේ වාසියට මිස සත්‍ය යුක්තිය සඳහා නොවන බව දන්නෝ දනිති. යුක්තියේ දෙවඟන නිහඬ ය. හොරුන් ඔවුන්ගේ ය, නඩුත් ඔවුන්ගේ ය, බඩුත් ඔවුන්ගේ ය. එදත් අදත් පීඩිතයා එතැනම ය.

බරබ්බාස් කැඳෙව්වේ ජේසුස් වහන්සේව නිදහස් කරන්නට ය. ඒත් සිදුවූයේ සත්‍ය කුරුසයටත්, අසත්‍ය කිරුළටත් යාම නොවේ ද? හොරු අල්ලන්නට කියා ජනතා පරමාධිපත්‍යය උගසට තියා ගෙනාපු ආණ්ඩු කවදාවත් හොරු ඇල්ලුවේ නැත. සිදු වූයේ හොරු විසින් ආණ්ඩුව ඇල්ලීම නොවේ ද? එදත්, අදත් බලකාමී පිලාත්ලාගෙන් යහපතක් සිදුවේද ? බල තන්හාවෙන් මත් වූ පිලාත්, ජේසුස් වහන්සේගේ නිර්දෝෂී බව, නිහඬව ඔවුනගේ යථා රූපය ලෝකයට නිර්වස්ත්‍ර කරනු පමණක් නොව ඔවුන්ගේ පාපිෂ්ඨ දුෂිත ක්‍රියාවන් අභියෝග වන්නට පටන් ගැණිනි. පිලාත් අවසානයේ ජනතා පරමාධිපත්‍ය මුවාවෙන් තම අත වැරැද්දක් නොමැති බව පෙන්වීමට කරන බියගුළු උත්සාහය කොයිතරම් නම් අශෝභන සහගතද? කපටි කෛරාටික ද? අවසානයේ දී සිදු වූයේ කුමක් ද? ජනතාවගේ ඒකමතික තීරණය උඩ නිර්දෝෂ වූ පුද්ගලයෙකු කුරුසියට යැවීමට පිලාත් තීන්දුව දීමය. ඔහුගේ ක්‍රියාව සාධාරණීකරණය කරමින් තමන් එම තීන්දුවට වග නොකියන බව සනාථ කරමින් ජල බඳුනකින් අත් සේදීම කොයි තරම් හාස්‍ය ජනකද?

ඒ සියල්ල සිදුවී හමාර ය. එහෙත් පිලාත්ලා නම් අඩුවක් නොමැත. පිලාත්ලාගේ ස්වරූපයෙන් පැමිණෙන විනිශ්චයකාරයෝ ද එමට ය. අද ඔවුන්ගේ භූමිකාව මහ දවල් එළිපිට ම රඟ දක්වමින් සිටිති. අවසානයේ වංචනික පිලාත්ලා ද එකී සාපරාධී නඩු තීන්දුවට උඩගෙඩි දුන් ජුදා පූජක පැලැන්තිය මෙන් ම දූෂිත වූ පාලකයින් ද තම තමන්ගේ වස්ත්‍ර ඉරා ගනිමින් එකී පාපය තමන් පිට පවරා ගනිමින් කළ කූඨ රඟපෑම අවසානය. ඒ අමානුෂික වූ දූෂිත නඩු තීන්දුවේ ප්‍රතිඵල ජනතාව පිට තබා අත සෝදාගන්නට තරම් වංචනික ය. එදා මෙන් ම අදත් සිදුවනුයේ ඒ නස්පැත්තිය ම නොවේ ද? අවසානයේ සියල්ල ජනතාවගේ කරපිටම පැටවෙන දූෂිත ක්‍රමවේදයක සාපය නොවේ ද? අදටත් අපි ගෙවනුයේ. වංචනික පිලාත්ලාගේ වෙස් ගනිමින් ජනතා ගරු බුහුමන් මැද වැඩ සිටින විනිශ්චයකාරවරු, ආණ්ඩුකාරවරු කේන්ද්‍ර වෙමින් එක් පැත්තක නිර්දෝෂී ජේසුස් වහන්සේලාත් අනිත් පැත්තේ මිනීමරු මංකොල්ලකාර තක්කඩි බරබ්බාස්ලාත් ජනතාව ඉදිරියට ගෙනෙයි. වාංචනික පිලාත් දැන දැන ම තවත් සොරෙකුට තවත් මංකොල්ලකරුවෙකුට තවත් ස්ත්‍රී දූෂකයෙකුට තවත් මිනීමරුවෙකුට අත උස්සන්නට ජනතාවට කියද්දී තම බලය රැක ගන්ට තම පූජක පැලැන්තිය ආරක්ෂා කරන්නට නිර්දෝෂීකයකු කුරුසියට යන්ට ජනතාව පොළඹවා ගැනීම එදත් සිදුවිය. අදටත් හරි අපූරුවට සංස්කරණය කරන ලද ටෙලි නාට්‍යයක තිර පිටපත් අනුව සිදුවෙයි. එකී නාටක වල අධ්‍යක්ෂකයෝ ද තිර පිටපත් කරුවෝ ද රඟන්නෝ ද එකී නොකී පාත්‍ර වර්ගයා ද අඩු වැඩි වශයෙන් නාට්‍යයේ ප්‍රතිපාදන භුක්ති විඳිනුයේ කිඹුලෙකු විසින් කුණු වූ මළ කුණක් රස කරමින් කන්නා සේ ය. ඔබත් මමත් එකී නාට්‍යයේ වෘත්තීමය පාත්‍ර වර්ගයෝ ය. පාලකයා මෙන් ම පාලිතයා ද දූෂිත ය. වංචනික ය. එක් පැත්තකින් ජේසුස් වහන්සේ ය. අනිත් පැත්තේ බරබ්බාස් ය. එක් පැත්තකින් සත්‍යය ය. අනිත් පැත්තෙන් අසත්‍ය ය. එක් පැත්තකින් යුක්තිය ය. අනික් පැත්තෙන් අයුක්තිය ය. එක් පැත්තකින් ප්‍රේමය ය. අනිත් පැත්තෙන් වෛරය ය.

විනිශ්චය ආසනයේ සිටින්නාගේ කාර්ය භාරය නියත ය ස්ථිර ය...

ඈවරයි...., දෑවරයි...., තුන් ඈවරයි.... තීන්දුයි. අවසානයේ එය ද බැර වනුයේ ඔවුන් විසින් ම දෙන අන්තෝ ජටා බහි ජටා වන් වූ ජනතා සේවය පිණිසයි යන වගන්තියෙන් ම ය.

ඔබත් මමත් එකී දූෂිත තීන්දු තීරණවලට පංගුකාරයෝ වී හමාර ය. නඩුත් හොරුන්ගේ බඩුත් හොරුන්ගේ කියමන් සනාථ කරමිනි.

ජේසුස් වහන්සේ අදටත් නිර්දෝෂී ය. නිහඬ ය. බරබ්බාස්ලාගේ හර බර ශබ්ද ඝෝෂා පිරුණු අයහපත් මාර්ගයාව ය. තීන්දු ව ඔබත් මගෙත් අතේ ය.

එක් පැත්තකින් සත්‍ය, යුක්තිය, යහපත ය. අනෙක් පැත්තෙන් අසත්‍ය, අයුක්තිය, අයහපත ය.

"අපිට ජේසුව එපා, අපිට බරබ්බාස් ව දීපන්". "අපට සත්‍ය එපා, අපිට අසත්‍ය දීපන්"

16 පිටුවට >>>



# පිපාස වෙමි

**එම්. වින්සන් පින්තු**

සමාරියේ සිකාර් නගරයේ පිහිටි ජාකොබ්ගේ ලිඳ වෙත දිය ගෙන යාම සඳහා පැමිණි කාන්තාවකි. ගැඹුරු කල්පනාවක නිමග්න වෙමින් පැමිණි ඇය දිය ගෙන යාම සඳහා ගෙන ආ භාජනය පසෙකින් තබා අවට බැලුවාය. තමන් දෙස මහත් ඕනෑකමකින් බලා සිටින තරුණයකු ඇය දුටුවේ එවිටය. ලිඳ අසල පිහිටි පැතලි ගලක වාඩි වී සිටි මෙම කඩවසම් තරුණයා ජුදෙව් ජාතිකයෙකු බව ඕ එක් වරම හඳුනා ගත්තාය. ජුදෙව්වන් හා සමාරිය ජාතිකයන් අතර සුහදතාවයක් නොවූ බැවින් ඔහුව මඟහැර සිටීමට ඇය උත්සාහ කලත් ඒ සඳහා හිත එකඟ කර ගැනීමට ඇයට නොහැකි විය. මන්ද ඒ බැල්ම තුළ සුහදතාවයක් සඳහා වූ ආරාධනයක් ගැබ්ව තිබූ බැවිනි.

"සොයුරිය මට පිපාසයි, දිය පොදක් දිය හැකිද?"

නිහඬතාවය බිඳිමින් අමුත්තා කළ ආමන්ත්‍රණය ඇයට අස්වැසිල්ලක් විය.

"මහතාණනි, මා සමාරිය ස්ත්‍රියකි. ඔබ ජුදෙව් ජාතිකයෙක් බව පෙනේ. එබැවින් අප අතර ගනුදෙනුවක් විය නොහැකිය."

"සොයුරිය, එය මට අදාල නැත. මා ඔබ දුටුවේ ස්ත්‍රියක් ලෙස පමණි. අප ජාතීන් දෙකකට අයත් බව පවසන්නේ ඔබමය. හැරත් පිපාසය ඔබටත් මටත් පොදු ධර්මතාවයකි."

"මා එලෙස පැවසුවාට සමාවන්න. ඔබ ලඟ දිය බීම සඳහා බඳුනක් නොමැති බැවින් ඔබගේ දෑත් එක්කරන්න. එසේ වූ විට ජලය ඔබ දෝතට වත්කළ හැකිය."

අමුත්තා දෝත එක් කළ පසු ඇය තම බඳුනින් ඔහුගේ දෝතට ජලය වත්කළේ එය පිරී ඉතිරී යන පරිද්දෙනි. අමුත්තා ඇති තරම් ජලය පානය කරනු දැක ඇය තුළ සතුටක් ඇති විය.

"මහතාණනි, ඔබගේ පවස සන්සිඳුනේද?

එසේය. ජලය සඳහා වූ පවස සන්සිඳුනි.

ජලය හැර වෙනත් දේ ගැන පිපාස ඇති වන්නේද?"

"එසේය. මිනිසුන් තුළ බොහෝ පිපාසාවන් ඇත. ඒ බොහොමයක් ලෞකික ආශාවන් සඳහාය. ඔබද එවන් වූ පිපාසයකින් පෙළෙන්නියක බව දනිමි."

"මහතාණනි, ඔබට එවන් පිපාසාවන් නොමැතිද?"

"ඇත. මා මෙලොවට ආ කාරණා සපුරා ගැනීමේ පිපාසයක් ඇත. මිනිසුන්ට සත්‍ය වටහා දීමේ පිපාසයක් ඇත. අවසානයේ මගේ පියාණන් වෙත නැවත යාමේ පිපාසයක් ද මට ඇත."

"ඔබ පවසන දේ වටහා ගැනීම අසීරුය. එවන් වූ පිපාසයක් සන්සිඳුවා ගැනීමට මෙම ජලයෙන් හැකි ද?"

"නැත. එහෙත් මා සතුව ජීවන ජලය ඇත. එය පාලනය කරන්නාට කිසිදින පිපාස ඇති නොවේ. මා කවරකුදැයි ඔබ දන්නේ නම් ඔබ මගෙන් එම ජලය ඉල්ලා සිටිනු ඇත."

"මහතාණෙනි, එය කොතරම් යහපත්ද, බීමට ජලය සොයා  අපගේ ආදි පියා වු ජාකොබ්තුමා අපට දුන් මේ ලිඳ වෙත දිනකට කිහිපවතාවක් පැමිණීමට මට සිදු වේ. කිසිදා පිපාස නොවන ජලයක් ඇත්නම් එය මටද ලබා දෙන්න. සොයුරිය මා සතුව ඇති ජීවන ජලය අපගේ ශාරීරික පිපාසය සන්සිඳවීම සඳහා වූවක් නොවේ."

"එසේ නම් එය කුමක්ද? මායාවක්ද?"

"නැත. එය මායාවක් නොවේ. එය ජීවනය දෙන දේව වචනයයි. එය අදහාගන්නාට තම ලෞකික පිපාසාවන්ගෙන් බැහැර විය හැකිය."

"එය අපැහැදිලිය. තවදුරටත් තේරුම් කර දිය හැකිද? සොයුරිය පානය සඳහා මගේ දෝතට ඔබ බොහෝ ජලය වත්කළා නොවේද?"

"එසේය, පිරී ඉතිරී යන තරම් වත්කළෙමි.

එසේය, ඉතිරී ගිය ජලයට කුමක් වීද?"

"ඒවා මහ පොළොව විසින් උරා ගනු ඇත."

"ඉන් පසුව,"

"ඉන් පසු පොළොවේ වැවෙන පැලෑටි ඉන් පෝෂණයක් ලබාගනු ඇත."

"ඉන් පසුව,"

"ඒවා නව ජීවයක් ලබා සරුසාරව වැඩී එල දරණු ඇත. සොයුරිය මා සතුව ඇත්තේද එවන් ජීවන ජලයකි. මගේ වචනය අදහාගෙන ඒ අනුව ජීවත්වන තැනැත්තා බොහෝ එල දරණු ඇත."

"මහත්මයාණනි, මා ඔබ තේරුම් ගැනීමට උත්සාහ දරමි."

"එය හොඳය. ඔබගේ සැමියාවද මෙහි එක්කර ගෙන ආවේ නම් ඔහුටද මේවා පැහැදිලි කළ හැකිය."

තමන් පැවසූ ඒ වදන් වලින් කාන්තාව විළියට පත්වනු අමුත්තාට දැනුනි. පිළිතුරක් සොයා ගැනීමට ඇය වෙහෙස වනුද ඔහුට පෙනුනි.

"මහතාණනි, මට සැමියෙක් නැත."

"ඔබ කීවා හරිය. ඔබ පුරුෂයින් පස්දෙනෙකු සමඟ ජීවත්වී ඇත. දැන් ඔබ සමඟ සිටින තැනැත්තා ද ඔබේ ස්වාමි පුරුෂයා නොවේ. පුරුෂයින් පිළිබඳව වූ ඔබගේ පිපාසයද සන්සිඳී නොමැති බව පෙනේ. එසේය. ලෞකික දේ ගැන වූ පිපාසාවන්ගෙන් තෘප්තිමත් වන කිසිවෙක් නැත."

අමුත්තා පැවසූ දෙයින් ඈ වික්ෂිප්ත වුවාය.

"මහතාණනි, මේ දේවල් පවසන ඔබ දිවැසිවරයෙක්ද? ආගන්තුකයකු වු ඔබ මා පිළිබඳ සියල්ල දන්නේ කෙසේද?"

"මම දිවැසිවරයකු නොවෙමි."

"එසේ නම් ඔබ කවුරුන්ද? අපගේ පියවරු මේ කන්දේදී දෙවියන්ට නමස්කර කළහ. ක්‍රිස්තුස් නම් මෙසියස් වරයෙකු ගැන ඔවුන් බලාපොරොත්තුව සිටි බව දනිමි."

"ඒ ක්‍රිස්තුස් නම් මමය."

අමුත්තාගේ පිළිතුරෙන් අන්ද මන්ද වු සමාරිය ස්ත්‍රිය ඔහු පා මුල වැටී හිඳගත්තාය.

"ගුරු දේවයිනි මට සමාවන්න. මා මහත් කාලකන්නි පවුකාර ස්ත්‍රියකි. මා හද සුවපත් කරන ඔබගේ වදන් අසනු රිසියෙන් ඔබ හා මෙතෙක් දුර කතා කළෙමි. දැන් නම් ජීවන ජලය ඇත්තේ ඔබ ලඟ බව මම අදහමි. මා අත්විඳි මහත් අසිරිය මගේ නෑ හිතවතුන්ට පවසා ඔවුන්වද මෙහි කැඳවා එන්නට මට අවසර දෙන්න."

"යන්න ස්ත්‍රිය. ඔබ ඔබේ පිරිසද කැටුව නැවත එන තුරු මා මේ නගරයේ රැඳී සිටින බව ඔවුනට දන්වන්න."

කපාල පිටිය අවට මහ සෙනගක් රැස්ව සිටියේ පිලාත් විසින් මරණයට නියම කරනු ලැබූ ජේසුස් ක්‍රිස්තුන්ගේ අවසන් මොහොත දැකගනු සඳහාය. එතුමන්ගේ කුරුස ගමනේදී පසුපසින් ආ ජනයාගෙන් කොටසක් ද එහි විය. ඒ අතර කුරුස ගමන පුරාම වරෙක සැඟවෙමින්ද වරෙක මතු වෙමින්ද පැමිණි සමාරිය ස්ත්‍රියක්ද වුවාය. සඟවා ගැනීමට වෙහෙස දරණ වේදනාකාරී හැඟීම් සටහන් වූ විඩාවට පත් මුහුණක් සතුවිය. කුරුස පත්ව සිටින මේ මහා පුරුෂයා දෙසට යොමුව තිබූ ඇයගේ ඇස් විටින් විට කුරුස ගස පාමුල සිටින කාන්තාවන් තිදෙනෙකු හා එක් පුරුෂයෙකු වෙතද යොමු විය. ඒ පුරුෂයා තමා එදින ජේසුස් ක්‍රිස්තුන් වෙතින් සමුගන්නා විට එතුමන් සොයා ආ ගෝල පිරිසෙන් එක් අයකු බව ඇය හඳුනා ගත්තාය. එතැන සිටි එක් කාන්තාවක් එතුමන්ගේ මව විය යුතු යැයි ඈ අනුමාන කළාය. වාවාගත නොහැකි දුකක් හදවතේ දරාගෙන එම දුක තම මුහුණින් පිට නොකිරීමට යත්න දරණ ඒ කාන්තාව සැබැවින්ම එතුමන්ගේ මව විය යුතු යැයි ඇය සිතා ගත්තාය.

නැවත ඇයගේ අවධානය කුරුස පත් මිනිසා වෙත යොමු විය. දුවිල්ලෙන් දහදියෙන් හා ලෙයින් විරූපව

16 පිටුවට >>>

## පාස්කුව කියන්නේ මොකක් ද?

10 පිටුවෙන් >>>

(පසුකර යනවා) කියන අදහසයි. ඒ වචනයේ ඉංග්‍රීසි තේරුම Passover යන්නයි) ඒකෙන් කියවෙන්නේ, මරණයේ දේවදූතයා එදා බැටලු ලේ ගල්වා ලකුණු කර තිබූ, යුදෙව් ජාතිකයන්ගේ ගෙවල් පසුකර යමින් මිසර ජාතිකයන්ගේ ගෙවල්වල සිටි, කුළුදුලන් මරා දැමූ බවයි. එම නිසා යුදෙව් ජාතිකයන් ඒ බැටළුවා පාස්කු බැටළුවා ලෙස හඳුන්වන්නට පටන් ගත්තා.

එදා සිට අද දක්වා යුදෙව් ජාතිකයන් මේ සිද්ධිය පාස්කු උත්සවය නමින් සිහිපත් කරනවා.

එදා ඒ සිද්ධියෙන් පසු මිසරයේ පාරවෝ රජු යුදෙව්වන්ගේ දෙවියන් වහන්සේට භය වී, යුදෙව් ජනයා සියලු දෙනාටම නිදහස දී මිසරයෙන් පිටත් ව යන්නට අවසර දුන්නා. ඒ විදිහට නිදහස් වෙලා ගිය යුදෙව් ජනයාගෙන් තමයි, ඊශ්‍රායලය කියන රටේ මූලාරම්භය ඇති වුනේ. ඒ රට තමයි දෙවියන් වහන්සේ ඔවුන්ට දෙන්නට පොරොන්දු දූ කිරියෙන් පැණියෙන් උතුරන රට. ඒක දෙවියන් වහන්සේ තම ජනතාවට දෙන්නට පොරොන්දු වූ රට නිසා, ඒ රටට පොරොන්දු දේශය කියලත් කියනවා.

මේ පාස්කු සිද්ධිය සිදු වී අවුරුදු දහස් ගාණකට පසු දේව පුත්‍රයාණන් වහන්සේ, යේසුස් යන නමින් මනුෂ්‍යයෙකු විදියට ඊශ්‍රායලයේ යුදෙව් ජනතාව අතරම ඉපදුණා. ඊට පසු යුදෙව් ජනයා පමණක් නොව, මුළු ලෝකයේම සමස්ත මනුෂ්‍යය වර්ගයාම, ඔවුන්ගේ පව්වලින් හා එම පාපයේ විපාකය වන දේව උදහසින් හා සදාකාලික මරණය හෙවත් නිරයෙන් ගලවා ගැනීම පිණිස, මේ දේව පුත්‍රයාණන් වහන්සේ කුරුසිය මත ඇණ ගැසුම් කා, තමන්ගේ ජීවිතය පූජා කළා. එම කුරුස පූජාව සිදු වුනේ සිකුරාදා දිනකයි.

එතැන් සිට තුන්වන දින, උන් වහන්සේ මරණය නැමැති සතුරා පරාජය කරමින්, මරණයෙන් නැවත ජීවිතය ලබා ගත්තා. මෙය අපි හඳුන්වන්නේ උත්ථානය වීම වශයෙනි. මෙය සිද්ධ උනේ යුදෙව් ජාතිකයන් ඔවුන්ගේ පාස්කු උත්සවය පවත්වන පාස්කු කාලයේ දී යි. එතැන් සිට අදටත් ලෝකය පුරා සිටින ක්‍රිස්තියානි භක්තිකයෝ යුදෙව් පාස්කු උත්සවයට නව අධ්‍යාත්මික අර්ථයක් ගෙන දෙමින් එම දවස පවත්වන්නේ, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මරණය පරාජය කොට නැවත ජීවිතය ලබා ගැනීම සිහි කිරීමටයි.

මෙය කියවන ඔබ මොන ජාතියකට මොන ආගමකට අයිති වුනත්, ඔබටත් පුළුවන් ඔබේ ගැළවුම්කාරයාණන් වහන්සේ වන, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි විශ්වාසය තබා අදහාගෙන, ඔබේ පව්කාරකම ගැන පශ්චාත්තාප වී, ලෝක පාලන දෙවියන් වහන්සේට ඔබේ ජීවිතය භාර දෙන්න. එවිට ඔබට පුළුවන් යක්ෂයාගේ සියලු බලපෑම්වලින් නිදහස ලබා, දෙවියන් වහන්සේගේ දරුවෙකු බවට පත් වෙන්න. අන්ධකාරයෙන් ආලෝකයට ඇතුළු වෙන්න. නැවත කිසිම දිනෙක නොමැරෙන සදාකාලික ජීවිතයක්, දුක් වේදනා නැති, අංග සම්පූර්ණ ජීවිතයක් ගත කිරීම සඳහා දේව රාජ්‍යයට හෙවත් ස්වර්ග රාජ්‍යයට ඇතුලු වන්න ඔබටත් පුලුවන්.

අපේ පාස්කු බැටළුවා වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ, කුරුසිය මත තම ශුද්ධ රුධිරය වගුරුවා, සියලු කෙළෙස්වලින් තොර තම දිව්‍යමය ජීවිතය පූජා කළේ, ඔබට ඒ අවස්ථාව ලබා දීම සඳහා යි. මතක තබා ගන්න, ඔබගේ ජීවිතයට තිබෙන එකම විමුක්ති මාර්ගය ඒක පමණක් බව. ■



# සියල්ලෝම පව්කොට...

දේවගැති මල්කා සේනාරත්න

මීට වසර දෙදහසකට පමණ පෙර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසපත්වීමේ සිදුවීම තුළ මනුෂ්‍යයන් විවිධ අදහස් ප්‍රකාශකර තිබේ. බොහෝ දෙනා උන්වහන්සේගේ මරණය ගැන දුක්වූයේ යේසුස් වහන්සේ යහපත් කෙනෙකු බව ඔවුන් දැනසිටි නිසාය. සමහරු උන්වහන්සේගේ මරණය ගැන ප්‍රීති ප්‍රමෝද වූහ. එමෙන්ම ආගමික පරිසරයන් තුළ ගැඹුරින් කටයුතු කරනවා යැයි සිතූ සමහරුන් යේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ උදහසට පාත්‍ර වී ඇති කෙනෙකු ලෙස හඳුන්වා දෙනු ලැබුවේය. යේසුස් වහන්සේගේ ගෝලයන්, පවුලේ අය ඇතුළු උන්වහන්සේට ලඟින් සිටි අය පවා එම මරණය වටිනා ජීවිතයක් නැතිවීම, තව බොහෝ යහපත් දේවල් කරන්න පුළුවන් කාලයේ උන්වහන්සේට නොලැබී යාම දෙස දුක්වූවා මිස එහි අර්ථය නොගත්තෝය. යෙසායා:53:5 හි ප්‍රකාශකරන්නේ උන්වහන්සේ අපේ දුක් උසුලාගත් බවයි. අප විඳිය යුතු දඩුවම අපේ අයුතුකමේ විපාක, අපේ ශාපය උන්වහන්සේ ස්වකැමැත්තෙන් දරාගත් බවයි. එතුමා වින්දේ මුළු ලෝවැසි සියලු දෙනාගේ පාපයේ වේදනාවයි. එසේ නම් ක්‍රිස්තුස් වහන්සේ ඉතා භයානක වේදනාකාරී මරණයක් විඳීමට එකම හේතුව සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගෙන් ඈත් වී සිටීමය **(රෝම: 3: 23)**.

### එසේ නම්... පාපය යනු කුමක්ද?

අපට හුරු පුරුදු අදහස අනුව පාපය යනු සිතෙන්, වචනයෙන්, ක්‍රියාවෙන් සිදුකරන වැරදි වේ. නමුත් කිතුනු ඇදහිල්ල අනුව අති ශුද්ධවූ දෙවියන් වහන්සේ සමඟ එකඟ නොවන්නා වූ යම් කාරණයක් මනුෂ්‍යයා තුළ ඇත්ද එය පාපය වේ. පාපය මනින මිනුම් දණ්ඩ දෙවියන් වහන්සේගේ වචනය තුලින් දැනගැනීමට හැක. එක් අවස්ථාවක යේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළ සේක. “කාමමිථ්‍යාචාරය නොකරවයි කී බව නුඹලා අසා තිබේ. නමුත් මම නුඹලාට කියමි, ස්ත්‍රියක දෙස රාගයෙන් බලන කවරෙකු නමුත් එවෙලේම ඇය සමඟ කාමමිථ්‍යාචාරය කළේය.” **(මතෙව්:5 : 27 -28)** උන්වහන්සේ කළ මේ ඉගැන්වීම දෙස බැලීමේදී පාපයේ ගැඹුර අවබෝධ වේ. ක්‍රියාවක් නොවූවද සිතුවිල්ල පවා ක්‍රියාව තරම් ප්‍රබල බව උන්වහන්සේ පහදා දී ඇත. එසේ බලන විට වෛරය, උඩඟුකම, අපවිත්‍රකම, බොරුව වැනි පාප සම්බන්ධව හැඟීමක් හෝ ඇති නොවුනු කෙනෙකු නැත යන්න අපට පිළිගැනීමට සිදුවේ.

එමෙන්ම නව ගිවිසුමේ (New Testament) පාපය උදෙසා භාවිතාකර ඇත්තාවූ ග්‍රීක වචන ගැන අවධානය යොමු කිරීමේදී පාපය යනු කුමක්ද කියා තව දුරටත් අවබෝධ කරගැනීමට පුළුවන් වේ. ඒ අනුව පහත සඳහන් වචන ගැන සිත යොමු කරමු.

HARMARTIA (හමර්තියා) - මෙහි අරුත වන්නේ ‘ඉලක්කය වැරදීමයි’. කිතුනුවන් වන අප නිතරම දෙවියන් වහන්සේ අප ඉදිරියේ තබා තිබෙන ඉලක්ක කරා යාමට අපොහොසත් වෙමු.

උදා:- දෙවියන් වහන්සේට ප්‍රේමකිරීම **(මතෙව්: 22: 37)** සහ අසල්වාසියාට ප්‍රේමකිරීම **(මතෙව්:22:39)** දෙවියන් වහන්සේ දී ඇති මෙවැනි නියෝගවලට සම්පූර්ණයෙන් කීකරු වීමට අප නිතරම අපොහොසත් වන්නෙමු.

*ADIKIA (අඩිකියා) - මෙහි අරුත වන්නේ ‘අධර්මිෂ්ඨකම, දුෂ්ඨකම, අකුසලය, අයහපත’.

*ANOMIA (අනෝමියා) - මෙහිඅරුත වන්නේ ‘නොපනත්කම, අයුක්තිය’.

*ASEBEIA (අසේබියා) - මෙහිඅරුත වන්නේ ‘අභක්තිය’.

*PARABASIS (පරාබසිස්) - මෙහිඅරුත වන්නේ ‘දේවනි යෝගය උල්ලංඝනය කිරීම, නීතිය කැඩීම’.

*PONERIA (පොනේරියා) - මෙහි අරුත වන්නේ ‘පාපිෂ්ඨත්වය, කෙලෙසීම, දුෂ්ඨ, නපුරු චේතනා’.

*APEITHEIA (අපේතෙයියා) - මෙහි අරුත වන්නේ ‘අකීකරුකම’.

ඉහත සඳහන් ග්‍රීක් වචන අනුව තක්සේරු කළ විට අප සැම පව්කාරයන් බව වැටහේ. දෙවියන් වහන්සේගේ ස්වභාවය ශුද්ධය. එබැවින් උන්වහන්සේ සෑම පාපයකටම ද්වේශ කරන සේක. නමුත් උන්වහන්සේ පව්කාරයාට ප්‍රේම කරමින් පාපයෙන් හැරෙන්නට ආරාධනා කරයි.

### පාපිෂ්ඨ ස්වභාවයෙන් පවිත්‍රකමටත් අන්ධකාරයෙන් ආලෝකයටත් පැමිණෙන්නේ කෙසේද?

ප්‍රථමයෙන් අපේ පව්කාරයන් බව පිළිගෙන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වෙතට හැරී පසුතැවිලි සිතක් ඇතිකරගමු. 1 යොහාන් : 1: 9, “අපේ පාපවල් කියාදෙමු නම් අපේ පව්කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක.”

දෙවියන් වහන්සේගේ හදවතට එකඟ වූ මනුෂ්‍යයෙකු ලෙස දිනපතා ජීවිතය ගෙවීමට උන්වහන්සේගේ පාමුල රැඳී සිටින්නට ආශාවෙමු. ඒ සඳහා අවශ්‍යය බලය, මඟපෙන්වීම හා ධෛර්‍යය ලබා දීමට ශුද්ධාත්මයාණන් වහන්සේ සෑම මොහොතකම අප සමඟ සිටින බව මතකයේ තබාගන්න. ඔබ සැමට දෙවියන් වහන්සේගේ ගැලවීමේ ආශිර්වාදය ලැබේවායි පතමි. ■ යේසු පිහිටයි !

### ලෝකවාසීන්ට සදාතන ජීවිතය උරුම කළ

# ජේසු සමිඳුන්ගේ ශ්‍රී ලේ

**කලාභූෂණ කැලිස්ටස් ජයමාන්න**



“දෙවියන් වහන්සේ ස්වකීය පුත්‍රයාණන් ලොවට එවා වදාළේ ලෝකයා විනිශ්චය කරනු පිණිස නොව උන්වහන්සේ කරණ කොට ගෙන ලෝකය ගලවනු ලබන පිණිසය.” **(ජොහාන් 3-17)** සුවිශේෂක ශුද්ධවර ජොහාන්තුමා එලෙස සඳහන් කරයි. දෙවියාව මිනිසියාව බවට පත්කර ස්වකීය තුන් තිස් වස් දිවිය අවසන අනේක වූ වද වේදනාවලට බඳුන්ව නින්දනීය වූ කුරිසියක් මත ඇණ ගසනු ලදුව ශ්‍රී ලේ සිඳහෙලමින් උන්වහන්සේ කුරුසිය මතම උකුත් වූ වග කිතුනු ජනතාව චතාරික කාලය පුරාම මහත් වූ සොවින් බැතියෙන් සිහිපත් කරති. එහෙත් එසේ සිය දිවිය මනුවග වෙත පුජා කළ උන්වහන්සේ තුන්වන දින යළි උත්ථානය ලද බව කිතුණු විශ්වාසයයි. කුරිසියේ උකුත් වීමට ප්‍රථම කස පහර, හෙල්ලයෙන් ඇනීම, බිම ඇද වැටීම් වැනි හේතූන් මත උන්වහන්සේගේ ශ්‍රී ශරීරයෙන් සිඳ හෙළුනු රුධිරය හෙවත් ශ්‍රී ලේ ලෙස කිතුනුවෝ සලකති.

සමිඳුන්ගේ සිරි සිරුරේ විවිධ ස්ථානවලින් ශ්‍රී ලේ ගලා ගියේය. ගල් කණුවේ බඳිනු ලැබ කස පහර දීමෙන්, සිරි සිරසේ කටු ඔටුන්න පැළඳවීමෙන්, හෙල්ල අතුළු ආයුධ වලින් ඇනීමෙන්, කුරුස බරින් බිම ඇද වැටීමෙන් සිරි සිරුර පුරා අනේක විද තුවාල ඇති විය. ශ්‍රී වණ කැළල් ලෙස ඉන් ප්‍රධාන තුවාල පහක් නම් කරනු ලැබ තිබේ. දෙ අත් හා දෙපා වල කුරිසියේ ඇණ ගැසීමෙන්ද, ළයට හෙල්ලයකින් ඇනීම ද නිසා ඇති වූ තුවාල පහ එම ශ්‍රී වණ කැළැල් පහය. තුන් දිනකින් උන්වහන්සේ උත්ථානය ලද පසුවද මෙම වණ කැළැල් දිස් වූ අතර උන්වහන්සේගේ ශ්‍රාවකයෝ ද ඒවා දුටුහ. උන්වහන්සේගේ අපෝස්තුළුවරුන් දොළොස් දෙනාගෙන් කෙනෙකු වූ නිවුන්නා යැයි නම් ලද තෝමස් උන්වහන්සේ ගේ උත්ථානය අවිශ්වාස කරමින් උන්වහන්සේගේ අත්වල වණ කැළැල් දැක ඇණ ගසා තිබූ තැන්වල තම ඇඟිල්ල තබා උන්වහන්සේගේ ඇළයෙහි තම අත දමා බලන තුරු විශ්වාස නොකරමියි කී පුවත **(ජොහාන් 20-24)** සුවිශේෂක ශුද්ධවර ජොහාන් විස්තර කරයි.

සමිඳුන්ගේ ශ්‍රී ලේ ගැන සඳහන් කරන විට ශ්‍රී ලේ සිඳ හෙලු ප්‍රධාන අවස්ථා හතක් ගැන සඳහන් ව තිබේ.

1. ජුදා වත්පිළිවෙත් අනුව බිළිඳු ජේසු චර්ම ඡේදනයට ලක් කරන ලද අවස්ථාවේදී.
2. ඔලිව් කන්දේ ගෙත්සෙමන උයනේ උන්වහන්සේ යාච්ඤා කළ අවස්ථාවේදී.

   මෙම අවස්ථාවේදි “උන්වහන්සේගේ දාඩිය ලේ බින්දු මෙන් බිම වැටිණි.” යැයි සුවිශේෂක ශුද්ධවර ලූක්තුමා සඳහන් කර තිබේ. **(ලූක් 22:44)**
3. ගල්කණුවේ බැද කස පහර දුන් අවස්ථාවේදී.
4. ශ්‍රී සිරසේ කටු ඔටුන්න පැලඳ විමේදී.
5. කල්වාරිය තෙක් කුරුස ගමනේදී.
6. හෙල්ලයකින් ළය සිදුරු කිරීමේදී.

මෙය විස්තර කරන සුවිශේෂක ශුද්ධවර ජොහාන් තුමා හේවායින් ගෙන් එකෙක් හෙල්ලයකින් උන්වහන්සේගේ ඇළයට ඇන්නේය. එකෙනෙහිම ලේත් වතුරත් ගලා ආවේය **(ජොහාන් 19:34)** යන්න සඳහන් කර තිබේ.

සමිඳුන්ගේ ශ්‍රී ලේ ලෝකවාසි සමස්ත ජනතාවට ආදි මාපියන්ගේ පාප නිසා වැසී තිබූ ස්වර්ගීය දොරටු විවර කර දුන්නේය. සදාතනික ජීවිතය උරුම කර දුන්නේය. එදා කුරුසිය මත දිවි පුදා උත්ථානය ලද උන්වහන්සේම ස්ථාපනය කළ දිව්‍ය සත්ප්‍රසාදය නම් වූ ප්‍රසාද නිධානය මඟින් උන්වහන්සේ අදත් දිනපතා අපවෙත ස්වකීය ශ්‍රී ලේ පූජා කරන සේක. “ඔබ මනුෂ්‍ය පුත්‍රයාණන්ගේ මාංශය අනුභව නොකරන්නාහු නම් ඔහුගේ රුධිරය පානය නොකරන්නාහු නම් ඔබ තුල ජීවනය නැත. යමෙක් මාගේ මාංශය අනුභව කරන්නේ ද මාගේ රුධිරය පානය කරන්නේ ද ඔහුට සදාතන ජීවනය ඇත. තවද මම අන්තිම දවසේදී, ඔහු උත්ථානය කරන්නෙමි. **(ජොහාන් 6-52-56)** මෙයින් ගම්‍ය වන ප්‍රධාන කරුණ නම් සමිඳුන්ගේ ශ්‍රී ලේ නිසා එම තැනැත්තා සමිඳුන් තුළ ජීවත් වන්නා සේම සමිඳාණෝ ද එම තැනැත්තා තුළ ජීවත් වන බවය.

1960 ජුනි 30 දින ශ්‍රී රුධිරය පිළිබඳ අපෝස්තලික හසුනක් නිකුත් කළ ශුද්ධවර 23 වන ජුවාම් මුනිතුමා ගැලවුම්කරුවාණන්ගේ අපරිමිත ප්‍රේමය උන්වහන්සේගේ ශුද්ධවූ හදවතින් නිරූපණය වන්නා සේම උන්වහන්සේගේ ශ්‍රී රුධිරයෙන් තහවුරු වන බව පවසා තිබේ. උන්වහන්සේගේ ලේ සියලු පව් වලින් අපවිත්‍ර කරන බව **(1 ජොහාන් 1-7)** ජොහාන්තුමාගේ පළමු හසුනේ දක්වා ඇත්තේ සමිඳු ශ්‍රී ලේ කොතරම් අමිල වස්තුවක්ද යන්න තහවුරු කරමිනි. කිතුනුවන් සමිඳු සිරිලෙය ශ්‍රී ලේ වහන්සේ ලෙස හඳුන්වන්නේ එබැවිනි. ■



# පාස්කුව

## සැබෑ එතෙරවීමක් කරා

**ලූෂන් ෂර්ලි එඩ්වඩ් පෙරේරා**

පාස්කුව යන හීබෲ වචනයේ අරුත එතෙර වීමයි. එනම් වහල් භාවයෙන් මිදී නිවහල් භාවයට පිවිසීමයි. අද ලෝකය විශේෂයෙන් අප දේශය සැබෑ එතෙර වීමක් හෙවත් නිවැරදි පාස්කුවක් සඳහා මොර ගැසිය යුතු කාලයකට පැමිණ ඇත. එනිසා පාස්කුව පිළිබඳව ගැඹුරින් මෙනෙහි කිරීම අද යුගයේ අවශ්‍යතාවයක් වන්නේය.

සෑම ආගමක්ම මිනිසාව උසස් අධ්‍යාත්මික තත්ත්වයකට ගෙන ඒම පිණිස එතෙර වීමක් ගැන කථා කරනවා. එහෙත් ඒ දැක්ම ඉතාම ඛේදනීය ලෙස යටපත් වී, එතරම් වැදගත් නොවන දේ සෑම ආගමක් තුළින්ම ඉස්මතු වී තිබෙනවා. එනිසා මිනිස් පිරිහීම අද සමාජය තුළ වඩාත්ම දක්නට ලැබෙනවා.

අද දක්නට ඇති දේශපාලනමය හා සදාචාරමය පිරිහීම ආගමික පිරිහීමේ අතුරු ඵලයක් ලෙස හඳුන්වන්නට පුලුවන්. මේ තත්ත්වයේ සැබෑ වෙනසක් දකින්නට නම් සෑම ආගමක් තුළම අද යටපත්ව ඇති “එතෙරවීම” පිළිබඳව ගැඹුරින් මෙනෙහි කිරීම අත්‍යාවශ්‍ය කරුණකි.

එතෙරවීම යනු මමත්වයෙන් සම්පූර්ණයෙන්ම මිදී “ආත්මාර්ථය” මරා මිනිස් සිත නව මගක ගමන් කිරීමට මෙහෙය වීමයි. එය කිතුණු අප හට ශුද්ධාත්මයාණන් තුළින් නව ජීවිත ක්‍රමයකට ඇතුළු වීමක් “සියල්ලටම වඩා සිත (මිනිසා රැවටිලි කාරව තිබේ) දුෂ්ඨව තිබේ. එය කාට දැන ගන්නට පුළුවන්ද?” **(යෙරමියා 17: 09)** ධම්ම හෙවත් ධර්මයාණන් තම ගුරුවරයා හා එකම මඟ පෙන්වන්නා හැටියට ඇතිව එතුමන්ට රිසි ලෙස ඔබ කඩන්නට, ඔබ අලුතින් අඹන්නට ඉඩ දෙනවා නම් පමණයි. එකම ජීවිත කාලයක් තුළ පාස්කුව හෙවත් එතෙරවීම ඔබ, මා තුල පූර්ණත්වයට පත් කල හැකිය. එවැනි ජීවිත ගමනක් සැබැවින්ම සමාජ විමුක්තිය සඳහා හේතු වෙනවා.

වනාන්තර බොහෝ තිබෙනවා, එහෙත් ඒවායේ වටිනා සඳුන් ගස් බෙහෝ විරලයි. පොළොවේ ගල් කැට බොහෝ තිබෙනවා. එහෙත් වටිනා මැණික් කැට සොයා ගැනීම ඉතා අසීරුයි. අලි ඇතුන් ද බොහෝ සිටිනවා, එහෙත් වටිනා ගජමුතු ඇති ඇතුන් විරලයි. සමාජයේ මනුෂ්‍යයන් බොහෝ සිටිති, එහෙත් සැබෑ මිනිසුන් සොයා ගැනීම ඉතා අසීරුයි. එනිසා සමාජය තුළ උතුම් මනුෂ්‍යත්වයෙන් පිරි මිනිසුන් වීමට උත්ථාන වූ ජේසුස් වහන්සේ අපව කැඳවන සේක.

උන් වහන්සේ ලෝකයට පැමිණියේ මිනිස් හදවත දේවස්ථානයක්ද, ආත්මය අල්තාරයක් (පූජාසනයක්) ද, මනස පූජකයෙකු ද කරනු සඳහාය. ජේසු වගේ හාස්කම් කරන්නට බොහෝ අය කැමතියි. එහෙත් ජේසු වගේ කුරුස මඟේ ගමන් ගන්නට ඒ අය අකමැතියි. ජේසු වගේ ප්‍රේමය ගැන කථා කරන අය බොහෝ සිටිති. එහෙත් උන්වහන්සේ වගේ දුක් විඳින සේවකයා වීමට ඔවුන් සූදානම් නැත. “මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා” යි පතමින් දෙවිඳුන් අභියස එක පැයක් හරි හදවතින්ම යාච්ඤා කරන්නට අප සූදානම් නම් අපට වැරදී ඇති තැන් අවබෝධ කර ගැනීමට ශුද්ධාත්මයාණන් වහන්සේ මඟ පෙන්වනු ඇත.

එමෙන්ම ගැලවීම හුදෙක් පෞද්ගලික ක්‍රියාදාමයක් නොව, පෞද්ගලික මෙන්ම සාමූහික වගකීමක්ද වන්නේය. පාස්කුව හා බැඳී පවතින එම කාලය තුළ දී ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය, දුක්ප්‍රාප්තිය හා මරණය, උත්ථානය ගැන මෙනෙහි කරන අප අද සමාජය තුළ අපගේ සහෝදර ජනතාව විඳින්නාවූ නා නා විද දුක් ගාවිනා, ජීවිත කම්කටොළු දුක් පීඩා යනාදිය වෙත අපගේ අවධානය යොමු කිරීම උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේට කරන ලොකුම උපහාරය වනු ඇත. ■

## බැටළුපෝතකයාණෝ..

11 පිටුවෙන් >>>

දැක්වූයේ අතිශය ප්‍රේමණීය දයාවක් පෙන්නුම් කරමින් වුවත් පසුකාලීනව පාස්කු ප්‍රහාරය සඳහා සාධාරණ තීන්දුවක් නොදෙනවිට අප දක්වනු ලැබූ ප්‍රතිචාර කිතුනුකමට නොගැළපෙන බවද මතක්කල යුතුය.

පාස්කු දින ක්‍රිස්තුස් වහන්සේගේ ඝාතනය පිළිබඳව සාධාරණ තීන්දුවක් නොදී සිටියේ පාලකයන්ගේ උත්සාහය මද නිසා නොව ජනයාගේ විරෝධය නිසා යැයි කෙනෙකුට පැවසිය හැක. නමුත් දෙවියන් වහන්සේ එය අප සැමගේ මිදීම ලෙස ගනන් ගත් සේක. පාස්කු ප්‍රහාරයෙන් මියගිය අය ක්‍රිස්තුස් වහන්සේගේ කරුණාවේ දයාව ලබා යළි ජීවනයට එනු ඇත. ප්‍රශ්නය ඇත්තේ එය නොව ජීවත්වන අපි සමාව ඉල්ලන අයට සමාව දිය නොහැකි යැයි කරනා මාධ්‍ය සංදර්ශනයන්ය. මහත්මා ගාන්ධිතුමා කියා සිටියේ බයිබලයේ ඇති ක්‍රිස්තියානි ජීවිතය කිතුනුවා තුල නොමැති බවයි. ජනාධිපතිවරයාට සමාව දීමෙන් රටකට ලැබෙන නිදහස පමණක් නොව දෙවියන් වහන්සේගේ මහිමය විදහාපෑමක් ය. සමාව දීමෙන් උසාවියේ ඇති නඩු වලින් ඔහු ගැලවෙයි යන්න සිතිය නොහැකි වුවත් අපගේ ප්‍රේමය පෙන්වා දීම

> “පාස්කු බැටළුවාගේ පූජාව සිහිකිරීම වාර්ෂික සිද්ධියක් වුවද ක්‍රිස්තුස් වහන්සේගේ මරණය ද උන්වහන්සේගේ ලේ යාගයද දුක්විඳීම ද ක්‍රිස්තුස්වහන්සේ යළි වඩිනතුරු කළ යුතු යැයි ප්‍රකාශ කරන අතර කිතුණුවන්ගේ පාස්කුව වන්නේ උන්වහන්සේගේ නැවත නැගිටීම සිහිකිරීම වුවත් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රීතිය වන්නේ උන්වහන්සේගේ මංගලය්‍ය දිනයේදී උන්වහන්සේගේ සන්තක අය (මනාලිය) සමඟ කුසලානය සහභාගී කරවීමත් සංග්‍රහයට සහභාගී වී ප්‍රීතිවීමත්ය.”

මගින් විනාශවන මිනිසුන්ට දේව ප්‍රේමය දැක්වීමට ලැබෙන අවස්ථාවකි. ලැබූ හොඳම අවස්ථාවක් අතපසුවීම මා දකින්නේ ලොකු වරදක් ලෙසින් ය. අපි අඩුම ගානේ පිලාත්ගේ තලයේ වරද කරුවෙකුට නිදහස දෙන්න පාස්කු දිනය සංකේතකල ලෙසින්වත් ක්‍රියාකිරීමට අවස්ථා නොසොයනවාද?, පාස්කුව මගින් දෙවියන්වහන්සේ මනුෂ්‍යයන් මුදා මරණයේ බලයෙන් මුදන ක්‍රියාදාමයේ පළමු ක්‍රියාව අපි සිහිකරමු.

ඒ යේසුස් වහන්සේ මරණය පරාජයකර නැවත නැගිටීමය. අප රටේ ජනනායකයන් රටේ සෙනඟ සැවොම කිතුනුවන් නොවෙතත් සමහර කිතුනුවන් නොවන අය සමඟ බයිබලයන් තිබෙන බව අමතක නොකරමු. ප්‍රමාද වෙලා හෝ මෙවර පාස්කු දිනයේදීවත් රටේ ප්‍රධානියෙක් ඉල්ලු සමාව දෙන්නත්, සමාව දී දේශයට නිදහසක් ලබන්න කටයුතු කරමු.

විනිශ්චය දෙවියන් වහන්සේට අයිති බැවින් කිතුනුවන් එම තීරණය තමුන්ගේ අතට නොගෙන ඉමු. සතුරන්ට ප්‍රේම කරමු. නිතිය, නීතිරීති ක්‍රියාත්මක කරන අය එය ඉටුකරනු ඇතැයි විශ්වාස කරමු ■

ඔබ සැමට ප්‍රීතිමත්
නැවත නැගිටීමේ දිනයක් වේවා !

## ඔහු නිදොස් කොට නිදහස්...

12 පිටුවෙන් >>>

“අපිට යහපත එපා අපිට අයහපත දීපන්”. ඔබේ ඡන්දය, ඔබේ මනාපය ???

අර්ථ පූර්ණ ආදර්ශමත් සම්මානනීය ගීත, සිත් නිවන ආකර්ෂනීය නන්දා මාලනියගේ, සුනිල් එදිරිසිංහයන්ගේ, අමරදේවයන්ගේ හඬ පෞරුෂ සහිත ගායනා අපිට එපා. පංච ඉන්ද්‍රියයන් පිනවන, නටවන Re Mix අපට ඕනි. Break dance අපට ඕනි. ලෝක සම්මානයට පාත්‍ර වුන ජීවිතය කියා දෙන සම්භාව්‍ය චිත්‍රපට අපට එපා. අපිට ඕනෙ නිල් චිත්‍රපට. අපට යහපත එපා. අපට අයහපත ඕනෙ. අපිට ආදර්ශමත් චරිත, ගුණ යහපත් නායකයින් එපා, අපිට හොරු, මිනී මරුවො ඕනි. සුචරිත මහත්මා දේශපාලනය එපා. අපිට මැර පාදඩ දේශපාලනය ඕනි. මෙන්න මේ දූෂිත හැසිරීම නොවෙයි ද අපේ රටට, අපිට, අපේ දරුවන් ට හෙනයක් පාපයක් වුනේ. අදටත් අපි කිසිදු හිරිකිතයක් නැතිව බරබ්බාස්ලා පත්කර ගනිමින් සිටී. ඡන්දෙ දෙමින් කළු චරිත සුදු කරමින් සිටී.

මේ නාටකයේ ගැඹුරු ම යථාර්ථයට අපි කවුරුත් අවදි වී නොමැත. අඩු වැඩි වශයෙන් අපි එකී චරිත, එනම් පිලාත්, ජුදා, පූජක, ජුදාස්, බරබ්බාස් සුපුරුදු ආරයට සදා ඇති රඟ මඩලේ රඟ දක්වමින් සිටිමු. ඔබෙත් මගෙත් එක් කතිරයකින් නායකයෙක් වී, ඒ මුවාවෙන් දූෂිත, හොරුන් වී අවසන් වන බව නොරහසකි. ඒ දූෂිතයා ම නැවත ඡන්දෙන් පත් කිරීම දූෂණය වංචාවට මැර පාලනයට ප්‍රිය කිරීමක් නොවේ ද?

නැවත ඡන්දෙන් පත්වෙන හොර දූෂිත පාලකයන් සිතනුයේ මිනිස්සු අපිට කැමතී, අපේ ජරා වැඩ වලට මිනිස්සු කැමතී, මිනිස්සු දූෂිත අපට ආදරෙයි කියා නොවේද? මෙන්න මේ දේම බරබ්බාස්ටත් හිතෙන්නට ඇති. මට මිනිස්සු ආදරෙයි. මට මිනිස්සු කැමතියි. බරබ්බාස්ට මිනිස්සු ආදරෙයි. බරබ්බාස්ට මිනිස්සු කැමතියි. ඒකයි බරබ්බාස් නිදහස් වුනේ.

ඇත්ත නම් මේක නෙමේ....

බරබ්බාස්ගේ තැන, බරබ්බාස්ගේ කුරුසිය, බරබ්බාස්ගේ දඬුවම පියාණන් වහන්සේ තම ජේසු පුතාට දුන්නා. බරබ්බාස්ව නිදහස් කරන්න ජේසුව එතැන හිටෙව්වා. බරබ්බාස්ට වැරදුනු තැන එතැනයි. ඔහු හිතුවෙ මිනිස්සු ආදරෙයි කියලා. එහෙම නෑ. පියාණන් වහන්සේ බරබ්බාස් ට ආදරය කරා. බරබ්බාස් ව නිදහස් කලේ ඒ ප්‍රේමණීය ආදරයයි. ඒකයි ඇත්ත. එදත් අදත් රොත්ත බුරුත්ත පිටින් ම, මුල් පුටුවෙ ඉන්න කෙනා ඉඳන් මේ දූෂිත ක්‍රමවේදයේ සිටින පල්ලෙහාම කෙනා දක්වා බෙල්ලට තොණ්ඩුව වැටිල ඉවරයි. ඔවුන් හිරවෙලා ඉවරයි. එකම දේ ඔවුන් ට තාම හිර ගෙවල් හැදිලා නෑ. ඒත් ඔවුන්ගේ ගෙවල් අද හිරගෙවල් වෙලා. අධි ආරක්ෂිත කලාප වෙලා. භය, භීතිය සැක සංකා ඔවුන්ට වද දෙනවා. ඒත් අදටත් ජේසු ඒ හොරු වෙනුවෙන් කුරුසියට යනවා. සත්‍ය වෙනුවෙන්, යුක්තිය වෙනුවෙන්, යහපත වෙනුවෙන් අදටත් කුරුසිය ලෑස්තියි. මැරෙන්නේ සත්‍යය නොවෙයි. සත්‍ය වෙනුවෙන් හඬ නගන, යුක්තිය වෙනුවෙන් හඬ නගන නිර්දෝෂීකයිනුයි. ඔවුන් එදත් ජීවිතය පූජා කලා. අදත් එහෙමයි. ඒ පව්කාරයාට තවත් අවස්ථාවක් උදා කර දෙන්නටයි. අන්න ඒ නිසයි අදටත් ජේසුස් වහන්සේගේ නාමයෙන් කුරුසය ලෑස්ති වෙන්නේ. බරබ්බාස්ලා නිදහස් වෙන්නේ. ඇත්ත ඒකයි. පව්කාරයා තුළ තවත් ශුද්ධවන්තයෙක් දකින්නේ ආදරණීය පියාණන් වහන්සේ විතරයි නිසා.

ඊළඟ සොරා නිදොස් කොට නිදහස් කරන තෙක් ඔබත්, මමත් තවත් නිදිබරව සිටිය යුතු ද? මෙය අප හැමෝටම ලැබෙන අවසාන අවස්ථාව විය හැකිය. ඔබ, මම තවමත් ප්‍රමාද නැත. හැබැයි ප්‍රමාද වන්නට තරම් කාලයක් අපට තව ඉතුරු වී නැත. වැටෙන්නට තවත් තැනක් නැත. සියල්ල සිදු වී හමාර ය. පිලාත්ලා, ජුදාස්ලා, ජුදා පූජක පැලැන්තිය, බරබ්බාස්ලා හැම තැනම ය. ඔවුන් උඩින් පාත් වුවෝ නොවෙති. ඔවුන් තෝරා පත්කලේ ඔබෙත්, මගෙත් කතිර බලයෙනි. පොරව දැනටමත් ගස මුලට ඉලක්ක කර ඇත. “අයියෝ ස්වාමිනී, එනක්ක වේනාම්” කිව්වට වැඩක් නැත. වගකිවයුත්තන් ජේනමානයක නෑ. වගකීම භාර ගන්නට කවුරුත් නැත. අහෝ එය මෙවන් ඛේදවාචකයකින් අවසන් වීම කොයිතරම් අභාග්‍යසම්පන්න ද?

මාගේ සටහන අවසන් නැත. ඊළඟ සොරා ළඟ ම ඇත. නිදොස් කොට නිදහස් කරන්නට පෙර. ■

## පිපාස වෙමි..

13 පිටුවෙන් >>>

තිබූ ක්‍රිස්තු ශරීරය තුළ තිබූ කරුණාවෙන් තෙත් වූ සුපිරිසිදු හදවතය.

“මම පිපාස වෙමි.”

දුබල වූ එහෙත් ගැඹුරු කටහඬින් ක්‍රිස්තුන් වදාළ වචන මේ සමාරිය ස්ත්‍රියගේ දෙසවනින් ඇතුළුව හදවතට කිඳා බසිනු ඇයට දැනුනි. ක්ෂණයකින් ඇගේ අත තම ගමන් මල්ලේ වූ දිය බඳුන වෙත යොමු විය. බඳුන අතට පත්වුවත් එය හිස්ව තිබුන බව ඇයට පෙනුනි. එදා මෙන් එතුමන්ගේ මුවට දිය පොදක් වත්කළ හැකිනම් මා කොතරම් වාසනාවන්තද?

“මගේ පියාණන් වෙත නැවත යාමේ පිපාසයක් මට ඇත.”

“එතුමන් සඳහන් කළේ එම පිපාසම ගැන විය නොහැකිද? සියල්ල හමාරය.”

ක්‍රිස්තුස් වහන්සේගේ හිස පහතට කඩා වැටී උන්වහන්සේ උකුත් වූ අවස්ථාව දැකිය නොහැකි වන සේ වසා ගනු ලැබූ නෙත් තම දෑතින්ද වසා, සමාරිය ස්ත්‍රිය බිම වාඩි වුවාය. බොහෝ වේලාවක් ඇය සිටියේ එම ඉරියව්වෙනි. මහත් අමාරුවෙන් නැඟී සිටි ඇයගේ දෙතොල් හා දිව වියලී දැඩි පිපාසයක් ඇයට දැනුණි. තමන් අත වූ හිස් ජල බඳුනින් පැන් උගුරක් හෝ මුවට හලා ගැනීමේ නිශ්ඵල උත්සාහයක ඇය යෙදුනි.

“දියණිය, ඔබ පිපාසයෙන්ද? මේ බඳුනෙහි දිය ඇත. ඇති තරම් බොන්න.”

තමා ඉදිරියේ සිටින ඒ උතුම් මිනිසාගේ මව ඇය හඳුනාගත්තාය. තමන් දෙසට දිගුකර සිටි දිය බඳුන අතට ගත්තාද ඒ කාරුණික වදනින්ම ඇගේ පිපාසය සන්සිඳී තිබුණි.

“දියණිය ඔබ කවරෙක්ද? සමාරිය ස්ත්‍රියක් බව නම් පෙනේ.”

“එසේය මෑණියනි, මා සමාරිය ස්ත්‍රියකි. එමෙන්ම ඔබගේ පුතණුවන් වෙතින් ජීවන ජලය ලබාගෙන සුවපත් වූ තවත් එක් ගැහැණියක් වෙමි.” ■

# පාදනමස්කාරය

එන්න එන්න මෙහෙට එන්න, අපේ තමයි හොඳම ඔන්න
වැඩි වැඩියෙන් පිහිට ගන්න, නමස්කාර කරලා යන්න
කපාලයම අත්දකින්න, ලොකු කන්දක් නැග බසින්න
තව තව දේවල් තියෙනව, ඇවිත් බලලා රස විඳින්න

දැන්වීමකි පුවත්පතක, අවසන් පිටුවේ දිනයක
කල්වාරිය කරල මතක, යදින්න එන්නකෝ හනික
වෙන්කරගෙන අවැසි දිනක, එකතුවෙලා එනු බසයක
රස බලන්න කෑම ටිකක, ඇණවුම්කර ගන්නට හැක

මීසම තුළ එකතු වෙලා, චතාරිකය ගැන සිතලා
ගමනට සැලසුම් සදලා, බස්තුනක්ම වෙන්කරලා
පැමිණෙන අය ගැන අසලා, වෙහෙසක් ගැනවත් නොබලා
දවල් බතට දෙමු කියලා, "චිකන් රයිස්" ඕඩර් කළා

පාන්දරම අපි යනවා, වෙලාවටම පිටවෙනවා
උදේ කෑම ගෙනියනවා, මගදී නවතා කනවා
මුලින් පාද නමදිනවා, යාගයකුත් පවතනවා
දොළහට පෙර නවතනවා, ඉන්පසු නිදහස දෙනවා

දොළහෙන් පසු එකතුවෙලා, කල්ලි කල්ලි හැඩ ගැසිලා
සමහරු යනවා සොයලා, නාන්න හොඳ තැන් දැනිලා
කෑම පැකට් ටික බෙදලා, වෙන තැනකට සෙට්වීලා
තුනවෙනකන් කල්දීලා, ඇත ආපසු යන්න බලා

අපිත් ගියා නමස්කාරේ, කියනව එහි චමත්කාරේ
තව නඩයක් හෙමින් සාරේ, වැඩකරනව ගොඩක් පාරේ
ඔප්පු කරල බාර හාරේ, කියමුද දැන් ඉතින් හූරේ
උදේ වරුව දෙවියො බාරේ, සවස ඉතින් අපේ වාරේ

පිට්ටනියේ මිනිස් ගොඩයි, කන්ද උඩත් තවත් හිඳියි
ශබ්ද වාහිණියක් හඬයි, ආධාරත් දෙන්න කියයි
මෙතැනට එන අයත් වැඩියි, එන වසරට වැඩත් ගොඩයි
රෑට ඉන්න ගෙවල් තැනෙයි, එතකොට පහසුකම් ගොඩයි

කඳු මුදුනේ කුරුස තුනක්, මැද සිටියේ දන්න කෙනෙක්
සුරුවම දැන් පරණ බවක්, පැවසුව ඒ නඩේගුරෙක්
අරගෙන අපි අලුත් එකක්, සවිකරමුද කොටල නමක්
නසරේනුට නව හැඩයක්, දී අපි පින්කරමු ගොඩක්

**මැක්ෂිමස් ලින්ටන්**



# අරුම පුදුම පණිවිඩය



අන් භක්තිකයෙකු වූ මම
දිනක වැලි බිමක් මත හිඳ,
සිතුවෙමි මා අදහන දෑ නිෂ්ඵල බව,
හිස් වූ නිල් අහස දෙස බලා ප්‍රශ්න කළේ,
මින් එහාට ගිය දෙයක් නැති ද? කියා ය.
මගෙ හදවත වේදනාවෙන් බර ව තිබුණි.
ඒ එක් දිනකි.
තවත් දින ගත විය අඳුරු වූ රාත්‍රියෙක, කථා බහ විය,
මගේ පවුලේ ඇත්තන් සමඟ, මේ ලොවේ අරුම බව
පෘථිවිය ගෝලයක් නම්?
රටකින් රටකට වතුර ඇද හැලෙන්නේ නැත්තේ මන්ද කියා ?
ඒ තවත් දිනයකි.
නොබෝ දිනකින් මා ඇසු අරුම පුදුම පණිවිඩය...
දෙවිඳුන් ගැන ය.
ඒ උන් වහන්සේ මැවිල්ලේ අයිතිකරු, නිර්මාතෘ බවය
යේසුස් වහන්සේ ගැනය
ඒ උන්වහන්සේ මාගේ සියළු පව් උදෙසා කුරුසියේ මැරුණු බව ය.
ශුධතුන් ගැන ය
ඒ උන් වහන්සේ අපගේ මැදිහත්කරු බවය
පසු කලෙක මා උගත් සත්‍යතාවය නම්,
මැවිල්ල තුළින් හා දෙවිඳුන්ගේ වචනයෙන්,
උන්වහන්සේ පව්කරුවන් හට එළිදරව් වන බව ය
ඒ සත්‍යය මා අත් දැක්කේ මැවිල්ලෙනි.
ඒ ත්‍රීත්වයේ දෙවිඳුන් අද මාගේ එඩේරා ය
ඒ එක් දින වර්ෂ 2001 ය. අද වර්ෂ 2023 ය.
ස්තූතියි දෙවිඳුනි....

**දිලිනි ජයනි පද්මපෙරුම**

# අමතම් - ජුදාස් නුඹ! රිදුනු හදෙකින් !

අන්ධව සිටියේද
ජුදාස් - නුඹ ?
එතරම් මහා පෙළහරයන්
දේව බලප්‍රකාශනයන්
නුඹේ ගුරු ස්වාමින් වෙතින්
දැක- දැකත්

මතකද නුඹට කානාහි විවා මංගල්‍යය
කිසිදු රසයක් - වර්ණයක්
නොමැති ජලය ...
ගැටිය තෙක් පිරීගිය බඳුන්
සුමිහිරි වූ යුෂ බවට
හැරව ගිය - මහා මෙත් බල

සළුවට අත ගැසූ ස්ත්‍රිය
ශතාධිපතියාගේ සේවකයා දෙනෙත් අඳ
බර්තිමේයස්
අංශ භාග රෝගියා
යායිරස්ගේ මරණාසන්න දියණිය
තව තවත් සුවහසක්
සුව සැනසුම ලැබූ අරුමය
දෙව් පෙමේ මහ බල විකුම්
ඇසින් දුටු - සාක්ෂි කරුවකු
නොවූයේ ද නුඹ !

දේව සබැඳියාවේ තිර කළ
හෘද සංවේදි යාච්ඤාවේ ගුණ
අත්විදින්නට
අත් දකින්නට
නුඹටම ඉඩ ලද
අසිරිමත් හෝරාවන්
අමතකව ගියේ කෙළෙසද?

තවත් දෙයක්....
මිනිස් සිත් රිදුවමින්
පෙළා මහ බියකින්
"නපුරා" ගේ රුදු ක්‍රියාවන්
නවත්වා -  උන් පලවා හැරී
දෙව් බලයේ විකුමන්
නුඹ නොදකින්නට නම්
කිසි ඉඩක් නෑ

එසැමටත් වඩා
එතුමන් නුඹට පෑ
සෙනෙහසේ - මුදු ක්‍රියා
අමතක කළේ
අමතකව ගියේ
කෙළෙසින්ද - කියා මටත්
මහ පුදුමයක්

රිදී කාසිවල දිස්නය
ප්‍රබල වීද එතරම්
නුඹේ ගුරු ස්වාමින්
වටින්නේ රිදී තිහක් පමණද?
තණ්හාව - මෝහාන්ධකාරය
මෙතරම්ම දරුණු දැයි
මහ පැනයකි අදටත්!

අරුමයක් ද නොවේ - එදා වගේමයි මෙදත්
ජුදාස්ලා මුදලට පාවා දෙති නිදොස් මිනිසුන් තවම
වෙනස් ව ඇත්තේ "කාලයේ වෙනෙස පමණයි!"

**නීටා අයි. ප්‍රනාන්දු**

# පුදමි ඔබට තුති සමිඳේ..



පුදමි ඔබට තුති සමිඳේ
ජේසුනි ඔබේ කටු කිරුලේ...
ගැලු ලෙයින් අප පව් මිදුනේ...
ඔබ විඳි කස පහරින් හම ගැල වී පිට සිදුරු වුවෙන්...

විඳිමින් සියලුම නින්දා
අප වෙනුවෙන් කුරුසිය කරවෙත ගත්තේ...
ඔබ විදි කුරුසියේ දුක් වෙනුවෙන්
පුදමි ඔබට තුති සමිඳේ

සියලුම ජනයා වෙනුවෙන්...
දිවි දී අපහට පණ දුන්නේ
සිරුරින් හෙළු මුළු ලේ බලයෙන්
අදට ඔබ කුරුසිය වන්නා...

අද ඔබ පූපය ලෙස සිර වී සිටිමින් දෙව් මැදුරේ...
යාගික යාගය වී අප වෙත වඩිමින්
දින දින අපගේ පව් සැමදා...
මුදනුව ඔබගේ ලේ බලෙනා...

පාප කිලිට නෑ අප අත හැරලා...
ඔබ තවමත් යාගය වී පිදෙනා...
මේ සැම දැක සිරි පූජේ...
අදටත් අප ගැන දුක්වෙන්නා...

ජේසුනි ඔබ හෙළු ශ්‍රී ලේ බලයෙන්
රෝගී සැමදෙන අදටත් සුව වෙන්නා
ඔබ වෙත දිගු කරනා දෑතට
නුඹ අදටත් සවියක් ගෙනෙනා.

මිදුමට අපහට පව් කිලිටෙන්
සැම දින අප ඇරයුම් ලබනා...
දෙනු මැන ජේසුනි ඔබෙ ලේ බලයෙන්
නැවතත් අප හට පාප කමා...

**ගීතානි නිරෝෂණී සමරතුංග**

# පාස්කු ඉරිදා

පාපි අප හැම දුකින් මුදන්නට - මෙලොවට වැඩි ඒ දේව පුත්‍රයා
ජුදා ජාතියේ මහ රජු මම යැයි - කීවාවූ ඒ බලවත් වරදට
නායක විනිසුරු පිලාත්ගේ ඒ - අසාධාරණ නඩු තීන්දුවෙන්
කුරුස පත්කර මරා දමන්නට - කළෝය නියමන සිතැඟි පරිද්දෙන්


අප අතරින් එක් අයෙකු අද දින - පාවා දෙනු ඇත මාගේ ජීවය
අන්තිම රාත්‍රී භෝජන වේලේ - දෙසුවා වූ ඒ අනුහස් වදනින්
හදවත ගැසී බියපත් වූයේ - ජුදාස් නම් ඒ පාවා දෙන්නා
මාගේ මරණය මා දැන සිටි බව - ලොවට ඔප්පු වී හමාර වූයේ

සිරි කුරිසියෙ බර කරින් දරා ගෙන - කපාල කන්දේ මුදුනට නඟිනා
විඩාපත් අප ජේසු සමිඳා - පය පැකිලීලා වැදහොත් මොහොතේ
මග්දලේනා නම් ඒ ස්ත්‍රිය - සෙනෙහේ පාලා උකුලට ගත්තේ
දිය ඉල්ලූ කල කාඩිද පෙව්වෝ - රුදුරු වූ ඒ රාජ පුරුෂයෝ

සිරි මුහුණෙහි කෙළ පිඬු තවරා - හිස මත විෂ කටු ඔටුනුද පළඳා
පරිභව කරමින් කසයෙන් තලමින් - මුදුනට ගෙන ගිය අප සමිඳාණෝ
නොදැන මොවුන් මේ කරනා වරදට - සමාව දෙන්නැයි ඉල්ලා සිටියේ
අනන්ත විඳ විඳ කුරුස පත්වූ - පූජනීය ඒ මහ සිකුරාදා

කුරිසියෙන් බාගත් ඒ සිරි දේහය - ගල්ලෙන මැද්දේ හිරකර තබලා
අවිගත් සෙබලුන් වටේට සිටුවා - රැකවල් කළෝය රෑ දහවල් දෙක
දින තුනකට පසු ගුහාව ඇරලා - බැලුකළ නොමැතිය සමිඳුන් ඒ තුළ
ස්වර්ගාරෝහණ වී සමිඳාණෝ - ප්‍රාතිහාර්ය පෑ පාස්කු ඉරිදා

**එච්.ඒ. සුගතපාල (බෝගමුවේ සුගතපාල)**





# පූජාවක් වූ ජේසුනි

නිදොස් නිකළැල්
පාපයක සේයාවක්වත් නැති
මගෙ ආදර ජේසුනි ...
අපරාධකරුවෙක් සේ කුරුසියේ මැරුණේ
මාගේ අපරාධ නිසාමැයි
සම්, මස් ඉරාගෙන
ඇට මිදුළු පසාරු කරගෙන වැදුණු කස පහර
ඔබ ඉවසා සිටියේ
මාව සුවපත් කරන්නටමැයි
ගව් ගාණක් දුර බර කුරුසිය ඔසවාගෙන
කපාල කන්ද තෙක් වැටි වැටී ඔබ ගියේ
මගේ පව් බර දරාගෙනමැයි
කුරුසිය මත අත් පා ඇණ ගසද්දී
හෙල්ල පහරින් ඇලපත සිදුරු වෙද්දී
පූජකයන්ගේ නායකයන්ගේ උසුළු විසුළු
ඔබ දරා සිටියේ මා නිසා මැයි
අහෝ ජේසුනි !.. තත්පරයකින් වුවද
දෙව් පියාණන්ගෙන් වෙන්වීමේ වේදනාව
ඔබ දරා සිටියේ මා ගලවනු නිසාමැයි
අහස ගුගුරා පොළව දෙදරා යද්දී
දේව මාළිගාවේ තිරය දෙකඩ වෙද්දී
දේව පියාණන් වෙත ළං වෙන්නට
අප උදෙසා පූජාවක් වූ ජේසුනි..
මුළු දිවිය පුරාම ඔබ තුරුලේ ඉන්නට
අපට වරම් දුන මැනවි !!

**රේණුකා සිරිකුමාර**



# "බලා ඉමි ඔබ - එනතුරා මම !"

මැවුම් සමිඳා පසෙන් සැදි රුව පණ ලබා දෙව් දරුවන්   වී
උහු පසු අස්ථියෙන් සෑදුණු දේව දැරවිය ඒව   වී
උන්ට අතවැසි සියලු දේ ඇති උයන සුගතී" නමින්   වී
එක් තුරෙක එහි ඵල නො කන්නට සමිඳුගෙන් නියමයක්   වී

පළමු පතිනිය- දෙවනු පතියා දේව නියමය බිඳ   දැමී
එසේ වූයේ ගිය හෙයිනි උහු අඳුරු දුතු බසනට   නැමී
දෙව් පියා ඉන් වීය උදහස් බිඳ දමා උන් හා   බැමී
අහිමි කොට දී තිබූ වර හැම උයනෙනුත් පන්නා   දැමී

එහෙත් උන් මනු දුබලතා දැක දයාවෙන් පිළිණක්   දිනී
මෙතෙක් ලද පහසුකම් අහිමිය සිටිනු පස හා   ගැටෙමිනී"
ගැහැනු- දරුවන් බිහිකරනු ඇත වේදනා දුක් විඳ   මිනී
දිනෙක ඔබ හැම මුදා ගන්නෙමි- මගෙ ම පුතු ලොව   එවමිනී"

ලොවේ මනු දන වැඩී ගණනින් ලොව පුරා උන්   පැතිරුණා
කලින් -කල බිහි මනු නයුන්ගෙන් ඔවුන් හැම පාලන   වුණා
එහෙත් වරදට වහා වැටෙනා දන දිනෙන් දින වැඩි   වුණා
රැකිණි නෝවා, පවුල පමණක්- ලොවේ අන් හැම   වැනසුණා

ආබ්‍රහම් - ජාකොබ් ද ජෝශප් අතුළු විරු නයුවන්   රැසක්
ලොවෙහි දෙව් දරුවන් රකින්නට ගත්හ ඇගයිය යුතු   තැනක්
ජෝබ් යෙසායා දානියෙල් - ජොවෙල් ද ආදී පඬි   පෙළක්
දේව දරුවන් ගැන කියද් දී - සිහියෙ විය යුතු නම්   වැලක්

එදා දෙවිඳුන් මුල් දනන් වෙත දුන්නු තිර පිළිණය   ලෙසින්
සිය පුතුන් පැමිණ වී ලොව වෙත "නාසරෙත් ජේසුස්"   නමින්
එහෙත් ලොව සිටි දැඩි දනන් රැස දෙව් පුතුට එරෙහී   වෙමින්
නසාලූවෝ කුරුසියක් මත යකඩ ඇණයෙන් රඳ   වමින්

යවුල් රැදි දැඩි කස පහර ලැබ වණ කැළල් නැගි ගත   පුරා
හිස ගැසූ රුදු කටු ඔටුන්නෙන් ගැලූ ලෙසින් වත තෙත්   කරා
දෙව් පුතුන් මේ ලෙසින් දිවි දී සමිඳු නියමය ඉටු   කරා
සුසිත් දන හට එදා සිට අද සගේ අයිතිය හිමි   කරා

ආදි ඒ "දිනු පවෙන්" බිඳුණා- උස් සගයෙ පිය හා   බැමී
එදා දෙවිඳුන් කළ ද දඬුවම් දයාවෙන් කුළුණින්   නැමී
මෙදා ඇරයුම් කරති අප හට දුබල අප වෙත වී   පෙමී
"නෙත් අයා පැමිණෙන්න හරිමග- එන තුරා මම මෙහි   වෙමී"

**ලි. හියුබට් ඇ. ප්‍රනාන්දු** (විශ්‍රාමික විද්‍යාලාධිපති)



# කිතු තුමන් අපට උගැන්වූ පව්කමාව

**එන්. එල්. ගොඩ්ෆ්‍රි කුරේ**
ජ්‍යෙෂ්ඨ නීතිඥ, ජාතික කතෝලික ලේඛක සංවිධානයේ සභාපති
නෝර්වේ රටේ හිටපු තානාපති.

ජේසු තුමන්ගේ සමීපතම ගෝලයා වන පේදුරු උන් වහන්සේ වෙතට අවුත් "ස්වාමීනි, මට විරුද්ධව පව් කරන මාගේ සහෝදරයාට මා කී වාරයක් කමා විය යුතුද? සත් වාරයක් දැයි" උන් වහන්සේගෙන් ඇසී ය. ජේසු ස්වාමීන් වහන්සේ ඔහුට කතා කොට "සත් වාරයක් නොව සත්වාර සැත්තෑවකි." වදාළ සේක. (ශු.මතෙව් 18 : 21 -22)

වෙනත් කිසිදු ආගමක නැති සමාව දීම සහ සුව කිරීම එතුමාගේ ධර්මයේ මූලික සිද්ධාන්තය විය. එතුමාගේ ජීවිත කාලය පුරාම සමාව දීම සහ සුව කිරීම ප්‍රධාන කාර්යය විය. කිතු තුමන් මනුකය ගෙන මෙලොවට බිහි වූයේ මනුෂ්‍ය වර්ගයා පව් බරින් මුදාගෙන විමුක්තිය ලබා දීමට ය. කිතු තුමන් කිසිවිටකත් මෙලොවෙහි තමන්ගේ රාජ්‍යයක් බිහි කිරීමට ක්‍රියා කළේ නැත. එතුමාගේ උප්පත්තිය ද බෙත්ලෙහෙමේ දිළිඳු ගව මඩුවකි. වරක් පරිසිවරු සීසර්ගේ කාසියක් ගෙන මෙය කාට අයිති දැයි උන්වහන්සේගෙන් ඇසූ සේක. ක්‍රිස්තුස් වහන්සේ පිළිතුරු දෙමින් "සීසර්ගේ දේ සීසර්ටත්" "දෙවියන් වහන්සේගේ දේ දෙවියන්ටත්" යනුවෙන් දෙවියන්ගේ රාජ්‍ය සදාතනික ගැලවීමේ රාජ්‍යයක් බවත් තමන් මෙලොවට පැමිණියේ සියලු මනුෂ්‍ය වර්ගයාම පවින් මුදා ගැනීමට බවත්ය.

වරක් ක්‍රිස්තුස් වහන්සේ මෙසේ දේශනා කළ සේක. "මට සවන් දෙන අයට මෙසේ කියමි. ඔබට ප්‍රේම කරන්නන්ට පමණක් ඔබ ප්‍රේම කරන්න වු නම් ප්‍රශංසාවක් වේ ද? පව්කාරයෝ පවා තමන්ට ප්‍රේම කරන්නන්ට ප්‍රේම කරති. මන්ද කෙළෙහිගුණ නොදත් අයටද, දුෂ්ටයින්ට ද, උන්වහන්සේ කාරුණිකය. ඔබේ පියාණන් වහන්සේ දයානුකම්පාව ඇති ව සිටින්නාක් මෙන් ඔබ ද දයානුකම්පාව ඇතුව සිටින්න. (ලූක් 6: 63-32)

ක්‍රිස්තුස්වහන්සේ මෙලොවට ගෙන ආවේ ආදරය මුසු ප්‍රේමයේ පණිවුඩය යි. මනුෂ්‍ය වර්ගයා මෙලොවට දායාද කලාවූ වෛරය, පලිගැනීම, දුෂ්ටත්වය, ක්‍රිස්තුස් වහන්සේ ප්‍රේමයට හැර වූ සේක. ඔබ ඔබට ප්‍රේම කරන්නා සේ අසල්වැසියාට ද ප්‍රේම කරන්න ඔහු වෙනුවෙන් යාඥා කරන්න යනුවෙන් ඉගැන්වූ සේක. ( මතෙව් 6:42-43)

මග්දලාවේ මරියාගේ ජීවිතය කවරාකාර ද යන්න අප විමසා බැලිය යුතුය. දකින්නන් එකවර සිත් ඇදගන්නා සුරූපී රූ සපුවකින් යුත් මග්දලාවේ මරියා අති සෝභමාන ය. එදා රෝම තරුණ ගැටවරයන්ගේ කෙළිබඩුවක්වූ මරියා ගණිකාවන් හා වෙසගනන් ගේ කිරුළු පැළඳ ගත් තැනැත්තිය වූවාය. එදා මෙන්ම අදත් වැරදි මගක ගමන් යන ගැහැනියගේ චරිතය ලැව්ගින්නක වේගයෙන් පැතිර යාම සිදු වන්නකි. ඇය පව්කාර ස්ත්‍රියකි.

ඇය වෛශ්‍යාවකැයි ගල්ගසා මරන්නට හැදූ විට ස්ත්‍රිය ක්‍රිස්තුස් වහන්සේ ළඟට ඇවිත් "මට සමාවන්න. ස්වාමිනි මා බේරා ගන්නැයි" මොර ගැසීය. ක්‍රිස්තුස් වහන්සේ ඇය එලවාගෙන ආ පිරිසට මෙසේ ආමන්ත්‍රණය කරමින් "නුඹලා අතරින් පාපයක් නැති තැනැත්තා පළමු කොට ඇයට ගලක් ගසන්නැයි" කීසේක. නිමේෂයකින් එම ස්ථානයේ ඉතිරි වූයේ ක්‍රිස්තුස් වහන්සේත් ඇයත් පමණි. "ස්ත්‍රිය මමද ඔබට වරද නොතබමි. මින් පසු තවත් පවු නොකරන්නැයි" වදාළ සේක. (ජුවාම් 8:3-11)

කිතු දහම අන් ආගම් වලින් වෙනස් වනුයේ "පව් සමාව" දීම තුළිනි. ජේසුතුමන් ජීවත් වූ කාලය පුරාම "පව් සමාව" සහ "මනස්ථාපනය" ගැන හුදී ජනයා දැනුවත් කරමින් "පාපොච්චාරණය" නම් වූ ප්‍රසාද නිධානයේ ස්ථාපිත කළ සේක. තම ශ්‍රාවකයින් පිට අත දිග හැර "ශුද්ධාත්මයාණන් පිළිගන්න" ඔබ යමෙකුගේ පව් කමා කරන්නේද ඒවා ක්ෂමා කරනු ලබන්නේ යැයි වදාළ සේක. එසේම ඔබ යමකුගේ පව් කමා නොකරන්නේද ඒවා කමා කරනු නොලැබේ. (ජොහාන් 20:22-23) යනුවෙන් වදාරමින් පාපොච්චාරණය නැමැති සමාවදීමේ ප්‍රසාද නිධානය උත්තරීතර බලය ගෝලයින්ට පවරා දුන් සේක. එම බලය එළෙසම අද දක්වා පූජාප්‍රසාදි තුමන්ලාට ලබා දුන්නේය.

ක්‍රිස්තුස් වහන්සේගේ ආගමනයට පෙර සිට "පව් සමාව" දුක් මනස්තාපනය පැවති බවට ස්නාවක ජුවාම් තුමා "දුක්මනස්ථාප වන්න, ස්වර්ග රාජ්‍යය අත ළඟ යැයි" දේශනා කරමින් ජොර්දාන් ගඟෙන් බෞතිස්මය ලැබූ බව ශුද්ධ ලියවිල්ලේ දක්වා ඇත. පව් කමා කිරීමේ දේව ප්‍රසාද නිධානය ජේසු ක්‍රිස්තුස් වහන්සේ දානය කලේ මනුෂ්‍ය වර්ගයාට දැක්වූ සදා අමරණීය ප්‍රේමය කරුණු කොට ගෙනය. නූතන සහ ඉතිහාසය පුරාම සුදතුම් පියාණන් සමාව දීම සහ සමාව ඉල්ලීම කර ඇත.

17 වන සියවසේ ටෙලස්කෝපය සොයාගත් ගැලීලියෝ ගැලිලී විද්‍යාඥයාගේ නව සොයාගැනීම් වලට විරුද්ධව එකල සිටි පාප්තුමා පවා කල වැරදිවලට ලෝකයා ඉදිරියේ සමාව ඉල්ලුවා පමණක් නොව ජුදා ජාතින්ගෙන් දණ නමා සමාව අයැදීම දෙවන ජුවාම් පාවුළු සුදතුම් සුවිශේෂිත ආදර්ශයකි. මේ සම්බන්ධව 1998 දී විශේෂ ප්‍රකාශයක්ද නිකුත් කරන ලදී.

සුදතුම් ප්‍රැන්සිස් පාප්තුමා වර්ෂ 2022 දී කැනඩාවට ගොස් එහි වසන ආදිවාසි ජනතාවගෙන් සමාව ගැනීම තවත් සුවිශේෂී ආදර්ශයකි. රෝම අධිරාජ්‍ය සමයේ සිදුවූ සමූහ ඝාතන තරයේ ප්‍රතික්ෂේප කරමින් කැනඩාවේ වසන ආදි වාසි ජනතාවගෙන් සමාව ඉල්ලමින් කියා සිටියේ, එදා කැනඩාවේ විසූ ආදි වාසි ජනතාවගේ සංස්කෘතියත්, ආගමත්, භාෂාවත්, ජීවිතත් නැති කිරීමට අයුතු බලය අතට ගත් හමුදා මෙහෙයුම් ක්‍රියාකර ඇති ආකරය පිළිකුල් සහගත බවත් ඒ සියළු අතීතික, අසාධාරණ ක්‍රියාකාරකම් තරයේ හෙළා දකිමින් සමස්ථ ආදිවාසි ජනතාවගෙන්ම දණ නමා සමාව අයැදීම සමස්ථ ලෝකවාසි ජනතාවගේ ගෞරවයට හේතු විය.

එසේම මුස්ලිම් ජාතික අලි අග්කා විසින් දෙවන ජුවාම් පාවුළු සුදතුම් පියාට ශාන්ත පීතර බැසිලිකාවේදී මාරන්තික වෙඩි වරුසාවක් එල්ල කළ අවස්ථාවේදී එම ඝාතකයාට සමාව දීම සදාතනික සමාවදීමේ උතුම් පණිවුඩයකි. එදා දෙවන ජුවාම් පාවුලු සුදතුම් පියාණන් ලොවට කියා සිටියේ "අප එකිනෙකාට වෛරනොකළ යුතුබවත් අද ලොවට අවශ්‍ය සමාදානය සහ සමාවබවත් ය"

ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම්වල මූලික හරය වූයේ පිටතින් නොව ඇතුලතින් පිරිසිදු හදවතක් ඇති කරගෙන සමාව පැතිරිය යුතු බවය.

ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය මරණයෙන් සියල්ල අවසානවූයේ නම් පාස්කු උදානයක් නොමැත. ජේසු සමිඳුන් මරණය පරාජය කර ජයග්‍රාහි ලීලාවෙන් උත්ථානවීම සිහිපත් කරන පාස්කු මංගලයය කිතුණුවන්ගේ උතුම්මවූත්, ශ්‍රේෂ්ඨවූත් මංගලයයයි වෙන කිසිදු ආගමක උත්ථානයක් නොමැත. උත්ථානවූ ජේසු ඇත්තේ කිතුණුවන්ට පමණි. පාස්කුව හා බැඳි සත්‍යය එනම් තමා දුකින් එතෙර වෙමින් අන්සැම දෙනාද දුකින් එතෙර කරමින් ගැලවීම ලබාදීමයි.

ජේසු තුමන්ගේ උත්ථානයෙන් වසර 2022 ඉක්ම ගියත් උත්ථානයේ මහ පෙලහැර අද දින ශුද්ධවූ දිව්‍ය යාගය තුලින් නොනවත්වා මුළු ලෝකය පුරාම ප්‍රකාශ වෙමින් පවතී, එනම් "ක්‍රිස්තුස් වහන්සේ උකුත්වූ සේක" "ක්‍රිස්තුස් වහන්සේ උත්ථානවූ සේක" "ක්‍රිස්තුස් වහන්සේ නැවත වඩින සේක" යනුවෙන් ලෝකය පුරාම දහවලත් - රාත්‍රියත් පුරාම දිව්‍ය පූජාව තුළින් සාක්ෂි දරණු ඇත.

ක්‍රිස්තුස් වහන්සේ විසින්ම අපට උගන්වා වදාල පරමණ්ඩල ආරාධනාවේ ක්‍රිස්තුස් වහන්සේගේ වචන වලින්ම කියා සිටින්නේ "අපට වරද කරන අයගේ වැරදි අප කමාකරන්නාක් මෙන් අපගේ වැරදිද කමා කළ මැනව. පාප අවස්ථාවන්ට අසුවීමට ඉඩ නොදී අයහපතින් අප මුදාගත මැනව" යනුවෙනි. ලොවට අවැසි සමාව දීමේ ආදර්ශය කිතු තුමන් විසින්ම අපට ඉගැන්වූ සේක. ■

**මෙන්න ඒ මනුෂ්‍යයා**
**මේ ඔබේ වාරයයි**

**ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි**

විධායක අධීක්ෂණය
**එම්. චතුර් පින්තු**
අධ්‍යක්ෂ
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

සංස්කරණය
**නිලූෂා ද සිල්වා**
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

පිටකවර චිත්‍රය
**අමිත පෙරේරා**

පරිගණක පිටු නිර්මාණය
**බී.බී.ඩී.එම්. ප්‍රියදර්ශන**
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව